# BOI

SRI LANKA

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# පටුන

**සභාපතිතුමාගේ පණිවුඩය** 4

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම** 5

- පරමාර්ථ හා කාර්යභාරය 5
- දැක්ම හා මෙහෙවර 6
- අධ්‍යක්ෂ මණ්ඩලය 7
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 8

**සමාලෝචනය** 9

- ප්‍රධාන සිදුවීම් සහ සුවිශේෂී අවස්ථා 9
- ශ්‍රී ලංකාවේ ආයෝජන ස්වරූපය - 2013 10
- ලෝක ආයෝජන ස්වභාවය - 2012 12
- ආයෝජන කාර්යසාධනය 17

**දෙපාර්තමේන්තු කාර්යසාධනය** 25

- අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය 25
- ආයෝජන ප්‍රවර්ධන සහ පහසුකම් සැලසීමේ අංශය 25
  - I වන ආංශික කණ්ඩායම 25
  - II වන ආංශික කණ්ඩායම 30
  - III වන ආංශික කණ්ඩායම 42
- පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන අංශය 46
- ආයෝජක සේවා අංශය 46
- අධීක්ෂණ ඒකකය 49
- නීති අංශය 57
- තාක්ෂණික සේවා අංශය 58
- අපනයන සැකසුම් කලාප /IP/EPP 59
- පාරිසරික කළමනාකරණ අංශය 60
- ඉංජිනේරු අනුමත කිරීම සහ විශේෂ ව්‍යාපෘති අංශය 62
- කාර්මික සබඳතා අංශය 64
- තොරතුර තාක්ෂණ අංශය 65
- මාධ්‍ය හා ප්‍රචාරණ අංශය 67
- පරිපාලන අංශය 68
- ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය 69
- මාවන සම්පත් කළමනාකරණ අංශය 73
- අභ්‍යන්තර විගණන අංශය 80

**මූල්‍ය සමාලෝචනය** 81

- ආදායම
- මෙහෙයුම්, පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම්
- රජයේ බදු සහ මූල්‍ය වියදම්
- ප්‍රාග්ධන වියදම්
- 2013 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
- 2013 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය

- 2013 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
- සාමාන්‍ය කොටස් ප්‍රමාණ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
- 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**විගණන වාර්තාව**

- විගණකාධිපතිවරයාගේ වාර්තාව 105

**ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය** 125

# සභාපතිතුමාගේ පණිවුඩය



විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය අඛන්ඩව වර්ධනය කර ගනිමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් ස්තාපනය කරන ලද ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබුණු අතිශයින්ම සාර්ථක වූ වසරක අවසානය සනිටුහන් කිරීමට අපට හැකි වූ බව සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යසාධනය ආවර්ජනය කිරීමේදී තහවුරු වේ. ආයෝජන සම්බන්ධයෙන් වැදගත් සන්ධිස්ථාන වෙත ළඟා වෙමින් ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් ඉතා ඉහළ පෙළේ ආයෝජකයන් මෙන්ම ප්‍රධාන පෙළේ ආයෝජන ව්‍යාපෘති ද අප රට වෙත ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකියාව ලැබුණි.

රාජ්‍ය නායකයන්, ප්‍රධාන පෙළේ ව්‍යාපාරික දූත පිරිස් මෙන්ම ඉහළ තරාතිරමේ ආයෝජකයන් විශාල සංඛ්‍යාවක් හඳුනා ගැනීමට මෙම වසර තුළ ශ්‍රී ලාංකිකයන්ට හැකි විය. ජපාන බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයෝජකයන් සමඟ මෙන්ම කලාපය තුළ ස්ථාපනය කර ඇති පුළුල් ජාලය මගින් ශ්‍රී ලංකාවට ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට සහාය ලබා දිය හැකි සීශෙල්ස් ආයෝජන මණ්ඩලය සමඟ ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහයෝගීතාවයෙන් කටයුතු කරයි.

ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදුවූ වර්ධනයත් සමඟ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,391 ක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට 2013 වසරේදී ශ්‍රී ලංකාවට හැකි විය. මෙම ස්ථාවර ආර්ථික වර්ධනයත් සමඟ ශ්‍රී ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම අනාගත සංවර්ධනය පිළිබඳව සුබවාදී බලාපොරොත්තු තබා ගැනීමේ හැකියාව ලැබී තිබේ. නව අපනයන සැකසුම් කලාප ස්ථාපනය කිරීම සඳහා නව ප්‍රදේශ ගවේෂණය කිරීමේ හා ක්‍රමෝපායික ව වැදගත් ස්ථාන හඳුනා ගැනීමේ කටයුතුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මේ වන විට නිරතව සිටියි. එමෙන්ම, ඉහළ විභවයක් පවතින බව සනාථ වී ඇති තොරතුරු තාක්ෂණය, පර්යේෂණ හා සංවර්ධනය ආදී ක්ෂේත්‍ර පිළිබඳව ද වර්තමානයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වැඩි අවධානය යොමුවී තිබේ.

2013 වසරේ නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේදී පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව මගින් විශ්වය පුරා විසිරී සිටින ලෝක නායකයන් හා ආයෝජකයන් පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය සඳහා ආකර්ෂණය කර ගැනීමට හැකි වූ අතර එම ව්‍යාපාරික සංසදයේදී ආයෝජනය සම්බන්ධයෙන් බලාපොරොත්තු වූ ප්‍රමාණයද ඉක්මවා ඉහළම ප්‍රතිඵල ලබා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. මෙම සමුළුව වෙනුවෙන් ප්‍රශස්ත කාර්යභාරයක් ඉටුකිරීමට මෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදයේ ප්‍රධාන සංවිධායක ධූරයේ වගකීම ඉටුකිරීමට ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකියාව ලැබුණි. එමෙන්ම සීශෙල්ස් ආයෝජන මණ්ඩලය සමඟ ශ්‍රී ලංකා ආයෝන මණ්ඩලය විසින් මෑතක දී අත්සන් කරනු ලැබූ අවබෝධතා ගිවිසුම ද මෙම ව්‍යාපාරික සංසදය ශ්‍රී ලංකාවේ පැවැත්වීමේ ප්‍රතිඵලයක් බව සඳහන් කළ යුතුය. පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය අතරතුර ආයෝජකයන් වෙත පිරිනමන ලද ඇතැම් ව්‍යාපෘති පිළිබඳව වැඩිදුර තොරතුරු විමසමින් එම ව්‍යාපෘති පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට බොහෝ ආයෝජකයෝ මේ මොහොත වන විට ද උත්සාහ දරති. ශ්‍රී ලංකාවට විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කිරීම සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රතිරූපය ද පොදුරාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය මගින් ඉහළ තලයකට ඔසවා තබන ලද බව ද අප අවිවාදයෙන් පිළිගත යුතුය.

වෙනත් ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා මෙන්ම ඊශ්‍රායලය හා ජපානය වැනි රටවල ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය. ශ්‍රී ලංකාව ආයෝජකයන් වෙත පිරිනමනු ලබන ආයෝජනය අවස්ථා පිළිබඳව හා ප්‍රතිඵල ලබා දීම කෙරෙහි ස්ථිර ලෙසම යොමුවුණු ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳවද දැනුවත් වීමෙන් අනතුරුව, ප්‍රමුඛ පෙළේ ආයෝජකයන් විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව වෙත පැමිණෙමින් සිටින බව නිරීක්ෂණය කළ හැකිය. ශ්‍රී ලංකාව යනු ක්‍රමෝපායිකව වැදගත් ස්ථාන හා ප්‍රයෝජනයට නොගත් සම්පත්වලින් අනූන රටක් පමණක් නොව ව්‍යාපෘතියක් පහසුවෙන් ස්ථාපනය කිරීම තහවුරු කරමින් සම්පාදනය කරන ලද රාජ්‍ය ප්‍රතිපත්තිවලින් ද සමන්විත වන දේශයක් බව මේ වනවිට විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සමත්ව ඇති මියන්මාරය වැනි රටවල් සමඟ අප දිවයින සැසඳීමේදී පැහැදිලි වන කරුණකි.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අමාත්‍යවරුන්ගේ මග පෙන්වම යටතේ අප කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නිසියාකාරව මෙහෙයවීමට මට හැකි විය. සංවර්ධනය නැමැති මාවතේ නොනැවතී ඉදිරියටම පිය නගන ශ්‍රී ලංකාව විශ්වයේ ඉහළම තලයකට රැගෙන යෑම සඳහා අනුගමනය කළ හැකි නිශ්චිත ඉදිරි මාවතක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හඳුන්වා දීම මගේ ඒකායන අපේක්ෂාවයි.

**ආචාර්ය ලක්ෂ්මන් ජයවීර**
**සභාපති**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම

ශ්‍රී ලංකාවේ නිශ්චිත ප්‍රදේශවල කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ, සමායෝජනය කිරීමේ හා ඒ සඳහා පහසුකම් සැපයීමේ රජයේ ප්‍රමුඛතම නියෝජිතායතනය ලෙස කටයුතු කිරීම සඳහා 1978 දී මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො. ) ලෙස හඳුන්වනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සංස්ථාපනය කරනු ලැබීය. බදු සහන හා වෙනත් පහසුකම් සපයනු ලබන අපනයන ප්‍රවර්ධන කලාප ලෙස හඳුන්වනු ලබන විශේෂිත ප්‍රදේශ වෙන් කිරීම මෙම ප්‍රදේශ සංවර්ධනය කිරීම පිළිබඳ මුල්ම ආකෘතිය විය. මෙම කලාප කටුනායක හා බියගම ප්‍රදේශවල මුලින්ම ස්ථාපනය කරනු ලැබූ අතර පසුව තවත් කලාප ක්‍රමිකව සංවර්ධනය කරනු ලැබීය. වර්තමානයේදී, සමස්තයක් වශයෙන් කලාප 14ක් ස්ථාපනය කර තිබේ.

මහ කොළඹ ආර්ථික කොමිසමේ විෂය පථය පුළුල් කර සමස්ත දිවයිනම ආවරණය කිරීමේ අරමුණින් 1992 දී, පාර්ලිමේන්තුවේ දී පනතක් සම්මත කර ගත් අතර එම පනත මගින් මහ කොළඹ ආර්ථික කොමිසම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය බවට පත් විය. එම පනත සම්මත කර ගැනීමට පෙර කටුනායක, බියගම හා කොග්ගල ප්‍රදේශවල ස්ථාපනය කර තිබූ අපනයන සැකසුම් කලාප සඳහා වෙන් කරනු ලැබූ විශේෂිත ප්‍රදේශවලට පමණක් එහි අධිකාරී බලය සීමා වී තිබුණි.

කාර්මික අපනය ප්‍රදේශ වෙත ලැබෙන විදේශ හා දේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම, සමායෝජනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු නියෝජිතායතනයක් ලෙස කටයුතු කරනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, සේවා අංශය මෙන්ම යටිතල පහසුකම් අංශය වෙත ද ලැබෙන ආයෝජන ප්‍රවර්ධනය කිරීම, සමායෝජනය කිරීම සහ පහසුකම් සැලසීම යන එහි වත්මන් කාර්යභාරය ඉටු කිරීමට ද ක්‍රමයෙන් අනුගත විය.

## අරමුණු

ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා අභිවර්ධනය කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම, දේශීය ආයෝජන හා විදේශීය සෘජු ආයෝජන දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම, විදේශ විනිමය ඉපැයීමේ ප්‍රභව විවිධාංගීකරණය කිරීම හා අපනයන ඉපයීම් වැඩි දියුණු කිරීම, නව්‍යතා ප්‍රවර්ධනය, නව තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම හා නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මෙන්ම රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරීත්වය තුළින් දිවයින පුරා ආයෝජන ප්‍රවර්ධන කලාප (IPZS) ස්ථාපනය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධානතම අරමුණු වේ.

## කාර්යභාරය

රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින් ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රමුඛතම අංශ සඳහා සැලසුම් කරන ලද ආයෝජන ඉලක්ක සපුරා ගැනීම මෙන්ම විදේශීය සෘජු ආයෝජන මට්ටම ක්‍රමිකව වැඩි දියුණු කිරීම මගින් ජාතික සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීම අපගේ කාර්යභාරය වේ.

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදන, යටිතල පහසුකම්, සංචාරක ව්‍යාපාරය, කෘෂිකර්මාන්තය, තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සේවා හා වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති ආරම්භ කිරීමට අදහස් කරන ආයෝජකයන් සමග සම්බන්ධතා පවත්වන පළමු ආයතනය ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. අවශ්‍ය වන තොරතුරු හා මගපෙන්වීම් ව්‍යාපෘති අයදුම්පත් භාරදීමේ අවස්ථාවට පෙර ලබා දෙනු ලබන අතර වෙනත් නියෝජිත ආයතනවලින් අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වන අවස්ථාවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අවශ්‍ය සමායෝජන කටයුතු ඉටු කරයි.

දිරි ගැන්වීමේ දීමනා සඳහා සහන අනුමත කර එම දීමනා ලබා දීම, අමුද්‍රව්‍ය හා සංරචක මත පැනවිය හැකි බදු නිදහස් කිරීම් අනුමත කර බදු සහන ලබාදීම හා මෙම ව්‍යාපෘතිවල තනතුරු දරන විදේශීය පුද්ගලයන් සඳහා වීසා නිකුත් කිරීමට ආගමන බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් එක් එක් අංශවල ආයෝජනය කිරීම සඳහා ලැබෙන අයදුම්පත් තක්සේරු කරනු ලබයි.

ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය තුළ ද, ආනයන/අපනයන නිෂ්කාෂණ ලබා ගැනීම, ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය සඳහා රේගු නිෂ්කාෂණ ලබා ගැනීම සහ නිමි භාණ්ඩ අපනයනය කරීම සඳහා පහසුකම් සැලසීම හා ඒ වෙනුවෙන් මැදිහත් වීම තුළින් ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු සාර්ථක ලෙස සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ආයෝජකයන්ට අවශ්‍ය සහාය ලබා දෙයි.

සමස්ත ආයෝජන සහ / හෝ අපනයන ඉපයීම් කඩිනමින්වැඩි දියුණු කිරීමේ අරමුණින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස සියළු යටිතල පහසුකම් සහිතව ආයෝජන ප්‍රවර්ධන කලාප සංවර්ධනය කර ආයෝජකයන්ට සුදුසු පරිශ්‍ර ලබා දීම සඳහා අවශ්‍ය ආයෝජන කටයුතු සිදු කරීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කර්තව්‍යයකි.

# දැක්ම

"ආසියාවේ වඩාත්ම අකාර්ෂණීය තිරසාර ආයෝජන ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත් කිරීම."

# මෙහෙවර

"ජාතික ආර්ථික සංවර්ධනය සඳහා අර්ථවත් දායකත්වයක් ලබා දෙ ස්වාභාවික පරිසරය සමඟ පවතින එකඟතාව ආරක්ෂා කරන අතරතුර ආයෝජන ප්‍රවර්ධන කටයුතු ශක්තිමත් ලෙස ඉටු කිරීම හා ආයෝජකයන් සඳහා ඉහළම මට්ටමින් පහසුකම් සම්පාදනය කිරීම තුළින් සම්පත් හා සහජ කුසලතා ප්‍රශස්ත මට්ටමින් භාවිතයට ගැනීමේ අරමුණින් තිරසාර අයෝජන ආකර්ෂණය කිරීම හා සුරක්ෂිත කිරීම."

BOI
SRI LANKA

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2013



ආචාර්ය ලක්ෂ්මන් ජයවීර - සභාපති



චන්න පලන්සූරිය මහතා - සාමාජික



සංජීව වික්‍රමනායක මහතා - සාමාජික



අනුර ජයසිංහ මහතා - සාමාජික

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

| නම | තනතුර |
|---|---|
| අචාර්ය ලක්ෂ්මන් ජයවීර මහතා | සභාපති |
| ඊ. ඒ. ජේ. එදිරිසිංහ මහතා | අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) |

**විධායක අධ්‍යක්ෂවරු**

| | |
|---|---|
| ආචාර්ය අයි. එන්. සමරප්පුලි | විධායක අධ්‍යක්ෂ (පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන) |
| එස්. ඩී. ද සිල්වා මහතා | විධායක අධ්‍යක්ෂ (යටිතල පහසුකම්, උපයෝගිතා හා අධ්‍යාපන අංශය) |
| ඩී. පී. ආරියසිංහ මහතා | විධායක අධ්‍යක්ෂ (පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය සඳහා ස්ථාපනය කරන ලද ඒකකය) |
| එස්. බී. එෆ් ද සිල්වා මහතා | විධායක අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා) |
| පී. කේ. වල්ගම මිය | විධායක අධ්‍යක්ෂ (නීති) |
| පී. ජේ. පනාපිටිය මහතා | විධායක අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමැතීන් හා විශේෂ ව්‍යාපෘති) |
| යූ. සිරිගම්පොල මහතා | විධායක අධ්‍යක්ෂ (කලාප) |
| ආර්. එම්. වීරකෝන් මිය | විධායක අධ්‍යක්ෂ (ඇඟලුම්, ප්‍රාදේශීය වැඩසටහන් හා අනෙකුත් නිෂ්පාදන අංශ) |
| එන්. වීරසේකර මිය | විධායක අධ්‍යක්ෂ (අයෝජන සේවා) |

**අධ්‍යක්ෂවරු**

| | |
|---|---|
| කේ. පී. වී. ඩී. ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ (මහා පරිමාණ ව්‍යාපෘති) |
| ඩී. එස්. සමරසිංහ මහතා | අධ්‍යක්ෂ (මාධ්‍ය) |
| සී. පී. මලල්ගොඩ මිය | අධ්‍යක්ෂ (පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශක) |
| එච්. එම්. ජයසුන්දර මහතා | අධ්‍යක්ෂ (මධ්‍යම ප්‍රාදේශීය කාර්යාලය) |
| යූ. ජේ. වීරසිංහ මහතා | අධ්‍යක්ෂ (වයඹ ප්‍රාදේශීය කාර්යාලය) |
| එම්. ඒ. එස්. පෙරේරා මිය | අධ්‍යක්ෂ (පරිසර) |
| එම්. කේ. ගරුසිංහ මහතා | අධ්‍යක්ෂ (නව කලාප) |
| එන්. ද. සිල්වා මෙනවිය | අධ්‍යක්ෂ (යටිතල පහසුකම්, උපයෝගිතා හා අධ්‍යාපන අංශය) |
| ජේ. පී. සී. ජයලත් මහතා | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) |
| එස්. පී. ද. එස්. මුතුකුමාරණ මෙනවිය | අධ්‍යක්ෂ (මූල්‍ය) |
| ඒ. කේ. ජයසිංහ මහතා | අධ්‍යක්ෂ (සීතාවක අපනයන සැකසුම් කලාපය) |
| එම්. එස්. සී. සමරකොන් මිය | අධ්‍යක්ෂ (නීති - රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරීත්ව හා අධීක්ෂණ ඒකකය) |
| ඩබ්. ඒ. එෆ්. ජයසිරි මහතා | අධ්‍යක්ෂ (කාර්මික සබඳතා) |
| එම්. කේ. ඩී. ලෝරන්ස් මහතා | අධ්‍යක්ෂ (බියගම අපනයන සැකසුම් කලාපය) |
| බ්‍රිගේඩියර් ඩී. ඒ. අමුණුගම මහතා | අධ්‍යක්ෂ (ආරක්ෂක) |
| ඒ. කේ. ඒ. මහින්ද මහතා | අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා) |
| ජේ. ගුණසේකර මහතා | අධ්‍යක්ෂ (කොග්ගල අපනයන සැකසුම් කලාපය) |
| ඒ. ආර්. කරුණාරත්න මහතා | අධ්‍යක්ෂ (මානව සම්පත්) |
| ආර්. එම්. යූ. සෙනරත් මහතා | අධ්‍යක්ෂ (තාක්ෂණික පරිපාලනය) |
| එම්. රාමනායක මහතා | අධ්‍යක්ෂ (ආයෝජන සේවා කලාප) |
| එන්. එන්. කුමාරතුංග මහතා | අධ්‍යක්ෂ (ඇඟළුම්, ප්‍රාදේශීය වැඩසටහන් හා අනෙකුත් නිෂ්පාදන අංශ) |
| ඩබ්.යූ.කේ.එම්.ඒ. විජයකුලතිලක මහතා | අධ්‍යක්ෂ (ඇඟළුම්, ප්‍රාදේශීය වැඩසටහන් හා අනෙකුත් නිෂ්පාදන අංශ) |

# සමාලෝචනය

## ප්‍රධාන අවස්ථා හා සුවිශේෂී සිදුවීම්

ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් ලබා ගත් ඉහළම විදේශ ඍජු ආයෝජන ප්‍රමාණය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,391.40 ක ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත් විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉහළම ආනයන මට්ටම රු. මිලියන 622,453.24 ක් වූ අතර ඉහළම අපනයන මට්ටම රු. මිලියන 867,653.82 ක් විය.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් පහසුකම් සලසනු ලැබූ අන්තර්ජාතික තත්ත්වයේ සංචාරක ව්‍යාපෘති හතරක් තිබේ.

- ශන්ග්‍රි-ලා හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම- කොළඹ
- ශන්ග්‍රි-ලා හොටෙල්ස් ඉන්වෙස්ට්මන්ට් ලංකා (පුද්.) සමාගම- හම්බන්තොට
- වෙල්කම් හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම - කොළඹ
- හයට් රීජන්සීස් සමඟ සිනෝලංකා හොටෙල් ඇන්ඩ් ස්පා - කොළඹ



# ශ්‍රී ලංකාවේ ආයෝජන ස්වරූපය - 2013

**සුවිශේෂ අවස්ථා**

- මෙතෙක් වර්තා වූ ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,391 ක් ලබා ගැනීමට හැකි විය.
- දිවයිනේ සාමාන්‍ය භූ දර්ශනය ද වෙනස් කරමින් යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් ඉතා ඉහළ ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය.
- දේශීය ආයෝජන ප්‍රවාහය ඇ. ඩො. මිලියන 512 ක් දක්වා වැඩිවිය. (විදේශ සෘජු ආයෝජනවලින් 37% ක් පමණ)

**විදේශ සෘජු ආයෝජන** (FDI)

විදේශ අයෝජන හා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය අතර අතිශය ප්‍රබල සම්බන්ධතාවක් පවතී. යම් රටක ආර්ථික සංවර්ධනයේ ඉලක්කගත අනුපාතික අත්පත් කර ගැනීම සඳහා එම රට තුළට විදේශ සෘජු ආයෝජන විශාල වශයෙන් ගලා ඒම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සාධනීය ප්‍රයත්නවලින් අනතුරුව, මෙතෙක් ලබාගැනීමට හැකි වූ ඉහළම විදේශ සෘජු අයෝජන ප්‍රමාණය වූ ඇමරිකන් ඩොලර් මිලියන 1,391 ක වාර්තාගත විදේශීය සෘජු ආයෝජන (FDI) අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයට හැකිවිය.

**සමාලෝචිත වර්ෂය පිළිබඳ කෙටි සටහනක්**

නිෂ්පාදන අංශයෙන් ඇ. ඩො. මිලියන 360ක් ද, සේවා අංශයෙන් ඇ. ඩො. මිලියන 236 ක් ද, යටිතල පහසුකම් අංශයෙන් ඇ. ඩො. මිලියන 787 ක් ද, කෘෂිකාර්මික අංශයෙන් ඇ. ඩො. මිලියන 8ක්ද ආදී වශයෙන් 2013 වසරේදී විවිධ අංශවලින් ලබා ගත් මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇ. ඩො. මිලියන 1,391 ක් විය.

ආර්ථික වටිනාකම් දාමය පුරා පවතින පරතර පියවීම මගින් දැනට පවතින කර්මාන්ත සඳහා ශ්‍රී ලංකාව තුළ පරිසර හිතකාමී ශක්තිමත් ව්‍යාපාරික වාතාවරණයක් ස්ථාපනය කිරීමේ ප්‍රයත්නය ද ඇතුළු ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වූ රජයේ ක්‍රමෝපායන් තුළින් මෙම විශිෂ්ට ජයග්‍රහණය ලබා ගැනීමට හැකි විය.

2013 වසරේදී ඇ. ඩො. මිලියන 512 ක දේශීය ආයෝජන රට තුළ සිදුවූ අතර මෙය ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින හැකියාව පිළිබඳව දේශීය ආයෝජකයන් තබා ඇති විශ්වාසය තහවුරු කරන ස්ථිරසාර සලකුණක් විය. මහින්ද චින්තන ඉදිරි දැක්මේ දක්වා ඇති පරිදි දේශීය ආයෝජන සක්‍රීය ලෙස ප්‍රවර්ධනය කිරීමේ රජයේ අඛණ්ඩ ප්‍රයත්නයට ද මෙය අනුකූල වේ.

මේ වන විට ශ්‍රී ලංකාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ගෝලීය හා කලාපීය මධ්‍යස්ථානයක් ලෙස ප්‍රසිද්ධියක් ලබා ඇති අතර ආයෝජන අවස්ථා වැඩි වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම තුළින් දැනුම තීව්‍ර හා නවෝත්පාදන පදනම් කර ගත් ඉහළ මට්ටමේ අගය එකතු කළ කර්මාන්ත වෙත රට යොමු කිරීමේ කාර්ය භාරය කඩිනමින් ඉටු කළ හැකි වනු ඇත.

**නිෂ්පාදන අංශයෙහි ආයෝජනය කිරීම**

අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයේ වුවද, නිෂ්පාදන අංශය සඳහා සැලකිය යුතු මට්ටමින් ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාවට මේ දක්වා හැකියාව ලැබුණි.

2012 වසරේ රුපියල් මිලියන 95,882 ක් වූ ආයෝජන ප්‍රමාණය හා සැසඳීමේදී, 2013 වසරේදී, නිෂ්පාදන ව්‍යාපෘති (පවතින ව්‍යාපෘති පුළුල් කිරීම් ද ඇතුළත්ව) 65 ක් අනුමත වූ අතර එම ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 155,186 ක ආයෝජන ප්‍රමාණයක් ලබා ගත හැකි විය. 2013 වසරේ දී නිෂ්පාදන අංශයට ලැබුණු මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 360 ක් විය (මුළු විදේශ සෘජු ආයෝජනවලින් 26%ක්).

මෙරට නිෂ්පාදන අංශය පරිවර්තන අවධියක් හා ප්‍රතිව්‍යුහගත කිරීමේ අවධියක් පසු කරමින් සිටියි. අඩු අගයක් එකතු කළ ක්‍රියාකාරකම්වල ආර්ථික වැදගත්කම අඩුවෙමින් පවතින අතර කර්මාන්තවල ආයෝජකයෝ අඩු අගයක් එකතු කළ අංශවල ආයෝජනය කිරීම අඩු කිරීමට ද, වර්ධනය සඳහා නව අවස්ථා සලසා දෙන වැඩි අගයක් එකතු කළ ක්‍රියාකාරකම්වල පුළුල් ලෙස ආයෝජනය කිරීමට ද අපේක්ෂා කරති. මෙම නව ව්‍යාපාරික ක්‍රමෝපාය තුළින් ඉහළ නිපුණතා සහිත රැකියා සඳහා වෙළඳපොළක් සහ ඉහළ ආදායම් සහිත ආර්ථිකයක් බිහි කිරීමට ද අවස්ථාව සැලසේ.

විශේෂයෙන්ම පෙරටු පිරිවැය අඩුකිරීමේ අරමුණින් අනුමත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි, ආයෝජකයන් වෙත අඛණ්ඩව පහසුකම් සැලසීම සඳහා විවිධ පියවර ගැනීමට හා ඒවායේ ආරම්භක කටයුතු අඛණ්ඩව ඉටුකිරීමට ද රජය කටයුතු කරයි. පවත්නා කාර්මික උද්‍යානවල මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කටයුතුවල දී මෙන්ම සූරියවැව ව්‍යාපෘතිය ඇතුළු නව කලාප සංවර්ධනය කිරීමේ කටයුතුවල දී ද, රජයට සහාය ලබා දීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ව්‍යාපෘති කළමනාකරණය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ කටයුතුවල නිරතව සිටියි. අනුමත කරන ලද ව්‍යාපෘති ඉහළ අනුපාතයකින් ක්‍රියාත්මක කිරීම සඳහා ද මෙමගින් දායකත්වය ලැබී තිබේ.

**සේවා / යටිතල පහසුකම් අංශයේ ආයෝජනය කිරීම**

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඇති කිරීමේ අරමුණින් සේවා / යටිතල පහසුකම් අංශය ප්‍රවර්ධනය කිරීම රජයේ ප්‍රයත්නය විය. සේවා / යටිතල පහසුකම් අංශයෙන් මෙම දශකය තුළ ආර්ථිකයට ලැබෙන දායකත්වය තවදුරටත් පුළුල් කිරීමට එමගින් අපේක්ෂා කෙරේ. 2013 වර්ෂයේ දී, සේවා / යටිතල පහසුකම් අංශය රුපියල් මිලියන 421,869 ක අනුමත (පුළුල් කිරීම් ද ඇතුළත්ව ව්‍යාපෘති 105 ක් මගින්) ආයෝජන ප්‍රමාණයක් ඉපයීම තුළින් රටේ ආර්ථික වර්ධනයට එහි දායකත්වය සැපයීය. 2013 වසරේදී සේවා /යටිතල පහසුකම් අංශයට ලැබුණු මුළු විදේශීය සෘජු ආයෝජන ප්‍රමානය ඇමෙරිකන් ඩොලර් මිලියන 1,023 ක් විය (මුළු විදේශ සෘජු ආයෝජන වලින් 73.5%ක්)

හෝටල් හා සංචාරක කර්මාන්ත ව්‍යාපෘති, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති, සමෝධානික නිවාඩු නිකේතන, සහාය සේවා, ප්‍රවාහනය, බලශක්ති, විදුලි සංදේශ, සෞඛ්‍ය සේවා හා අධ්‍යාපනික සේවා ආදී පුළුල් පරාසයක විහිදෙන සේවාවලින් මෙම අංශය සමන්විත වේ.

මෙම අංශයේ තරඟකාරීත්වය වැඩි දියුණු කරන රජයේ ආධාරක ප්‍රතිපත්ති පිළිබඳව හා එම අංශය සඳහා පහසුකම් සැලසීම පිළිබඳව ද ලැබෙන ධනාත්මක ප්‍රතිචාර සේවා / යටිතල පහසුකම් අංශයේ ආයෝජන ප්‍රමාණය ඉහළ යාම මගින් සනාථ කෙරේ.

**කෘෂිකර්ම අංශයෙහි ආයෝජනය කිරීම**

2013 වර්ෂයේදී, ව්‍යාපෘති 02ක් සඳහා රුපියල් මිලියන 776 ක් වටිනා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට කෘෂිකර්ම අංශය සමත් විය. කෘෂිකර්ම අංශය සඳහා ලැබුණු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 8ක් විය (මුළු විදේශීය සෘජු ආයෝජන වලින් 0.6%ක්). පළතුරු සහ එළවළු වගාව හා ත්‍රිකුණාමලයේ මත්ස්‍ය ව්‍යාපෘතිය ද විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගත් එම ව්‍යාපෘත වේ.

ගෝලීය හා කලාපීය සාර්ව ආර්ථික හා සමාජයීය සංවර්ධනය පිළිබඳව සලකා බලා, දේශීය ආර්ථිකය තුළ පරිසර හිතකාමී ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම තුළින් පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීමට රජය අදහස් කර තිබේ. මෙරට තුළ ආයෝජනය කිරීමේ විභවය සහිත තනි පුද්ගල ආයෝජකයින් සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධනය සැපයීම තුළින් මෙම ආර්ථික වටිනාකම් දාමය පුරා පවතින පරතර පියවීමේ අරමුණින් සුවිශේෂී විදේශ වෙළඳපොළ සඳහා නිෂ්පාදන, තාක්ෂණික ක්‍රම හා සේවා සැපයීම ඉලක්ක කරමින් තරඟකාරීත්වයේ නව ප්‍රතිලාභ ශ්‍රී ලංකාව වෙත ලබාගත හැකි ආකාර පිළිබඳව සොයා බැලීම තුළින් ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතිශය වැදගත් කාර්ය භාර යක් ඉටු කරයි.

# ලෝක ආයෝජන ස්වරූපය - 2012

## විදේශ සෘජු ආයෝජන ගලා ඒම හා බැහැරට ගලා යෑම

### විදේශ සෘජු ආයෝජන ගලා ඒම

2012 වසරේ ලෝකයේ විදේශ සෘජු ආයෝජන ගලා ඒම ඇ. ඩො. බිලියන 1,350 ක් වූ අතර එය 2011 වසරේ සංශෝධිත ගෝලීය විදේශ සෘජු අයෝජන ප්‍රමාණය වූ ඇ. ඩො. බිලියන 1,651 ට සාපේක්ෂව 18% ක පහත වැටීමකි. මෙම කාල පරිච්ඡේදය තුළ ගෝලීය මට්ටමින් ධනාත්මක වර්ධනයක් වාර්තා කළ දළ දේශීය නිෂ්පාදනය, අන්තර්ජාතික වෙළඳාම හා සේවා නියුක්තිය ආදී අනෙකුත් ප්‍රධාන ආර්ථික දර්ශකවලට පටහැනි වන ලෙස මෙම පහත වැටීම සිදුවී තිබුණි. ආර්ථිකවල පැවති දුර්වලතා, ප්‍රධාන රටවල් ගණනාවක ආර්ථික ප්‍රතිපත්තිවල අස්ථිරතාව හේතුකොටගෙන වඩාත් අරපිරිමැස්මෙන් කටයුතු කිරීමට ආයෝජකයන්ට සිදු වී තිබුණි.

ලෝක විදේශ සෘජු ආයෝජන ගලාඒම් වලින් 52% ක් සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකවලින් ලබාගෙන ඇති අතර මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 58% ක් ආසියාව මගින් ලබා ගනු ලැබීය.

2011 වසරේ ඇ. ඩො. බිලියන 1,651 ක් වූ ගෝලීය සෘජු ආයෝජන ගලා ඒම 2012 වසරේදී 18% ක අඩුවීමක් සටහන් කරමින් ඇ.ඩො. බිලියන 1,350 ක් දක්වා පහත වැටී තිබිණි



මූලාශ්‍ර : වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂමේ, ලෝක ආයෝජන වාර්තාව - 2011

2013 වසරේ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය, 2012 වසරේ පැවති විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය හා එහි ඉහළ පරාසය වූ ඇ. ඩො. බිලියන 1450 සීමාව තුළ රැඳී පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### කලාපීය මට්ටමින් විදේශ සෘජු ආයෝජන ගලා ඒම

2012 වසරේ දී, ඉතිහාසයේ ප්‍රථම වරට සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධිත රටවලට වඩා වැඩි විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් විය. සංවර්ධනය වෙමින් පැවති රටවල් වෙත ලැබුණු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇ. ඩො. බිලියන 702.8 ක් වූ අතර එය 2011 වසරේ වාර්තා ගත වූ ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූ ඇ. ඩො. බිලියන 735.2 හා සැසඳීමේදී 4% ක පහත වැටීමක් විය.

2012 වසරේ සංවර්ධිත රටවල් මගින් ඇ. ඩො. බිලියන 560 ක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් පමණක් ලබා ගත් අතර එය 2011 වසරේදී වාර්තා ගත වූ ඇ. ඩො. බිලියන 820 ට සාපේක්ෂව 32% ක ඉහළ අනුපාතයකින් අඩුවී තිබුණි.

2012 වසරේ දී, පරිවර්තනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් ඇ. ඩො. බිලියන 87.3 ක විදේශ සෘජු අයෝජන ප්‍රමාණයක් පමණක් ලබා ගැනීමට සමත් වූ අතර එය 2011 වසරේ වාර්තා ගත වූ ඇ. ඩො. බිලියන 96.2 ට සාපේක්ෂව 9% ක පහළ බැසීමක් විය.

ඉතිහාසයේ ප්‍රථම වරට සංවර්ධිත ආර්ථිකවලට සාපේක්ෂව සංවර්ධනය වෙමින් පවතින ආර්ථික වැඩි විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් විය.

**කලාපීය වශයෙන් වි. සෘ. ආ. ඇතුළට ගැලීම් (2007-2012)**




මූලාශ්‍රය : උන්ක්ටාඩ්, ලෝක ආයෝජන වාර්තාව - 2013

සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් ලෝක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 52% ක් ලබා ගැනීමට සමත් වූ අතර සංවර්ධිත ආර්ථික සහිත රටවල් ලෝක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 42.5% ක් ද, පරිවර්තනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් ලෝක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 6.5% ක් ද ලබා ගැනීමට සමත් විය.

සංවර්ධනය වෙමින් පවතින කලාපයන් අතර වාර්තා වූ දෙවන ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූ ඇ. ඩො. බිලියන 406 ක් ලබා ගනිමින් සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් ලබා ගත් මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 58% ක් ලබා ගැනීමට ආසියාව සමත් විය. බොහෝ උප කලාපවල ආර්ථිකයන්වල මෙන්ම චීනය, හොංකොං (චීනය), ඉන්දියාව, කොරියානු ජනරජය, සෞදි අරාබිය හා තුර්කිය වැනි ප්‍රධාන පෙළේ රටවල ආර්ථිකයන්වල සිදු වූ පහත වැටීම්වල ප්‍රතිඵලයක් ලෙස, 2012 වසරේදී වාර්තා ගත වූ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය, 2011 වසරේ වාර්තා වූ ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූ ඇ. ඩො. බිලියන 436 වඩා 7%කින් අඩු විය.

සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් ලබාගත් මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 35% ක් වූ ඇ. ඩො. බිලියන 243 ක් ලබා ගැනීමට ලතින් ඇමෙරිකානු හා කැරිබියානු කලාපය සමත් වූ අතර එය 2011 වසරේදී එම කලාපය ලබාගත් විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූ ඇ. ඩො. බිලියන 249 ට සාපේක්ෂව 2% ක අඩුවීමක් විය.

සංවර්ධනය වෙමින් පවතින රටවල් ලබාගත් විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 7% ක් වූ ඇ. ඩො. බිලියන 50 ක ප්‍රමාණයක් ලබා ගනිමින්, 2011 වසරේදී ලබාගත් ඇ. ඩො. බිලියන 47.5ක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයට සාපේක්ෂව 5% ක වර්ධනයක් වාර්තා කළ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර වූ එකම උප කලාපය බවට පත්වීමට අප්‍රිකානු කලාපය සමත් විය.

යුරෝපය හා ඇමෙරිකා එක්සත් ජනපදය ලබා ගත් විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය පහළ වැටීම හේතුවෙන් සංවර්ධිත රටවල විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය තියුණු ලෙස පහත වැටුණි.

2012 වසරේදී, යුරෝපයට හා ඇමරිකා එක්සත් ජනපදයට ලැබුණු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයේ තීව්‍ර අඩුවීම හේතුවෙන් සංවර්ධිත රටවලට ලැබුණු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය තියුණු ලෙස අඩුවිය. යුරෝපයට අයත් බෙල්ජියම හා ජර්මනිය යන රටවල විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයේ තීව්‍ර අඩුවීමක් වාර්තා වී තිබුණි. මෙම රටවල් දෙක අතරින් බෙල්ජියමේ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇ. ඩො. බිලියන 100කට වඩා වැඩි වාර්තාගත ප්‍රමාණයකින් අඩුවිය. රට තුළ ආයෝජන විශාල වශයෙන් අඩුවීම හේතුවෙන් ජර්මනියේ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ද ඇ. ඩො. බිලියන 42කින් පහත වැටී තිබුණි.

දේශ සීමා අතර සිදුවූ සමාගම් ඒකාබද්ධ කිරීම් හා අත්පත් කර ගැනීම් සම්බන්ධ විකුණුම් ප්‍රමාණ අඩුවීම හේතුවෙන් ඇමෙරිකානු එක්සත් ජනපදයේ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය විශාල වශයෙන් අඩු විය.

යුරෝපීය ප්‍රජාවට අයත් රටවල්වලින් ආයෝජන සිදු කරීම අඩුවීම හේතුවෙන් දේශ සීමා අතර සිදුවූ සමාගම් ඒකාබද්ධ කිරීම හා අත්පත් කරගැනීම් සම්බන්ධ විකුණුම් ප්‍රමාණවල වටිනාකම පහළ යෑම නිසා ගිනිකෝණදිග යුරෝපා රටවල හා පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යයන්වලට අයත් පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය පහත වැටුණි.

**ගෝලීය විදේශ සෘජු ආයෝජන රට තුළට ගැලීම, ප්‍රමුඛතම ආර්ථික 2012-2013 (ඇ. ඩො. බිලියනවලින්)**




මූලාශ්‍රය : වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂම, FDI, TNC OVC තොරතුරු පද්ධතිය එ.ජා. ආ.දත්ත පදනම.
www.unctad.org fisstatistics

ලෝක විදේශ සෘජු ආයෝජන ලබාගන්නා ප්‍රමුඛතම රටවල් 20 අතර සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් 8ක් තිබුණි

ආයෝජන ගලායෑම්වල මෙම වෙනස් වන ස්වාභාවය විශාල ලෙස විදේශ සෘජු ආයෝජන ලබා ගන්නා ප්‍රමුඛ පෙළේ රටවල් පිළිබඳව සිදු කරනු ලබන ගෝලීය ශ්‍රේණිගත කිරීම් වලදී ද නිරීක්ෂණය කළ හැකිය. ඉහත වගුවේ සඳහන් වන පරිදි, චීනය, හොංකොං චීනය, බ්‍රසීලය, සිංගප්පූරුව, චිලී, ඉන්දියාව, ඉන්දුනීසියාව හා කොළොම්බියාව යන සංවර්ධනය වෙමින් පවතින රටවල් 8 විදේශ සෘජු ආයෝජන ලබාගත් ලොව ප්‍රමුඛ පෙළේ රටවල් 20 අතරට ඇතුළත් වී තිබේ. එයින් රටවල් 3ක් ඉහළම විදේශ සෘජු ආයෝජන ලබාගත් ලොව ප්‍රමුඛතම රටවල් 5 අතරට ද ඇතුළත් වී තිබේ.

## විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යෑම

2012 වසරේ ඇ. ඩො. බිලියන 1,390 ක් වූ විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් ප්‍රමාණය, 2011 වසරේ වාර්තාගත වූ ඇ. ඩො. බිලියන 1,678 ට සාපේක්ෂව 17% කින් අඩුවිය'

2012 වසරේ, ලෝක විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යෑම 17% කින් අඩුවිය

**ගෝලීය වි.සෘ.ආ. පිටතට ගැලීම (2007-2012)**




2009 වසරේදී වාර්තා වූ අවම සීමාව ආසන්නයටම ලෝක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය පහත වැටුණි.

## කලාපීය මට්ටමින් විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම්




මූලාශ්‍රය : උන්ක්ටාඩ්, ලෝක ආයෝජන වාර්තාව - 2013

සංවර්ධිත රටවල විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යාමේ ප්‍රමාණය පහත වැටීම 2012 වසරේ ලෝක ආයෝජනවල පහත වැටීමට ප්‍රධාන හේතුව විය.

කෙසේවුවද, සංවර්ධනය වෙමින් පවතින ආර්ථික එම රටවල විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යාමේ ප්‍රමාණය 1% කින් ඉහළ නංවාගෙන තිබුණි.

ඇ. ඩො. බිලියන 909 ක් වූ ලෝක විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යෑම්වලින් 65% ක් සංවර්ධිත ආර්ථික සහිත රටවලින් ලැබ තිබුණද, 2012 වසරේ ලෝක විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යෑම් අඩුවීමට ප්‍රධානම හේතුව වූයේ සංවර්ධිත ආර්ථික සහිත රටවල්ය. කෙසේ වුවද, 2012 වසරේ සංවර්ධිත ආර්ථික සහිත රටවල විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම් 2011 වසරේ වාර්තාගත වූ ඇ. ඩො. බිලියන 1,183 ට සාපේක්ෂව 23% කින් අඩු විය. එයට ප්‍රතිවිරුද්ධ අන්දමින් සංවර්ධනය වෙමින් පවතින රටවල ආයෝජකයන් ඔවුන්ගේ ආයෝජන විදේශීය රටවල ව්‍යාප්ත කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර 2012 වසරේදී සංවර්ධනය වෙමින් පවතින ආර්ථික ඇ. ඩො. බිලියන 426 ක විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම් ප්‍රමාණයක් වාර්තා කරමින් 2011 ආයෝජන වටිනාකම වූ ඇ. ඩො. බිලියන 422 ට සාපේක්ෂව ආසන්න වශයෙන් 1% ක වැඩිවීමක් ලබා ගැනීමට සමත් විය. සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ප්‍රමුඛත විදේශ සෘජු ආයෝජන ප්‍රභවය බවට ආසියානු කලාපය පත්ව සිටින අතර කණ්ඩායමේ මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් හතරෙන් තුනක ට ආසන්න ප්‍රමාණයක් එම කලාපයෙන් වාර්තා විය. 2012 වසරේ ආසියාවේ විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑමේ ප්‍රමාණය, 2011 වසරේ වාර්තා වූ ඇ. ඩො. බිලියන 370 ට සාපේක්ෂව, ඇ. ඩො. බිලියන 308ක් ලෙස නොවෙනස්ව පැවතුණි. 2012 වසරේදී, අප්‍රිකානු කලාපයේ විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම් ප්‍රමාණය, 2011 වසරේ වාර්තා ගත වූ ඇ. ඩො. බිලියන 5.3 ට සාපෙක්ෂව, ඇ. ඩො. බිලියන 14.2 දක්වා තෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගියේය. 2012 වසරේදී පරිවර්තන ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන පිටතට ගලා යෑම්වල ප්‍රබල අඩුවීමක් වාර්තා වූ අතර එය ඇ. ඩො. බිලියන 72.88 සිට ඇ. ඩො. බිලියන 55.29 දක්වා 24% ක පහත වැටීමක් විය. රුසියානු ආයෝජකයින්ගේ විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම් අඩු වීම් මෙම පහත වැටීමට ප්‍රධාන හේතුව විය. 2012 වසරේ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යයන් විදේශ සෘජු ආයෝජන පිටතට ගලායෑම් ප්‍රමාණය, 2011 වසරේ වාර්තා වූ ඇ. ඩො. බිලියන 72.4 ට සාපේක්ෂව ඇ. ඩො. බිලියන 55.1 ක අඩුවීමක් සටහන් කරනු ලැබීය.

**ගෝලය විදේශ සෘජු ආයෝජන රට පිටතට ගැලීම, ප්‍රමුඛතම ආර්ථික 2011- 2012**
**(ඇ. ඩො. බිලියනවලින්)**




මූලාශ්‍රය : වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂම,

2012 වසරේ ලෝකයේ ප්‍රමුඛතම ආයෝජකයින් 20 දෙනා අතරින් 7ක් සංවර්ධනය වෙමින් පවතින රටවල් වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල් හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් ලොව ප්‍රමුඛතම ආයෝජකයින් 20 දෙනාගේ කණ්ඩායමට අඛණ්ඩව එක්වෙමින් පවතින බව විදේශ සෘජු ආයෝජනවල ප්‍රමුඛතම ආයෝජකයින් පිළිබඳ ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල දී නිරීක්ෂණය කළ හැකිය. සංවර්ධනය වෙමින් පවතින රටවල් වන චීනය, චීන හොංකොං, කොරියානු ජනරජය, මෙක්සිකෝව, සිංගප්පූරුව, චිලී හා මැලේසියාව ද පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකයක් සහිත රටක් වන රුසියානු සමූහාණ්ඩුව ද මෙම ප්‍රමුඛතම ආයෝජකයින් 20 දෙනා අතරට ඇතුළත් වේ. ගෝලීය ශ්‍රේණිගත කිරීම්වලට අනුව, චීනය සහ චීන හොංකොං ලෝකයේ ප්‍රමුඛතම විදේශීය ආයෝජකයන් පස් දෙනා අතරට එක්ව සිටියි.

# ආයෝජන කාර්යසාධනය

## අදියර අනුව ව්‍යාපෘතිවල විස්තර

### 2013 වර්ෂයේ දී අනුමත කරන ලද ව්‍යාපෘති හා අත්සන් තබනු ලැබූ ගිවිසුම්

2013 වර්ෂයේ දී අනුමැතිය ලබා දුන් මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 172 ක් වූ අතර තක්සේරු කරන ලද මුළු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 3,875 ක් (රුපියල් මිලියන 500,238 ක්) විය. 2013 වසර සඳහා අනුමත වූ ව්‍යාපෘතිවලින් උත්පාදනය වෙතැයි තක්සේරු කරන ලද රැකියා අවස්ථා සංඛ්‍යාව 31,000 කට වඩා අධික වනු ඇත.

1 වන වගුව - 2012 වර්ෂයේ දී අනුමත වූ ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම හා සේවා නියුක්තියේ දායකත්වය (අංශ අනුව)

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජනය සඳහා දායකත්වය | සේවා නියුක්තිය සඳහාදායකත්වය % |
|---|---|---|---|
| සේවා / යටිතල පහසුකම් | 96 | 78% | 53% |
| සාප්පු හා කාර්යාල සංකීර්ණ | | 59% | 24% |
| හෝටල්, අවන්හල් සේවා හා විනෝදාස්වාදය සපයන සංකීර්ණ | 23 | 5% | 8% |
| නිවාස හා දේපළ සංවර්ධන | 15 | 6% | 4% |
| වෙනත් | 41 | 8% | 17% |
| නිෂ්පාදන | 42 | 13.8% | 30% |
| කෘෂිකාර්මික | 2 | 0.2% | 1% |
| පවතින ව්‍යාපෘති පුළුල් කිරීම | 32 | 8% | 16% |
| එකතුව | 172 | 100% | 100% |

2013 වර්ෂයේ දී අනුමත වූ මුළු ආයෝජන අතරින් සේවා / යටිතල පහසුකම් අංශය 78% ක් ලෙස ඉහළ ම දායකත්වය ලබා දී ඇති අතර නිෂ්පාදන අංශය 13.8% කින් හා කෘෂිකර්ම අංශය 0.2% කින් දායක වී ඇත. අනුමත කරන ලද මුළු ආයෝජන ප්‍රමාණයෙන් ඉතිරි 8% පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම සඳහා දායක වී තිබේ. සාප්පු හා කාර්යාල සංකීර්ණ (59%), නිවාස හා දේපළ සංවර්ධන (6%), හෝටල්, අවන්හල් සේවා හා විනෝදාස්වාදය සපයන සංකීර්ණ (5%) යනාදිය සේවා හා යටිතල පහසුකම් අංශයට ඇතුළත් වේ.

2013 වර්ෂයේ අනුමත වූ ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු කරන ලද සේවා නියුක්තියෙන් 53% ක් සේවා / යටිතල පහසුකම් අංශයට ද, 30% ක් නිෂ්පාදන අංශයට ද, 1% ක් කෘෂිකර්ම අංශයට ද සැපයීමට අපේක්ෂා කෙරේ. අනුමත ව්‍යාපෘති මගින් ඇස්තමේන්තු කළ මුළු සේවා නියුක්තියෙන් 16% ක් පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම මගින් උත්පාදනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2013 වර්ෂයේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 140 ක් වේ. මෙම ව්‍යාපෘති වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 4,109 ක් (රුපියල් මිලියන 530,468 ක්) ආයෝජනය කිරීමට ද නියමිත අතර එම ආයෝජන ප්‍රමාණය 2012 වසර හා සැසඳීමේදී 31% ක වර්ධනයක් (රුපියල් අනුව) අත්පත් කර ගෙන තිබේ. රැකියා අවස්ථා 35,000 කට වඩා අධික ප්‍රමාණයක් මෙම ව්‍යාපෘති මගින් උත්පාදනය වනු ඇත.

## 2013 වර්ෂයේදී ඉදිකිරීම් / ක්‍රියාත්මක කිරීම් ආරම්භ කළ ව්‍යාපෘති

2013 වර්ෂයේදී නව ව්‍යාපෘති 80 ක් ද, පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම් 1ක් ද, ඒවායේ ක්‍රියාත්මක කිරීම් / ඉදිකිරීම් ද ආරම්භ කරනු ලැබීය. ක්‍රියාත්මක කිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල ඇස්තමේන්තු කරන ලද මුළු ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 735 ක් (රුපියල් මිලියන 94,910ක්) වූ අතර, අපේක්ෂිත රැකියා උත්පාදනය 11,500 කි.

2වන වගුව - 2013 වර්ෂයේ ඉදිකිරීම් / ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද ප්‍රමුඛ ව්‍යාපෘති 10 (ඇස්තමේන්තු ගත ආයෝජන මත පදනම්ව)

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපාරික ක්‍රියාකාරකම | ඇස්තමේන්ත ගත ආයෝජන (රු. මි.) | ඇස්තමේන්තු ගත සේවා නියුක්ති සංඛ්‍යාව | පිහිටීම |
|---|---|---|---|---|
| ඉන්දුසියෑන් ඩෙවලොප්ස් (පුද්.) සමාගම | නිවාස ඉදිකිරීම | 12,210 | 25 | කොළඹ |
| සූරියන් මයිනින් කම්පැනි (පුද්.) සමාගම | පතල් කැණීමේ හා ප්‍රධාන ඛනිජවල මූලික සැකසීමේ කටයුතු | 5,504.76 | 16 | මහනුවර |
| පී. එච්. රිසෝර්ට්ස් (පුද්.) සමාගම | තංගල්ලේ කාමර 158 ක් සහිත තරු පහේ හෝටලය | 5,285.25 | 289 | හම්බන්තොට |
| ඩී. ආර්. හොටෙල්ස් (පුද්.) සමාගම | කාමර 350 ක් සහිත තරු තුනේ හෝටලය | 4,199.80 | 415 | කොළඹ |
| නිව්ලන් ෆිෂරී (පුද්.) සමාගම | මත්ස්‍ය ව්‍යාපෘතිය | 3,855 | 465 | ගම්පහ |
| නිවාසී ඩෙවලොපර්ස් මාලඹේ (පුද්.) සමාගම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 3,565 | 50 | කොළඹ |
| ඉම්පීරියල් බිල්ඩර්ස් (පුද්.) සමගාම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 3,033.60 | 235 | කොළඹ |
| බ්‍රිටිෂ් ඕවර්සීස් (පුද්ගලික) සමාගම | බද්ධ නිවාස සංකීර්ණය | 2,679 | 210 | කොළඹ |
| ෆෙයාර්වේ ස්කයිහෝම්ස් (පුද්.) සමාගම | බද්ධ නිවාස සංකීර්ණය | 2,348.50 | 25 | කොළඹ |
| ග්ලෝබල් ස්ටාර් ලොජිස්ටික්ස් (පුද්.සමාගම) | ගබඩා සංකීර්ණය | 2,205.06 | 501 | ගම්පහ |

## 2013 වර්ෂයේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති

2013 වර්ෂයේදී නව ව්‍යාපෘති 72ක් හා ව්‍යාපෘති පුළුල් කිරීම් 3ක් ලෙස මුළු ව්‍යාපෘති 75 ක වාණිජ කටයුතු ආරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගත මුළු ආයෝජන ඇමෙරිකානු ඩොලර් මිලියන 505 ක් (රුපියල් මිලියන 65,186 ක්) වූ අතර මෙය 2012 වර්ෂයට සාපේක්ෂව 61%ක වැඩිවීමකි. එමගින් 13,500 කට වඩා අධික රැකියා අවස්ථා උත්පාදනය කිරීමට ද අපේක්ෂිතය. 2013 වර්ෂයේ දී, වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති 75 න් ව්‍යාපෘති 24ක් නිෂ්පාදන අංශයට ද, 39 ක් සේවා අංශයට ද, 12ක් කෘෂිකාර්මික පිරිසැකසුම් අංශයට ද අයත් විය. සේවා අංශයේ ව්‍යාපෘති 39 ට විදුලි බල උත්පාදන ව්‍යාපෘති 14ක් හා හෝටල් ව්‍යාපෘති 13ක් ද ඇතුළත් විය.

## 2013 වර්ෂයේ ආකර්ෂණය කරගත් විදේශ සෘජු ආයෝජන

2013 වසර ඇමෙරිකානු ඩොලර් බිලියන 01කට වඩා විදේශ සෘජු ආයෝජන රටට ලැබුණු තෙවන අනුගාමී වසර විය. මෙම වසරේදී, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,391 ක ඉහළම විදේශ සෘජු ආයොජන ප්‍රමාණයක් ලැබී තිබුණි. 2013 වසරේ මුළු විදේශ සෘජු ආයෝජන අතරින් නිෂ්පාදන අංශය ඇ. ඩො. මිලියන 360ක් හා විදුලි සංදේශන අංශය ඇ. ඩො. මිලියන 360ක් බැගින් සමාන ආයෝජන ප්‍රමාණ ලබාගත් අතර නිවාස හා දේපළ සංවර්ධන හා සාප්පු හා කාර්යාල සංකීර්ණ අංශය ඇ. ඩො. මිලියන 218 (16%) ක විදේශ සෘජු ආයෝජන ද, වරාය සංවර්ධනය සඳහා ඇ. ඩො.මිලියන 164 (12%) ක විදේශ සෘජු ආයෝජන ද ලැබී තිබුණි.

**විදේශ සෘජු ආයෝජනවල ආංශික සංයුතිය - 2013**

| **අංශය** | **වි. සෘ. ආ. (ඇ. ඩො. මිලියන වලින්)** |
|---|---|
| නිෂ්පාදන | 360 |
| කෘෂිකාර්මික සේවා | 8 |
| දුරකථන හා විදුලි සංදේශ ජාලය | 360 |
| නිවාස, දේපළ සං-වර්ධනයය, සාප්පු හා කාර්යාල සංකීර්ණ | 218 |
| වරාය සංවර්ධන කටයුතු | 164 |
| හෝටල් හා අවන්හල් | 68 |
| මූල්‍ය සේවා | 64 |
| ඉන්ධන, ගෑස්, පෙට්‍රෝලියම් හා වෙනත් | 40 |
| තොරතුරු තාක්ෂණ හා ව්‍යා. කා. බැ. ඉ. | 19 |
| බලශක්ති උත්පාදනය | 5 |
| වෙනත් සේවා | 85 |
| මුළු ගණන | 1,391 |



**විදේශ සෘජු ආයෝජනවල ප්‍රධාන ප්‍රභව - 2013**

| රට | වි. සෘ. ආ. (ඇ. ඩො. මිලියන වලින්) |
|---|---|
| චීනය | 240 |
| මැලේසියාව | 176 |
| හොංකොං | 139 |
| නෙදර්ලන්තය | 118 |
| සිංගප්පූරුව | 112 |
| එක්සත් අරාබි එමිරේට්ස් | 111 |
| එක්සත් රාජධානිය | 70 |
| ඉන්දියාව | 51 |
| ජපානය | 38 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 35 |
| කැනඩාව | 26 |
| මුරුසිය | 23 |
| ලක්සම්බර්ග් | 21 |
| ඕස්ට්‍රේලියාව | 18 |
| ස්විට්සර්ලන්තය | 18 |
| තායිලන්තය | 16 |
| ජර්මනිය | 15 |
| බ්‍රිතාන්‍ය වර්ජිනියානු දූපත් | 13 |
| ප්‍රංශය | 12 |
| සවුදි අරාබිය | 10 |
| වෙනත් රටවල් | 129 |
| මුළු ගණන | 1,391 |




2013 වසරේදී, සමස්තයක් ලෙස මෙම රටවල් 20 මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 91% ක් වූ ඇ. ඩො. මිලියන 1262 ක් ලබා දීමට සමත් විය.

## උපලබ්ධි වූ සමුච්චිත ආයෝජන

2013 වර්ෂය අවසානයේදී, උපලබ්ධි වූ සමුච්චිත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 1,512 ක් වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 18% ක වර්ධනයකි. රුපියල් බිලියන 1,512 ක් වූ උපලබ්ධි වූ ආයෝජන ප්‍රමාණයෙන් 63% ක් (රුපියල් බිලියන 959 කින්) විදේශ සංරචකය නිරූපණය කරන අතර, ඉතිරි 37% (රුපියල් බිලියන 553) දේශීය පුද්ගලික ආයෝජනය නිරූපණය කරයි.

උපලබ්ධි වූ සමුච්චිත ආයෝජනවලින් 75% ක් යටිතල පහසුකම් හා සේවා අංශය සඳහා ලැබී තිබුණු අතර, ඉතිරි 25% ඇඟලුම් ක්ෂේත්‍රය ඇතුළත් වන නිෂ්පාදන අංශය සඳහා ලැබී තිබුණි.

## සේවා නියුක්තිය (සමුච්චිත)

2013 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල මුළු සමුච්චිත සේවා නියුක්තිය 483,470 ක් ලෙස වාර්තා විය.




ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල මුළු සමුච්චිත සේවා නියුක්තියෙන් 60% ක් රෙදිපිළි හා ඇඟළුම් අංශවලින් වන අතර 13% ක් වෙනත් නිෂ්පාදන අංශ වලිනි. 9% ක් ප්‍රාදේශීය වැඩසටහන් හා අපනයන පාදක වූ අංශයෙනි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල මුළු සමුච්චිත සේවා නියුක්තියෙන් 19% ක් කෘෂිකර්මාන්තය, අධ්‍යාපනය, සංචාරක කර්මාන්තය, උපයෝගිතා, යටිතල පහසුකම් හා දැනුමැති සේවා යන අනෙකුත් අංශ හයෙන් ලැබී තිබේ.

## කාර්යසාධනය පිළිබඳව අවධානය යොමුකළ යුතු කරුණු
## සංඛ්‍යාලේඛනාත්මක සාරාංශය 2012 වසරට සාපේක්ෂව 2013 වසර

| ප්‍රධාන දර්ශක - ව්‍යාපෘති තත්ත්වය මත පදනම්ව | 2012 | 2013 | 2012/2013 % වෙනස |
|---|---|---|---|
| **ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති** | | | |
| අ. ලැබුණු අයදුම්පත් | | | |
| අයදුම්පත් ගණන | | | |
| නව | 267 | 199 | -25 |
| පුළුල් කිරීම් | 43 | 38 | -11 |
| එකතුව | 310 | 237 | -24 |
| ආ. අනුමත කිරීම | | | |
| අනුමත ව්‍යාපෘති ගණන | | | |
| නව | 193 | 140 | -27 |
| පුළුල් කිරීම් | 45 | 32 | -29 |
| එකතුව | 238 | 172 | -28 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | |
| - විදේශීය (රු. මි.) | 467,505 | 285,083 | -39 |
| - දේශීය (රු. මි.) | 235,660 | 215,155 | -8 |
| - එකතුව (රු. මි.) | 703,165 | 500,238 | -29 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | 56,290 | 31,164 | -45 |
| ඇ. අත්සන් කරන ලද ගිවිසුම් | | | |
| ගිවිසුම් ගණන | | | |
| නව | 128 | 104 | -18 |
| පුළුල් කිරීම් | 35 | 36 | 2 |
| එකතුව | 163 | 140 | -14 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | |
| - විදේශීය (රු. මි.) | 273,008 | 318,560.098 | 16 |
| - දේශීය (රු. මි.) | 132,485 | 211,908 | 60 |
| - එකතුව (රු. මි.) | 405,493 | 530,468 | 31 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | 37,929 | 35,954 | -5 |
| ඈ. ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ ව්‍යාපෘති ගණන | | | |
| නව | 110 | 80 | -27 |
| පුළුල් කිරීම් | 5 | 1 | - |
| එකතුව | 115 | 81 | -30 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | |
| - විදේශීය (රු. මි.) | 95,778 | 34,726 | -64 |
| - දේශීය (රු. මි.) | 80,483 | 60,184 | -25 |
| - එකතුව (රු. මි.) | 176,261 | 94,910 | -46 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | 19,018 | 11,557 | -39 |

| | | | |
|---|---|---|---|
| ඉ. ආරම්භ කරන ලද වාණිජ මෙහෙයුම් ව්‍යාපෘති ගණන | | | |
| නව | 90 | 72 | -20 |
| පුළුල් කිරීම් | 8 | 3 | -63 |
| එකතුව | 98 | 75 | -23 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | |
| - විදේශීය (රු. මි.) | 11,096 | 37,096 | 234 |
| - දේශීය (රු. මි.) | 29,304 | 28,080 | -4 |
| - එකතුව (රු. මි.) | 40,400 | 65,186 | 61 |
| සේවා නියුක්තිය (ඇස්තමේන්තු) | | | |
| (සංඛ්‍යාව) | 20,434 | 13,782 | -33 |
| ඊ. (දෙසැම්බර් මස අවසන් වන විට) වාණිජ මෙහෙයුම්වල නියුතු ව්‍යාපෘති සංඛ්‍යාව** | | | |
| මව් ව්‍යාපෘති/ | | | |
| ප්‍රධාන ව්‍යාපෘති | 1,598 | 1,612 | 1 |
| පුළුල් කිරීම් | 173 | 188 | 9 |
| ඇඟලුම් කම්හල් 200 ව්‍යාපෘතිය | 113 | 116 | 3 |
| එකතුව | 1,884 | 1,916 | 2 |
| උ. විදේශ සෘජු ආයෝජන | | | |
| (ජන-දෙසැ.) | | | |
| (ඇ. ඩො. මිලියන) | 1,338 | 1,391 | 3 |
| (රු. මිලියන) | 170,729 | 179,592 | 5 |
| ඌ. අපනයන (ජන-දෙසැ.) | | | |
| එකතුව (ඇ. ඩො. මි.) | 6,125 | 6,606 | 8 |
| එකතුව (රු. මිලියන) | 781,550 | 852,901 | 9 |
| එ. ආනයන (ජන-දෙසැ.) | | | |
| එකතුව (ඇ. ඩො. මිලියන) | 4,357 | 4,542 | 4 |
| එකතුව (රු. මිලියන) | 556,012 | 586,473 | 5 |
| කාණ්ඩ අනුව (රු. මිලියන) | | | |
| ප්‍රාග්ධන භාණ්ඩ | 127,087.932 | 129,898.492 | 2 |
| අමුද්‍රව්‍ය | 425,419.736 | 456,362.446 | 7 |
| අනෙකුත් ද්‍රව්‍ය | 3,504.277 | 212.389 | -93 |
| ඒ. දෙසැම්බරය අවසානය වන විට සේවා නියුක්තිය (සම්පූර්ණ) | 476,490 | 465,943 | -2 |
| ඔ. ව්‍යාපෘති ගණන*** | | | |
| අවසන් කරන ලද / වැසූ ව්‍යාපෘති | 26 | 38 | 46 |
| නවතා දමන ලද ව්‍යාපෘති | 9 | 7 | -22 |
| අවලංගු කරන ලද ගිවිසුම් | 79 | 120 | 51 |
| එකතුව | 114 | 165 | 44 |

ආයෝජන මණ්ඩල නීතියෙහි 16 වන වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති

| | | | |
|---|---|---|---|
| අ. අනුමැතිය ලබාදීම් | | | |
| අනුමත ව්‍යාපෘති ගණන | 33 | 36 | 9 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | |
| - විදේශීය (රු. මි.) | 3,679 | 4,150 | 13 |
| - දේශීය (රු. මි.) | 348 | 230 | -33 |
| - එකතුව (රු. මි.) | 4,027 | 4,380 | 8 |
| සේවා නියුක්ති ධාරිතාව | | | |
| (සංඛ්‍යාව) | 2,295 | 1,981 | -14 |
| ආ. වාණිජ කටයුතුවල නියැලි ව්‍යාපෘතීන් (සම්පූර්ණ)** | | | |
| ව්‍යපෘති ගණන | 712 | 715 | 0.4 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | |
| - විදේශීය (රු. මි.) | 19,841 | 21,801.208 | 10 |
| - දේශීය (රු. මි.) | 10,386 | 10,220 | -2 |
| - එකතුව (රු. මි.) | 30,228 | 32,021 | 6 |
| සේවා නියුක්ති ධාරිතාව | | | |
| (සංඛ්‍යාව) | 33,425 | 33,624 | 1 |

| | 2012 | 2013 |
|---|---|---|
| විදේශ විනිමය අනුපාතය | | |
| ඇමෙරිකානු ඩොලර්) | 127.6 | 129.11 |

* තාවකාලික

ඉල්ලුම්පත්

ලැබුණු මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව (ප්‍රතික්ෂේප කළ ව්‍යාපෘති හා ඉල්ලා අස්කර ගත් ව්‍යාපෘති ඇතුළුව) තක්සේරු කරන ලද ආයෝජන ප්‍රමාණය / සේවා නියුක්තිය පුළුල් කිරීම්වල වටිනාකම ඇතුළුව

මූලාශ්‍රය
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (MIS - 2014 අප්‍රේල් 29)

** වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු අවලංගු කරන ලද / වසා දමන ලද අත්හිටවූ ව්‍යාපෘති හැර (පුළුල් කිරීම් හැර) (ව්‍යාපෘතිවල දැනට පවතින තත්ත්වයන් අනුව)
*** වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු අවලංගු කරන ලද/ වසා දමන ලද /අත්හිටවන ලද ව්‍යාපෘති හැර (පුළුල් කිරීම් හැර) (ව්‍යාපෘතිවල දැනට පවතින තත්ත්වයන් අනුව)
සම්පාදනය කළේ
සංඛ්‍යාන ඒකකය / පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්ථමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# දෙපාර්තමේන්තු කාර්යසාධනය

## 1. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් සමායෝජනය කෙරේ.

අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම, රැස්වීම් වාර්තා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර සංසරණය කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අදාළ අංශ වෙත දැනුම් දීම පිළිබඳ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලයට පැවරී තිබේ. 2013 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වම් දහතුනක් පවත්වා තිබේ. කළමනාකරණ හා ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම හා ඒ සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීම තහවුරු කිරීම සම්බන්ධයෙන් ද ලේකම් කාර්යාලය වගකීම උසුලයි. 2013 වර්ෂය තුළදී කළමනාකරණ කමිටු රැස්වීම් 06 ක් පවත්වා ඇත.

සභාපතිවරයාට / අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය සහාය ලබා දෙමින් සංවිධානය තුළ මෙන්ම බාහිර නියෝජිතායතන හා පුද්ගලික අංශයේ සංවිධාන අතර විවිධ ක්‍රියාකාරකම් සමායෝජනය කිරීම ද මෙම අංශය මගින් සිදුකරනු ලබන තවත් එක් කාර්යයකි. වාර්ෂික වාර්තාව පළකිරීම සඳහා විවිධ අංශ වලින් අදාළ තොරතුරු ඉල්ලා සිටීම හා එසේ ලැබෙන තොරතුරු විශ්ලේෂණය කිරීම පිළිබඳව ද මෙම අංශය වගකිව යුතුය.

අභ්‍යන්තර අංශවලින් ලැබෙන තොරතුරු සම්පාදනය කිරීම හා පාර්ලිමේන්තුවේ දී හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ දී ඉදිරිපත් වන ප්‍රශ්නවලට හා බාහිර සංවිධානවලින් ලැබෙන විවිධ විමසීම්වලට කාලීන ප්‍රතිචාර ඉදිරිපත් කිරීම ද මෙම ලේකම් කාර්යාලයේ වගකීමකි. ලිපි ගනුදෙනු හා රැස්වීම් පිළිබඳ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ සමායෝජන කටයුතු සිදු කිරීමේ සම්බන්ධීකරණ ස්ථානය ලෙසද අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය කටයුතු කරයි. කැබිනට් සංදේශ, ප්‍රතිපත්ති පිළිබඳ ලේඛන / වාර්තා කෙටුම්පත් කිරීමේ කටයුතුවල හා ව්‍යාපෘති හා සම්බන්ධ අවහිරතා ඉවත් කිරීම සඳහා ආයෝජකයන් හමුවීම ආදී කටයුතුවල ද මෙම අංශය නිරත වෙයි.

## 2. ආයෝජන ප්‍රවර්ධන සහ පහසුකම් සැපයීමේ අංශය

### I වන ආංශික කණ්ඩායම

(සංචාරක කර්මාන්තය, කෘෂි කර්මාන්තය සහ තොරතුරු තාක්ෂණය / දැනුමැති සේවා)

**පසුබිම**

ආයෝජක සම්බන්ධතා කළමනාකරුවන් ලෙස ව්‍යාපෘතිවල විමසීම් / අයදුම් කිරීමේ අදියරේ සිට ඒවා ක්‍රියාත්මකව පවතින සම්පූර්ණ කාලය තුළ ආයෝජකයන්ට අවශ්‍ය සියලුම පහසුකම් සපයමින් විදේශ සෘජු ආයෝජන හා දේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා කටයුතු කිරීම ආංශික කණ්ඩායමේ (ආයෝජන පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය) ප්‍රමුඛ අරමුණයි. ව්‍යාපෘති ඇගයීමේ අදියරේ සිට ක්‍රියාත්මක කිරීමේ අදියර දක්වා සේවා සැපයීම ද පශ්චාත් ආයෝජන සේවා සැපයීම ද මෙම ක්‍රියාවලියට අයත් වන අතර ආංශික කණ්ඩායමට අදාළ වන අංශයේ පාර්ශ්වකරුවන් සමඟ ප්‍රබල සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ද, එම අංශය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීමට ද එමගින් ඔවුන්ට හැකිවේ. යම් අංශයක ආයෝජනය කිරීමට ආයෝජනය කිරීමේ හැකියාවෙන් යුත් ආයෝජකයින් තීරණය කළ විට, එම අංශයේ සියළුම ආයෝජකයන් සඳහා සම්බන්ධතා කළමනාකරුවන් ලෙස සේවා සැපයීමට මෙම කණ්ඩායම කටයුතු කරයි.

ඒ අනුව, ආයෝජන මණ්ඩලය මගින් ඉටු කරනු ලබන පහසුකම් සැලසීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම පිළිබඳව හා සංචාරක කර්මාන්තය හා විවේකය, කෘෂිකර්මාන්තය හා තොරතුරු තාක්ෂණය / දැනුමැති සේවා ව්‍යාපෘති සඳහා ආයෝජකයන්ට ලබා දෙන සේවාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම පිළිබඳව ද, 1වන ආංශික කණ්ඩායම වගකිව යුතුවේ. සංචාරක කර්මාන්තය හා තොරතුරු හා තාක්ෂණය / දැනුමැති සේවා අංශවලට සම්බන්ධ ව්‍යාපෘතිවල සංවර්ධන කටයුතු කඩිනමින් ඉටුකරන අතරතුර ආයෝජන ප්‍රමුඛතා හඳුනා ගැනීමට හා ආයෝජන අවස්ථා පූර්ව ක්‍රියාකාරී මට්ටමින් ප්‍රවර්ධනය කිරීමට අදාළව අංශයේ රේඛීය අමාත්‍යාංශය / අදාළ නියෝජිතායතන සමඟ ද මෙම කණ්ඩායම් කටයුතු කරනු ඇත.

**කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂය තුළ, 1 වන ආංශික කණ්ඩායම විසින් එහි විෂය පථය යටතට ගැනෙන ආයෝජන අවස්ථා පිළිබඳව ගවේෂණය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලැබූ ප්‍රධාන පෙළේ සමාගම් / විදේශීය දූත මණ්ඩල සමඟ සාකච්ඡා කර එම ආයතනවලට අවශ්‍ය පහසුකම් සලසා තිබුණි.

### 2013 වසර තුළදී, 17 වන වගන්තියට අනුව ව්‍යාපෘතිවල අදියර

| විස්තරය | සංචාරක ව්‍යාපාරය | කෘෂිකර්මාන්තය | තොරතුරු තාක්ෂණ / දැනුමැති සේවා | මුළු ගණන |
|---|---|---|---|---|
| ලැබුණු නව අයදුම්පත්‍ර | 32 | 17 | 8 | 57 |
| පුළුල් කිරීම් සහිතව ව්‍යාපෘති අනුමත කිරීම් | 25 | 12 | 8 | 45 |
| ගිවිසුම් අත්සන් කරනු ලැබූ ව්‍යාපෘති | 22 | 10 | 8 | 40 |
| වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති | 14 | 5 | 6 | 25 |

### ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති

සැලකිය යුතු විදේශීය විනිමය ප්‍රමාණයක් හා රැකියා අවස්ථා ලබා දීමෙන් ද, රට තුළ ආදායම් උත්පාදන අවස්ථා වැඩි දියුණු කිරීමෙන් ද, දිවයිනේ සාමාන්‍ය දර්ශනය පථය පවා වෙනස් කරමින් ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ අප රට වෙත ලබා දීමේ හැකියාවක් ඇතැයි සැලකෙන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති දෙකක් හඳුනා ගැනීමට හා ඒ සඳහා පහසුකම් සැලසීමට 2013 වසර තුළදී මෙම ආංශික කණ්ඩායමට හැකිවී තිබේ.

### දැනට පවතින ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන යටතේ, සමාලෝචිත වර්ෂය තුළ අන්තර්ජාතික වෙළඳ නාම සහිත සංකේතාත්මක සංචාරක කර්මාන්ත ව්‍යාපෘති හතරක් සඳහා ද ආංශික කණ්ඩායම මගින් පහසුකම් සපයා තිබේ. කොළඹ ශංග්‍රිල්-ලා හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම, හම්බන්තොට ශංග්‍රිල්-ලා ඉන්වෙස්ට්මන්ට් ලංකා (පුද්.) සමාගම, කොළඹ අයිටීසී වෙළඳ නාමය යටතේ වෙල්කම් හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම හා හයට් රීජන්සීස් සමාගම සමඟ කොළඹ සිනෝ ලංකා හොටෙල් ඇන්ඩ් ස්පා සමාගම මෙම සංචාරක කර්මාන්ත ව්‍යාපෘති හතර වේ. මෙම මහා පරිමාණ සංචාරක ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීමේ අදියරේ වැඩ කටයුතු දැනට සිදුවෙමින් පවතින අතර හම්බන්තොට ශංග්‍රිල්-ලා හොටෙල් ව්‍යාපෘතිය ලබන වසරේදී එහි වාණිජ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.

### 2013 වසර තුළ ආංශික කණ්ඩායම මගින් පහසුකම් සලසනු ලැබූ ප්‍රධාන පෙළේ ව්‍යාපෘති

### 1. සංචාරක කර්මාන්තය

- ආසියා පැසිෆික් කලාපයේ ආගන්තුක සත්කාරක හා විවේකය පිළිබඳ විශාලම සමාගම් අතරින් එකක් වන තායිලන්තයේ මයිනර් ඉන්ටර්නැෂනල් පීඑල්සී සමාගම විසින් ශ්‍රී ලංකාවේ හේමාස් හෝල්ඩින්ස් පීඑල්සී සමාගමේ සහයෝගය ලබාගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සංචාරක කර්මාන්ත ප්‍රභේදය යටතේ ප්‍රධාන පෙළේ ආගන්තුක සත්කාරක ව්‍යාපෘති 3ක මුදල් ආයෝජනය කරනු ලැබීය. ඇ. ඩොලර් මිලියන 40.5 ක මුදලක් ආයෝජනය කරමින් කාමර 158 ක සුපිරි සංචාරක නිවාඩු නිකේතනයක් හම්බන්තොට තංගල්ල නගරයේ ඉදිකිරීමේ ව්‍යාපෘතිය මෙන්ම ඇ. ඩොලර් මිලියන 45ක මුදලක් ආයෝජනය කරමින් කාමර 206 ක් සහිත තවත් සුපිරි නිවාඩු නිකේතන 02ක් කළුතර හා අම්බලන්තොට නගරවල ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අනුමතිය ලද ව්‍යාපෘති ද එම ආගන්තුක සත්කාරක ව්‍යාපෘති අතරට ඇතුළත් වේ. මෙම හෝටල් ව්‍යාපෘති 'අනන්තාරා ඉන්ටර්නැෂනල්' වෙළඳ නාමය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර 2014 හා 2015 වර්ෂවල දී ඒවායේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය. ආදායම සහ කාමර ප්‍රමාණය අනුව ස්පාඤ්ඤයේ තෙවන ස්ථානය හා ලෝකයේ 31 වන ස්ථානයට පත්ව ඇති ස්පාඤ්ඤය පදනම් කොටගත් ආර්අයියු හොටෙල්ස් එස්. ඒ. සමාගම, ශ්‍රී ලංකාවේ අයිටිකන් ස්පෙන්ස් හොටෙල්ස් සමාගමේ සහයෝගය ලබාගෙන තරු පහේ නිවාඩු නිකේතන හෝටලයක් අහුන්ගල්ලේ ඉදිකිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කොට ඇත.

- මෙම යෝජිත ආයෝජනය ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් වනු ඇත. ආර්. අයි. යූ. සමාගමේ 49% ක කොටස් හිමිකම් ආයෝජනය කරනු ලැබූ ලෝකයේ විශාලතම සංචාරක කර්මාන්ත මෙහෙයුම්කරු වන ටී. යූ. අයි. සමාගම ආර්. අයි. යූ සමාගම් සමූහයට මූල්‍ය අනුග්‍රාහකත්වය සලසන බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ආයෝජනය ඇ. ඩො. මිලියන 100 ද ඉක්මවන අතර මෙම හෝටලය කාමර 500කින් සමන්විත වේ. අදාළ පාර්ශ්ව විසින් මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කර තිබේ.

- ඇ. ඩො. මිලියන 80ක් ආයෝජනය කරමින් අති විශාල සුඛෝපභෝගී නිවාඩු නිකේතන ව්‍යාපෘතියක් එල්. ඕ. එල්. සී. ලෙෂර් ලිමිටඩ් මගින් බේරුවලදී ක්‍රියාත්මක කර තිබේ. මෙම ව්‍යාපෘතිය 2015 වසරේ දී නිම කිරීමට අපේක්ෂිතය.

- ශ්‍රී ලංකාවේ විශාලතම හෝටල් දාමයෙන් එකක් වන ජෙට්වින්ග් ග්‍රෑප් මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇ. ඩො. මිලියන 17ක ආයෝජනයක් සිදුකරමින් කාමර 70ක් සහ බද්ධ සේවා නිවාස 28 ක් සහිත තරු හතරේ සුඛෝපභෝගී නිවාඩු නිකේතනයක් කොළඹ වෝඩ් පෙදෙසේ ඉදිකිරීම සඳහා සංචාරක කර්මාන්ත / ආගන්තුක සත්කාරක ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු 2014 වසරේදී ආරම්භ කිරීමට අපේක්ෂිතය. එම සමාගම මගින්ම ඇ. ඩො. මිලියන

13ක් ආයෝජනය කරමින් කාමර 94ක් සහිත හෝටල් ව්‍යාපෘතියක් දඹුල්ල ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර තිබේ. ජෙට්වින්ග් හොටෙල් සමාගම විසින් ඇ. ඩො. මිලියන 8ක මුදලක් ආයෝජනය කර තට්ටු 15කින් හා කාමර 55කින් යුත් හෝටලයක් යාපනය නගරයේ ඉදිකිරීම සඳහා තවත් හවුල් සංචාරක කර්මාන්ත ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේ. මෙය ආයෝජන මණ්ඩලය යටතේ යාපනය නගරයේ ඉදිකරනු ලබන පුද්ගලික අංශයට අයත් විශාලතම සංචාරක කර්මාන්ත ව්‍යාපෘතියකි. යාපනයේ "ජෙට්වින්ග් යාර්ල්" හෝටලය 2015 ජනවාරි මාසයේදී විවෘත කිරීමට නියමිතය. පුද්ගලික අංශයට අයත් ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකික සමාගමක් මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇ. ඩො. මිලියන 3කට අධික මුදලක් ආයෝජනය කරමින් කාමර 56කින් යුත් තවත් හෝටල් ව්‍යාපෘතියක් ද යාපනය නගරයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

● ශ්‍රී ලංකාවේ ඊස්ට් වෙස්ට් ග්‍රෑප් සමාගමේ අනුබද්ධ ආයතනයක් වන වැලිගම ප්‍රොපර්ටීස් ආයතනය මගින් ඇ. ඩො. මිලියන 40ක ආයෝජනයක් සිදු කරමින් ඉන්ටර්නැෂනල් මැරියට් වෙළඳ නාමය යටතේ කාමර 200ක හෝටල් ව්‍යාපෘතියක් ඉදිකිරීම ආරම්භ කර තිබේ. මෙම ව්‍යාපෘතිය 2014 වසරේදී සම්පූර්ණ කිරීමට නියමිතය.

● "දම්රෝ ග්‍රෑප් ඔෆ් කොම්පැනීස්" මගින් ඇ. ඩො. මිලියන 40ක මුදලක් ආයෝජනය කිරීම මගින් කාමර 270 ක් සහිත තරු පන්තියේ සුඛෝපභෝගී නාගරික හෝටල් ව්‍යාපෘතියක් කොළඹ 04 ඉදිකිරීම ආරම්භ කර තිබේ. මෙම ව්‍යාපෘතිය 2015 දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

● දළ වශයෙන් ඇ. ඩො. මිලියන 35ක් 100% ක විදේශ ආයෝජන ලෙස වැය කරමින් කාමර 200කින් යුත් තරු පහේ හෝටල් ව්‍යාපෘතියක් මහනුවර නගරයේ ඉදි කිරීමේ අරමුණින් තායිවාන් ආයෝජකයෙකු විසින් අයදුම්පතක් ඉදිරිපත් කර තිබේ. ව්‍යාපෘතියට අදාළ වැඩ කටයුතු සිදු කරමින් පවතින අතර 2015 අවසානයේදී හෝටලයේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කෙරේ.

● ආංශික කණ්ඩායම මගින් සපයනු ලැබූ පහසුකම් උපයෝගී කර ගනිමින් "සිට්‍රස් ලෙෂර් පීඑල්සී" සමාගම මගින් ඇ. ඩො. මිලියන 24ක මුදලක් අයෝජනය කර කාමර 150 ක් හා විශාල උත්සව ශාලාවක් ඇතුළු පහසුකම්වලින් සමන්විත සුඛෝපභෝගී නිවාඩු නිකේතනයක් කළුතර වස්කඩුවේදී ඉදිකිරීමට අපේක්ෂිතය. මෙම නිවාඩු නිකේතනයේ මෙහෙයුම් කටයුතු 2014 දී ආරම්භ කිරීමට නියමිතය.

● කොළඹ "පෙයාර්වේ හෝල්ඩින්ස්" සමාගම විසින් ඇ. ඩො. මිලියන් 16ක් ආයෝජනය කර කාමර 156 ක් සහිත තවත් නාගරික හෝටල් ව්‍යාපෘතියක් කොළඹ නගරයේ ඉදිකිරීමේ කටයුතුවල නිරතව සිටියි. මෙය 2015 වසරේදී අවසන් කිරීමට නියමිතය.

● "ස්ටාර්වුඩ් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට් වර්ල්ඩ් වයිඩ් ඉන්ක්" සහ ස්විට්සර්ලන්තයේ "මොවන්පික් හොටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස් ටුවරිසම්" ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළදී, සංචාරක කර්මාන්ත අංශයෙන් ඉදිරිපත් වූ තවත් අන්තර්ජාතික හෝටල් වෙළඳ නාම දෙකකි.

● ඇ. ඩො. මිලියන 14ක මුදලක් ආයෝජනය කරමින් කාමර 80 ක හෝටල් ව්‍යාපෘතියක් ඉදිකිරීමේ කටයුතු මාතර තල්පේදී ආරම්භ වූ අතර එය 2015 දී නිම කිරීමට අපේක්ෂිතය.

● "කේ. බී. යු. ඇඩ්වෙන්චර්ස්" මගින් දළ වශයෙන් ඇ. ඩො. මිලියන 10ක මුදල් ආයෝජනයක් කරමින් කාමර 78 ක හෝටල් ව්‍යාපෘතියක් තිස්සමහාරාමයේදී ආරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු 2015 වසරේදී ආරම්භ කිරීමට අපේක්ෂිතය.

● 100% ක් මැලේසියානු ආයෝජන යටතේ කාමර 12කින් යුත් සාප්පු හෝටල් ව්‍යාපෘතියක් බලපිටියේ ඉදි වෙමින් පවතී. 2015 වසරේ මුල් භාගයේදී එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

● වාද්දුව රිසෝර්ට් පුද්ගලික සමාගම විසින් ජපාන සහයෝගීතාව මත ඇ. ඩො. මිලියන 4ක මුදලක් ආයෝජනය කරමින් කාමර 27ක හෝටල් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එහි වාණිජ මෙහෙයුම් කටයුතු 2014 වසර අවසානයේදී ආරම්භ කිරීමට නියමිතය.

● කොළඹ නගරයේ දැනට පවතින විශාල සුඛෝපභෝගී හෝටල් ව්‍යාපෘතියක පුළුල් කිරීමේ කටයුතුවලට අමතරව, ආංශික කණ්ඩායම මගින් පහසුකම් සපයනු ලැබූ නව සංචාරක කර්මාන්ත / විවේක ව්‍යාපෘති 13ක් සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලාංකේය ආගන්තුක සත්කාරක කර්මාන්තය වෙත පිරි නමා තිබේ.

## 2. කෘෂිකාර්මික අංශය

● 100% ක විදේශ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස ඇ. ඩො. මිලියන 41ක් ආයෝජනය කරමින් චීනය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ සහ අපනයනය සඳහා මසුන් පිරිසැකසුම් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අනුමැතිය ලබා දී තිබේ.

● ඇ. ඩො. මිලියන 7ක මුදලක් ආයෝජනය කරමින් පොල් කිරි සහ පොල් වතුර පිරිසැකසුම් කිරීමේ සහ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අනුමැතිය ලැබී තිබේ. මෙය සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන සඳහා දේශීය සහ ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා "සිලෝන් බිස්කට්ස් ලිමිටඩ්" ආයතනයෙන් ඉදිරිපත් කර තිබේ.

● අපනයන වෙළඳපොළ හා දේශීය වෙළඳපොළ සඳහා මත්ස්‍යයන් ඇති කිරීමේ නව්‍ය යෝජනා ක්‍රමයක් ලෙස "ඕෂන් පික් (පුද්.) සමාගම මගින් රු. මිලියන 640 ක මුළු මුදලක් ආයෝජනය කරමින් ස්කොට්ලන්ත තාක්ෂණයට අනුව ත්‍රිකුණාමල මුහුදේ කොටුවල / මත්ස්‍ය ගොවිපොළවල ජල ජීවී හා මත්ස්‍ය වගාව සිදු කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අනුමැතිය හිමි වී තිබේ.

● ඊශ්‍රාලයේ ඇක්වෙයාර් කල්චර් සමාගමක් හා එක්ව "සෙනුර ඇක්වෙයාර් කල්චර් ලංකා (පුද්.) සමාගම" මගින් ඇ. ඩො. මිලියන 11ක ආයෝජනයක් සිදුකර වඩාත්ම නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කරමින් මත්ස්‍ය ගොවිපොළක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා ගිවිසුමක් අත්සන් කර තිබේ.

● ඇ. ඩො. මිලියන 0.5 ක ආයෝජනයක් සිදු කරමින් පිරිසිදු පොල්තෙල් හා ඒ හා ආශ්‍රිත අනෙකුත් අයිතම නිෂ්පාදනය කිරීමේ සහ අපනයනය කිරීමේ ව්‍යාපෘති යෝජනාවක් "රේණුකා ඇග්‍රී ෆුඩ්ස්" ආයතනය මගින් ඉදිරිපත් කරනු ලැබීය. ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී.

## 3. තොරතුරු තාක්ෂණය / දැනුමැති සේවා අංශය

● ලන්ඩනයේ කොටස් වෙළඳපොළ සාමාජිකයෙකු වන ලොව ප්‍රමුඛතම මෘදුකාංග සංවර්ධන සමාගමක් මෙන්ම ප්‍රාග්ධන වෙළඳපොළ සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා සහාය ලබාදීමේ විශේෂඥයෙකු වන මිලේනියම් අයි. ටී. සොෆ්ට්වෙයාර් (පුද්.) සමාගම (MIT) එහි මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත කිරීමේ අරමුණින් ඇ. ඩො. මිලියන 4ක් ආයෝජනය කර තිබේ. මෙයට අමතරව, ශ්‍රී ලංකාවෙන් ලාභ උපයා ගන්නා සුරැකුම්පත් සමාගම් සඳහා සේවා සලසන මිලේනියම් අයි. ටී. සොෆ්ට්වෙයාර් (පුද්.) සමාගම (MIT) ට අනුබද්ධ සමාගමක් කැනඩාවේද, ශාඛා කාර්යාල දෙකක් හොංකොං හා සිංගප්පූරුවේ ද මේ වන විට ස්ථාපනය කර තිබේ.

● ගෝලීය කළමනාකරණ උපදේශන තාක්ෂණික සමාගමක් මෙන්ම බැහැර සේවා සැලසීමේ සමාගමක් ද ව ඇසෙන්චර් බී. වී. (පුද්.) සමාගම, "බ්‍රැන්ඩික්ස් ලිමිටඩ්" සමාගම සමග හවුල් ව්‍යාපාරයක් ලෙස තොරතුරු තාක්ෂණ සේවා සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සැපයීම, ව්‍යාපාරික බැහැර සේවා සහ දැනුමැති බැහැර සේවා ඉටුකිරීම මෙන්ම මෘදුකාංග සංවර්ධනය හා සමෝධානය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කර ඇත. 2015 වසරේ ශ්‍රී ලාංකික තරුණ පරපුර සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා 2000 ක් සැපයීමට ද මෙම සමාගම මගින් සැලසුම් සකස් කරයි.

● ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති, දැනට ඕස්ට්‍රේලියාවේ හා නවසීලන්තයේ මූල්‍ය සමාගම්වලට හා විශාල සංස්ථාවලට සහතික ලෙසත් විශ්වාසනීය ලෙසත් බැහැර සේවා සපයනු ලබන "ජේකෝප් ගෲප්" සමාගම මගින් ඇ. ඩො. 4 ක මුදලක් ආයෝජනය කරමින් විදේශීය සමාගම්වලට ව්‍යාපාරික / දැනුමැති බැහැර සේවා සැපයීම සඳහා මෙන්ම අපනයනය සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා ද ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කර ඇත.

● Ebay.com යන දීර්ඝතම විද්‍යුත් වානිජ්‍ය වෙන්දේසි අඩවියේ උපකාරක සමාගමක් වන $WSO_2$ (පුද්.) සමාගම ඇ. ඩො. මිලියන 4 ක ආයෝජනයක් සිදුකරමින් ශ්‍රී ලංකාව තුළ මෘදුකාංග සංවර්ධනය කිරීමට අදාළ මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග පරිපූරක ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

● පුද්ගලික අංශයට අයත් ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකික ආයෝජන සමාගමක් මගින් ඇ. ඩො. මිලියන 9ක යෝජිත ආයෝජනයක් සිදු කරමින් අන්තර්ජාතික / දේශීය තොරතුරු තාක්ෂණික / ව්‍යාපාරික බැහැර සේවා ඉටුකරවා ගැනීම සඳහා අන්තර්ජාතික නව්‍ය දැනුමැති සේවා උයනක් කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපළ ආසන්නයේ ස්ථාපනය කරනු ලබයි.

● ඉන්දියාවේ CMA-CGM ආයතනය ශ්‍රී ලංකා හේලීස් පීඑල්සී ගෲප් සමග සහයෝගීතාවෙන් ආයෝජන මණ්ඩලය යටතේ මහා පරිමාණ ව්‍යාපාරික බැහැර සේවා ඉටු කිරීමේ මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකාව තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණික ආංශික කණ්ඩායම ආරම්භයේ සිටම මහ සභා සාමාජිකයෙකු ලෙස Gartner ආයතනයෙන් පැවත එන පිළිගත් පර්යේෂණ සමාගමක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ස්වාධීනව වාර්තාව තෝරා ගැනීමේදී හා එය ප්‍රයෝජනයට ගැනීමේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) සහ තොරතුරු තාක්ෂණික සංවර්ධන කාර්මික සංගමයක් වන ශ්‍රී ලංකා මෘදුකාංග හා සේවා සමාගම (SLASSCOM) සමඟ කෙළින්ම සම්බන්ධ වී කටයුතු කරයි. අගය එකතු කළ දැනුමැති බැහැර සේවා හා ව්‍යාපාරික බැහැර සේවා ඉටු කිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ පවතින ඉහළ ප්‍රමිතිය ලන්ඩනයේ බැහැර සේවා ඉටු කිරීමේ ජාතික සංගමය (NOA) මගින් "වසරේ බැහැර සේවා ඉටු කිරීමේ ගමනාන්තය" ලෙස ශ්‍රී ලංකාව පිළිගැනීමකට ලක් කිරීමට විශාල දායකත්වයක් සපයනු ලැබීය. ශ්‍රී ලංකාව ලබාගත් මෙම සම්මානය දැනුමැති බැහැර සේවා හා ව්‍යාපාරික බැහැර සේවා ඉටුකරනු ලබන ලෝක පූජිත සමාගම් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීම සඳහා මනා පිටුබලයක් සපයයි.

**ප්‍රවර්ධන කටයුතු**

**විදේශ රටවල සංචාරය කළ දූත පිරිස්**

- සිංගප්පූරුවේ හා මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලවල සහාය ඇතිව සංවිධානය කරනු ලැබූ ආයෝජන සම්මන්ත්‍රණ හා "ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා" යන මැයෙන් පැවැත්වූ ඉදිරිපත් කිරීම් ද, එයින් පසුව ප්‍රශ්න හා පිළිතුරු දීමේ සැසියක් ද, දෙරටේ ද්විපාර්ශ්වික ව්‍යාපාරික සාකච්ඡා ද ඇතුළත් වූ ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර සඳහා 2013 මැයි මාසයේ දී, ශ්‍රී ලාංකික දූත පිරිස් සිංගප්පූරුවට හා මැලේසියාවට සංචාරය කළහ.

- 2013 මැයි මාසයේ ඉන්දියාවේ දී පැවැත්වූ ආයෝජන හා වෙළඳාම පිළිබඳ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සංසදය සඳහා ශ්‍රී ලාංකික දූත පිරිස් සහභාගී වූ අතර මුම්බායි නගරයේ තෝරාගත් ව්‍යාපාරික ප්‍රජාව සඳහා "ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා" යන මැයෙන් ඉදිරිපත් කිරීමක් ද සිදු කරනු ලැබීය.

- 2013 ජූනි මාසයේ දී, අමාත්‍යාංශයීය දූත පිරිස එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර සඳහා සහභාගී වූ අතර ව්‍යාපාරික සංසදය ඇමතීම, ඉදිරිපත් කිරීම් සිදු කිරීම හා පූර්වයෙන් සැලසුම් කරන ඉහළ පෙළේ ව්‍යාපාරික සාකච්ඡා සඳහා ද ඔවුහු සහභාගි වූහ.

- ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන යටතේ, 2013 ජූනි මාසයේ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරදී සංවිධානය කරන ලද දිවා භෝජන සංග්‍රහයක් ද සහිතව පැවැත්වූ ආයෝජන සඳහා උපස්තම්භක වන ශ්‍රී ලංකාවේ ප්‍රවණතා පිළිබඳව දැනුවත් කිරීමේ හමුවකට ශ්‍රී ලාංකික දූත පිරිස් සහභාගී වූහ.

- 2013 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ දී පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2013 ජූලි මාසයේ බැංකොක් නුවර දී පවත්වනු ලැබීය.

- 2013 අගෝස්තු 28 දින සිට සැප්තැම්බර් 8 වැනිදා දක්වා තුර්කියේ ප්‍රධාන නගර 6ක පැවැත්වුණු ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර සඳහා අමාත්‍යාංශීය දූත පිරිස හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහභාගී වූහ. එමෙන්ම ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු ලෙස සලකනු ලබන තුර්කියේ 82 වන "ඉස්මීර්" අන්තර්ජාතික සැණකෙළිය සඳහා ද ඔවුහු සහභාගී වූහ.

- 2013 නොවැම්බර් මාසයේ ඉන්දුනීසියාවේ දී පැවැත් වූ සංවර්ධනය වෙමින් පවතින රටවල ආයෝජන සාකච්ඡාකරුවන්ගේ 7 වන වාර්ෂික සංසදයට ද ශ්‍රී ලාංකික දූත පිරිස් සහභාගී වූහ.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු 2013 නොවැම්බර් මාසයේ දී, මැලේසියාවේ පැවැත් වූ ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවරක් සඳහා ද සහභාගී වූහ.

**ශ්‍රී ලංකාවේ සංචාරය කළ දූත පිරිස්**

- එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ අබුඩාබි හි "ගන්ටූට් ග්‍රෑප්" සමාගම සංචාරක කර්මාන්ත හා පෙට්‍රෝලියම් ආශ්‍රිත ක්ෂේත්‍රවල ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීමට 2013 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එම දූත පිරිස සඳහා කුච්චවේලි ප්‍රදේශයේ හා ත්‍රිකුණාමල වරාය ආසන්නව පිහිටි ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ස්ථානීය පරීක්ෂාවන් ද සංවිධානය කරනු ලැබීය.

- කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන ෂික් බින් කලීෆා තානි ඇතුළු කටාර් රාජ්‍යයේ නියෝජිත පිරිසක් දෙදින නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ. තවද, කටාර් රාජ්‍යයේ, "ඩයර් රියල් එස්ටේට් ඉන්වෙස්ට්මන්ට්" සමාගමේ දූත පිරිසක් ද සංචාරක කර්මාන්ත / විවේක අංශයේ ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීම සඳහා 2013 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණියහ.

● තායිලන්ත අගමැති සමඟ තායි ව්‍යාපාරික දූත පිරිසක් 2013 මැයි - ජූනි කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. මෙම දූත පිරිස වෙනුවෙන් ව්‍යාපාරික සාකච්ඡා ද, විවිධ අංශවල ආයෝජන හැකියාවන් පිළිබඳව සොයා බැලීම සඳහා අපනයන සැකසුම් කලාපවල සංචාරයන් ද සංවිධානය කර තිබුණි.

● 2013 මුල් භාගයේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සංචාරය කිරීමෙන් අනතුරුව, අබුඩාබි හි "ගන්ටූට් ග්‍රෑප්" සමාගමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් කොළඹ නගරයේ තරු පහේ හෝටලයක් ඉදිකිරීම සඳහා ආයෝජනය කිරීමේ හැකියාව පිළිබඳ ව සොයා බැලීමට 2013 ජූනි මාසයේදී නැවතත් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ.

● ආයෝජනය කිරීමේ විභවය සහිත ශ්‍රී ලාංකික ආයෝජකයන් සමඟ හවුල් ව්‍යාපාර ඇරඹීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමට ඉන්දියාවේ අයිවරි කෝස්ට් හි ව්‍යාපාරික දූත පිරිසක් අගෝස්තු මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

● සිංගප්පූරු දූත පිරිස් දෙකක් ආගන්තුක සත්කාරක හා යටිතල පහසුකම් අංශයේ ආයෝජනය කිරීමේ අවස්ථා පිළිබඳව විශේෂයෙන් සොයා බැලීමට සැප්තැම්බර් මාසයේ ශ්‍රී ලංකාවි සංචාරය කළහ. එක් දූත පිරිසක් අන්තර්ජාතික ආයෝජන සඳහා සිංගප්පූරු රජය මගින් ස්ථාපනය කරනලද සංස්ථාපිත මණ්ඩලයක් වන "අයි. ඊ. සිංගප්පෝර්" නියෝජනය කළහ.

● ආහාර මත පදනම් වූ කර්මාන්තවල ආයෝජන අවස්ථා පිළිබඳව විශේෂයෙන් සොයා බැලීමට ඕමානයේ ආයෝජන ප්‍රවර්ධන හා අපනයන සඳහා පොදු අධිකාරියේ දූත පිරිසක් ඔක්තෝම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

● මැලේසියාවේ "එම්.කේ." කණ්ඩායම සංචාරක කර්මාන්ත / විවේකය හා යටිතල පහසුකම් අංශවල ආයෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින ව්‍යාපාරික අවස්ථා පිළිබඳව සොයා බැලීමට නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

● චීන දූත පිරිසක් ධීවර කාර්මික අංශයේ පවතින ආයෝජන අවස්ථා පිළිබඳව විශේෂයෙන්ම සොයා බැලීමට 2013 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

● ද්විපාර්ශ්වික වෙළඳාම, ආර්ථික, සංස්කෘතික, අධ්‍යාපනික සහ තාක්ෂණික සහයෝගීතාව සවිබල ගැන්වීම සඳහා 2013 වසරේ නොවැම්බර් මාසයේ කොළඹ දී පැවැත් වූ ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර 11 වන හවුල් ආර්ථික කොමිෂම (JEC) සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය.

● ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2013 වසරේ නොවැම්බර් මාසයේ පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදයේ ක්‍රමෝපාය හවුල්කරුවෙකු වූ අතර මෙම ආංශික කණ්ඩායම් තුනට සම්බන්ධ ව්‍යුහගත ව්‍යාපෘති සැකසීමේ කාර්යයේ ඉතා ක්‍රියාකාරී ලෙස නිරත විය. ව්‍යුහගත ව්‍යාපෘති 50ක් සකස් කරනු ලැබූ අතර පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය අතරතුර ඒවා ආයෝජකයන් වෙත පිරිනමනු ලැබීය.

● 2013 නොවැම්බර් මාසයේ පැවැත් වූ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය වෙනුවෙන් ඉදි කරන ලද එකම වහලක් යටින් සියල්ල ලබාගත හැකි ආයෝජන මධ්‍යස්ථානයේ හා "ශ්‍රී ලංකාවේ ආයෝජන ශක්‍යතාව පිළිබිඹු කිරීම" යන මැයෙන් පැවැත් වූ ප්‍රදර්ශනයේ මෙහෙයුම් කටයුතුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉතා ක්‍රියාකාරීව නිරත විය.

## II වන ආංශික කණ්ඩායම

**(යටිතල පහසුකම්, උපයෝගිතා හා අධ්‍යාපන)**
**ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බැලීමට පහත සඳහන් ප්‍රධාන සමාගම් /කණ්ඩායම් 2013 වසරේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.**

**යටිතල පහසුකම් අංශය**

- **චෙක් පෝර්ට් සිටි කලම්බු (පුද්.) සමාගම**

ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ, චෙක් පෝර්ට් සිටි කලම්බු (පුද්.) සමාගම විසින් ඇ. ඩොලර් මිලියන 1300 ක අපේක්ෂිත ආයෝජනයක් සිදුකර "කොළඹ වරාය නගරය" සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ 2013 නොවැම්බර් මාසයේ 11 වන දින ගිවිසුමකට එළඹුණේය. චීනයට අයත් චයිනා කමියුනිකේෂන් කන්ස්ට්‍රක්ෂන් (පුද්.) සමාගමේ 100% ක විදේශීය ආයෝජනයක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර මේ යටතේ කොළඹ වරායට යාබදව පිහිටි හෙක්ටයාර් 233 ක භූමි ප්‍රමාණය ප්‍රතිසංස්කරණය කිරීම හා සංවර්ධනය කිරීම සිදු කරනු ලබන අතර එමගින් භූමිය සඳහා පවතින වැඩිවන ඉල්ලුම සපුරා ගත හැකි වනු ඇත. මෙම ව්‍යාපෘතිය වසරක් තුළ දී ක්‍රියාත්මක කරනු ලැබේ.

- **වෝටර්ෆ්‍රන්ට් ප්‍රොපටීස් (පුද්.) සමාගම**

ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ, වෝටර් ෆ්‍රන්ට් ප්‍රොපටීස් (පුද්.) සමාගම මගින් කොළඹ 02, ග්ලෙනි වීදියේ මිශ්‍ර භාවිත ව්‍යාපෘතියක් ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ 2013 ජූලි 11 වැනි දා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සිදු කිරීමට අපේක්ෂිත ආයෝජනය ඇ. ඩොලර් මිලියන 650 ක් වන අතර ශ්‍රී ලංකා ජෝන් කීල්ස් හෝල්ඩියන්ස් පීඑල්සී සමාගම මගින් සම්පූර්ණ ආයෝජන මුදල දරනු ලැබේ.

- **ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම**

ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම ඇ. ඩොලර් මිලියන 250 ක අපේක්ෂිත ආයෝජනයක් සිදු කරමින් කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ බද්ධ නිවාස ඒකක 528 ක් ද, සමාජ ශාලාවක්, වාණිජ කටයුතු සඳහා ඉඩකඩ මෙන්ම රථ වාහන නැවැත්වීමේ පහසුකම් ද ඇතුළත්ව බද්ධ නිවාස සංකීර්ණයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ පරිපූරක ගිවිසුමකට ඇතුළත් විය. මෙම ව්‍යාපෘතිය ඉන්ටර්නැෂනල් ඉංජිනියරින් (හොංකොං) ලිමිටඩ් හා හොකොං හි නයිස් වීව් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් අතර හවුල් ව්‍යාපෘතියකි. ව්‍යාපෘතිය වසර පහක් තුළදී ක්‍රියාත්මක වීමට නියමිතව ඇත.

**වසර තුළ ලැබුණු වෙනත් සුවිශේෂී ව්‍යාපෘති යෝජනා**

- **කලම්බු සිටි සෙන්ටර් පාර්ට්නර්ස් (පුද්.) සමාගම**

කලම්බු සිටි සෙන්ටර් පාර්ට්නර්ස් (පුද්.) සමාගම ඇ. ඩො. මිලියන 20 ක අපේක්ෂිත ආයෝජනයක් සමඟ කොළඹ 02, සර් ජේම්ස් පීරිස් මාවතේ තරු හතරේ ව්‍යාපාරික හෝටලයක්, සමෝධානික ශරීර සුවතා මධ්‍යස්ථානයක් හා බද්ධ නිවාස ඒකක 135 කින් සමන්විත වන මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

- **ඇක්සෙස් රියලිටීස් 2 (පුද්.) සමාගම**

කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 278 දරණ ස්ථානයේ දැනට පවතින 'ඇක්සෙස් ටවර්' ගොඩනැගිල්ල නවීනතම තාක්ෂණික ක්‍රම අනුගමනය කර සංවර්ධනය කිරීමේ හා පුළුල් කිරීමේ දෙවන අදියර ලෙස ඇ. ඩො. මිලියන 20ක මුදලක් ආයෝජනය කරමින් කාර්යාල සංකීර්ණයක් ඉදි කිරීමට ඇක්සෙස් රියලිටීස් 2 (පුද්.) සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග 2013 අප්‍රේල් 04 වැනිදා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

- **සී. ඩී. සී. ඉන්ෆ්‍රා (පුද්.) සමාගම**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ඉදිකර භාරදීමේ පදනම මත ඇ. ඩො. මිලියන 55ක ආයෝජනයක් සිදු කරමින් කොළඹ - 06 එඩ්මන්ටන් පාරේ බද්ධ නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සී.ඩී. සී ඉන්ෆ්‍රා (පුද්.) සමාගම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ 2013 ඔක්තෝම්බර් 31 වදා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය මගින් කුළුණු 2ක බද්ධ නිවාස ඒකක 570 ක් ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

- **සිංගපෝර් ඩයලිසිස් මෙඩ් ගෲප් (පුද්.) සමාගම**

සිංගපෝර් ඩයලිසිස් මෙඩ් ගෲප් (පුද්.) සමාගම මගින් ඇ. ඩො. මිලියන 1.51 ක ආයෝජනයක් සිදු කරමින් කාන්දු පෙරීමේ ක්‍රමය අනුගමනය කරමින් වකුගඩුවල ප්‍රතිකාර කිරීම සඳහා විශේෂ රෝහලක් සංවර්ධනය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹෙන ලදී. සිංගප්පූරුවේ ප්‍රින්සෙස් ඩයිලිසිස් (පුද්.) සමාගම මෙම ව්‍යාපෘතියේ ආයෝජකයා වන අතර මෙම රෝහල කොහුවල, එස්. ද. එස්. ජයසිංහ මාවතේ අංක 137/4 දරණ ස්ථානයේ පිහිටා ඇත.

**ක්‍රියාත්මක වීමට නියමිතව ඇති ප්‍රධාන ආයෝජන යෝජනා**

1. සිංගප්පූරුවේ වර්ල්ඩ් වන් (ශ්‍රී ලංකා) ප්‍රොජෙක්ට් (පුද්.) සමාගම විසින් කොළඹ - 02 කොම්පඤ්ඤ වීදියේ නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් හා මිශ්‍ර භාවිත සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මේ සඳහා තක්සේරු කරන ලද පිරිවැය ඇ. ඩො. මිලියන 424.7 ක් වේ. මෙම යෝජනාව යටතේ මෙම ප්‍රදේශයේ දැනට ජීවත් වන පුද්ගලයන්ට වඩාත් හොඳ ජීවන තත්වයන් හා පොදු පහසුකම් ලබාදීමේ අරමුණින් කොම්පඤ්ඤවීදිය නැවත සංවර්ධනය කිරීම සඳහා අක්කර 3ක පමණ භූමි ප්‍රමාණයක් භාවිත කරනු ලබන අතර තවත් අක්කර 5ක පමණ භූමියක් මිශ්‍ර භාවිත ව්‍යාපෘතියක් බවට සංවර්ධනය කරනු ලැබේ.

2. රත්මලාන ගුවන් තොටුපළ සංවර්ධනය කිරීමේ යෝජනාව

320 එයාර් බස් වර්ගයේ ගුවන් යානා මෙහෙයවීමට හැකිවන ක්ෂේත්‍ර 4 ශ්‍රේණි 5 ගුවන් තොටුපොළක් ලෙස රත්මලාන ගුවන් තොටුපොළ වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාව සපුරාලීමට හා ගුවන් තොටුපොළ අවට ප්‍රදේශය අදාළ අනුබද්ධ පහසුකම් සහිතව ගුවන් නගරයක ප්‍රධාන සැලැස්ම අනුව සංවර්ධනය කිරීමට චීනයේ චෙන් මිංගෝ මහතා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ආයෝජනය ඇ. ඩො. මිලියන 100.0 කි.

**උපයෝගිතා අංශය**

1. "ට්‍රින්කොමලී පවර් කම්පැණි ලිමිටඩ්" ආයතනය මගින් ඇ. ඩො. මිලියන 500ක ඇස්තමේන්තු කළ ආයෝජනයක් සිදු කරමින් ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ ත්‍රිකුණාමලයේ සාම්පූර් ප්‍රදේශයේ මෙගා වොට් 2 × 250 ධාරිතාවෙන් යුත් ගල් අඟුරු බලාගාරයක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ 2013 ඔක්තෝම්බර් 7 වන දා ගිවිසුමකට එළඹුණේය. ට්‍රින්කොමලී පවර් කම්පැණි ලිමිටඩ් ආයතනය ඉන්දියාවේ එන්. ටී. පී. සී. ලිමිටඩ් හා ලංකා විදුලිබල මණ්ඩලයේ හවුල් ව්‍යාපාර ආයතනයක් විය.

පසුගිය වසරවල පහත සඳහන් සන්ධිස්ථානවලට පිවිසීමට හැකි වූ බැවින් ඉහත ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය දියත් කිරීමට හැකි විය.

| සන්ධිස්ථානය | වසර / කාලය |
|---|---|
| ලං. වි. ම. හා එන්ටීපීසී අතර මෙගාවොට් 2 × 250 ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම | 2006 දෙසැම්බර් 02 වනදා |
| ත්‍රිකුණාමලය සාම්පූර් ප්‍රදේශයේදී ස්ථානීය පරීක්ෂණ කටයුතු අවසන් කිරීම | 2007 ජනවාරි |
| ලං.වි.ම. හා එන්ටීපීසී ආයතන අතර හවුල් ව්‍යාපාරික ගිවිසුම අත්සන් කිරීම | 2011 සැප්තැම්බර් 06 වනදා |
| "ට්‍රින්කොමලී පවර් කම්පැණි ලිමිටඩ්" සංස්ථාපනය කිරීම | 2011 සැප්තැම්බර් 26 වනදා |

පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව (EIA) පිළියෙල කර අවසන් කිරීමෙන් පසුව පහත සඳහන් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඒ අනුව ආරම්භ කළ හැකිය.

(අ) ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම
(ආ) ගල් අඟුරු සැපයීමේ ගිවිසුම
(ඇ) ඉඩම් බදු දීමේ ගිවිසුම
(ඈ) ලං.වි.ම. යෙන් බලශක්තිය මිලදී ගැනීමේ ගිවිසුම

**නල ධනාවි (පුද්.) සමාගම**

එල්. ටී. එල්. ප්‍රොපෙක්ටි (පුද්.) සමාගම මගින් රු. මිලියන 1,594.6 ක මුදලක් ආයෝජනය කර පුත්තලමේ එරුම්බකුඩ්ඩාල් ප්‍රදේශයේ දී මෙගා වොට් 4.8 ක බලාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී ඇත.

**සියරා පවර් (පුද්.) සමාගම**

රු. මිලියන 647.4 ක මුදලක් ආයෝජනය කරමින් වලපන්න කරපලාගම මෙගාවොට් 2.2 ක ක්ෂුද්‍ර ජල විදුලි බලාගාරයක් ස්ථාපනය කිරීමට හා එහි මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සියරා පවර් (පුද්.) සමාගමට අනුමැතිය ලබා දී ඇත.

**කොස්ගුලාන හයිඩ්‍රෝ (පුද්.) සමාගම**

රු. මිලියන 462 ඇස්තමේන්තුගත ආයෝජනයක් සහිතව අයගම කොස්ගුලාන ප්‍රදේශයේ මෙගාවොට් 1.5 ක ක්ෂුද්‍ර ජල විදුලි බලාගාරයක් ස්ථාපනය කිරීමට හා එහි මෙහෙයුම් කටයුතු සිදු කිරීමට කොස්ගුලාන හයිඩ්‍රෝ (පුද්.) සමාගම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමක් අත්සන් කර තිබේ. මෙය ජපාන ශ්‍රී ලංකා හවුල් ව්‍යාපාරික ව්‍යාපෘතියකි.

## වසර තුළ ලැබුණු ප්‍රධාන ආයෝජන යෝජනා

### ත්‍රිකුණාමලයේ පෙට්‍රෝලියම් පිරිපහදුව

තුර්කියේ ඉස්තැන්බුල් නගරයේ සොම් පෙට්‍රෝල් ටිකරට් ඒ. එස්. සමාගම විසින් ඇ. ඩො. බිලියන 1.665 ක තක්සේරු කල ආයෝජනයක් සිදු කරමින් ත්‍රිකුණාමලයේ කප්පල්තුරෙයි ප්‍රදේශයේ දී BOOT පදනමින් පෙට්‍රෝලියම් පිරිපහදුවක් ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඛනිජ සම්පත් අමාත්‍යාංශයේ හා ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය. ඉන්පසුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආයෝජන අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. මෙම ව්‍යාපෘතිය පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදයේ දී ආයෝජනය කිරීමේ විභවය සහිත ආයෝජකයන්ට පිරිනමන ලද ව්‍යුහගත ව්‍යාපෘති වාර්තා සම්බන්ධ කටයුතු ඉදිරියටම ගෙන යෑමේ ප්‍රතිඵලයකි.

### නවීනතම තාක්ෂණ ක්‍රම අනුගමනය කර කොළඹ වරාය සඳහා ආරක්ෂක යටිතල පහසුකම් සැපයීම

දකුණු අප්‍රිකාවේ විෂුවල් ඩිෆෙන්ස් සර්විසස් එස්. ඒ. (පුද්.) සමාගම මගින් ඇ. ඩො. මිලියන 39 ක තක්සේරු කරන ලද ආයෝජනයක් සිදු කිරීම මගින් නවීනතම තාක්ෂණික ක්‍රම අනුගමනය කරමින් කොළඹ වරායට ආරක්ෂිත යටිතල පහසුකම් ලබා දීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මෙම යෝජනාව සඳහා ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.

### හම්බන්තොට ද්‍රව පෙට්‍රෝලියම් වායු ගබඩා පර්යන්තයක් ඉදිකිරීම සඳහා වන ව්‍යපෘතිය

ලාෆ්ස් හෝල්ඩින්ස් ලිමිටඩ් මගින් ඇ. ඩො. මිලියන 13.34 ක තක්සේරු කළ ආයෝජනයක් සිදු කිරීම මගින් හම්බන්තොට වරාය පරිශ්‍රයේ ද්‍රව පෙට්‍රෝලියම් වායු ගබඩා පර්යන්තයක් ඉදිකිරීමට හා එහි මෙහෙයුම් කටයුතු සිදුකිරීමට ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර ඇත. මෙම යෝජනාව සඳහා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

### අධ්‍යාපන අංශය

#### • යුක් ලෑන් ලංකා (පුද්.) සමාගම

යුක් ලෑන් ලංකා (පුද්.) සමාගම වූ කලී ඇ. ඩො. මිලියන 100ක තක්සේරු කරන ලද මුදලක් ආයෝජනය කරමින් මීරිගම ප්‍රදේශයේ සෙන්ට්‍රල් ලැන්කෂයර් විශ්වවිද්‍යාලයේ (UCLAN) සරසවි ශාඛාවක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ අනුමත කරන ලද ප්‍රමුඛ පෙළේ ආයෝජන සමාගමකි.

ශ්‍රී ලංකාව “දැනුමේ කේන්ද්‍රස්ථානය” බවට පත් කිරීමේ දීර්ඝ කාලීන දැක්ම මෙම සරසවිය ස්ථාපනය කිරීම මගින් තවදුරටත් සවිබල ගැන්වේ. 2013 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව අතරතුර බ්‍රිතාන්‍ය විදේශීය ලේකම්වරයා විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය.

#### • රැප්ල්ස් ඇසර්ටිස් (පුද්.) සමාගම

රැපල්ස් ඇසර්ටිස් (පුද්.) සමාගම මගින් ඇ. ඩො. මිලියන 70ක ඇස්තමේන්තු කළ ආයෝජනයක් සිදු කරමින් මීගමුව ප්‍රදේශයේ උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් විය. රැප්ල්ස් ඇසර්ටිස් (පුද්.) සමාගම ආසියා ෆැසිපික් කලාපයේ විශාලතම පෞද්ගලික අධ්‍යාපනික කණ්ඩායම වන සිංගප්පූරුවේ රැෆල්ස් එඩියුකේෂන් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ 100% ක විදේශීය හිමිකමක් සහිත අනුබද්ධ සමාගමකි.

මීගමුව ප්‍රදේශයේ ප්‍රධාන සරසවිය පිහිටුවීමෙන් අනතුරුව, නාගරික සරසවියක් ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ ඔවුහු මේ වන විට නිරතව සිටිති. අති නවීනතම තාක්ෂණික ක්‍රම අනුගමනය කරමින් මීගමුව ප්‍රදේශයේ ස්ථාපනය කිරීමට යෝජිත මෙම විශ්වවිද්‍යාලය මගින් ප්‍රදේශයේ සාමාන්‍ය භූ දර්ශනය පවා වෙනස් වනු ඇත.

#### • රැප්ල්ස් ඇසර්ටිස් (පුද්.) සමාගම

බෞද්ධ අධ්‍යයන (පුද්.) සමාගම වෙනුවෙන් නාගානන්ද ආයතනය විසින් ඇ. ඩො. මිලියන 22.5 ක තක්සේරු කරන ලද මුදලක් ආයෝජනය කරමින් බෞද්ධාගම පිළිබඳව අධ්‍යයනය කිරීමට සහ දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන දේශීය හා විදේශීය ශිෂ්‍යාවන් සඳහා බෞද්ධාගම පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කිරීමට ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර තිබේ. අවශ්‍ය සියළුම අරමුදල් ප්‍රදාන වශයෙන් විදේශීය පරිත්‍යාගශීලීන්ගේන් ලබා ගනු ලැබේ. මෙම ආයතනය කැලණිය මානෙල්වත්ත ආරාමයේ අක්කර 20ක භූමියක ඉදි කිරීමට සැලසුම් කර තිබේ.

මෙම අන්තර්ජාතික බෞද්ධ විශ්වවිද්‍යාලය, බුඩිස්ට් ස්ටඩීස් (පුද්.) සමාගම වෙනුවෙන් කටයුතු කරන නාගානන්ද ආයතනය යටතේ නාගානන්ද අන්තර්ජාතික බෞද්ධ විශ්වවිද්‍යාලය (NIBU) ලෙස නම් කෙරේ.

කැළණිය මානෙල් වත්තේ නාගානන්ද බෞද්ධ විශ්වවිද්‍යාලය ඕස්ට්‍රේලියාවේ පියෝලෑන්ඩ් කොලේජ් ඔෆ් බුඩිසම් හි නිර්මාතෘ වන අති පූජ්‍ය මාස්ටර් වින් කුන්ග් විසින් ආරම්භ කරන ලද අතර බෞද්ධාගමේ ප්‍රගතිය සඳහා ගෝලීය මට්ටමින් දායකත්වය සැපයීමේ ප්‍රමුඛ අරමුණින් පූජ්‍ය ආචාර්ය බෝධගාම චන්දිම නායක හිමියන් විසින් එතුමාව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී.

සපයන ලද තොරතුරු වලට අනුව, මෙම විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමෙන් පසුව ඉහලම අධ්‍යාපන ප්‍රමිති අනුගමනය කිරීමට අපේක්ෂා කරන බව තහවුරු වේ. මෙම විශ්වවිද්‍යාලය මගින් මහායාන, ථේරවාද හා ටිබෙඩ් තන්ත්‍ර සම්ප්‍රදායන් පිළිබඳව සොයාගැනීම් පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට ද කටයුතු කරනු ඇත.

II වන ආංශික කණ්ඩායමේ සමස්ත කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කර ඇත.

| තත්වය | යටිතල පහසුකම් | උපයෝගිතා | ආරම්භය |
|---|---|---|---|
| ව්‍යාපෘති සඳහා ලැබුණු නව අයදුම්පත්‍ර | 48 | 12 | 05 |
| අනුමත කළ ව්‍යාපෘති | 40 | 18 | 04 |
| ගිවිසුම් අත්සන් කරනු ලැබූ ව්‍යාපෘති | 25 | 07 | 02 |
| ක්‍රියාත්මක වීම ඇරඹූ ව්‍යාපෘති | 19 | 08 | 01 |
| වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති | | 15 | 04 |

**II වන ආංශික කණ්ඩායමේ ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර**

**විදේශීය රටවලදී සිදු කරන ලද ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර**

**පෙබරවාරි 24 සිට මාර්තු 02 වෙනිදා දක්වා ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර වෙනුවෙන් ජර්මනියේ සංචාරය කිරීම**

ජර්මානු ව්‍යාපාරික ප්‍රජාවේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන් ඉලක්ක කර ගනිමින් ජර්මනියේ ප්‍රැන්ක්ෆර්ට් නගරයේ සාර්ථක ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවරක නියැලීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකි විය.

මෙම දූත මෙහෙවරේ සුවිශේෂී අවස්ථාව වන්නේ 2013 පෙබරවාරි 25 වන දින ජර්මනියේ ප්‍රැන්ක්ෆර්ට් නගරයේ පැවති ආසියානු පැසිෆික් ව්‍යාපාරික සංසදය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීමයි. ආයෝජන කටයුතු සිදු කිරීමේ විභවයෙන් යුත් ජර්මානු සංගම් සමඟ පෙබරවාරි 25 සහ 26 වන දිනවල ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වනු ලැබීය. ප්‍රැන්ක්ෆර්ට් නගරයේ ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල්වරයාගේ හා ජර්මානු ආසියා පැසිෆික් ව්‍යාපාරික කවයේ සම්බන්ධීකරණ සහාය ලබා ගනිමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම වැඩසටහන් සඳහා සහභාගි විය.

වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යවරයා වන ගරු රිෂාඩ් බදියුදීන් විසින් මෙම සංසදයේ දී ප්‍රධාන දේශනය පවත්වනු ලැබීය. බර්ලින් නුවර ශ්‍රී ලංකා තානාපතිතුමා හා ප්‍රැන්ක්ෆර්ට් නගරයේ කොන්සාල් ජනරාල්වරයා ද මෙම සංසදයේදී සභාව ඇමතූහ. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මගින් මෙහෙයවනු ලැබූ ව්‍යාපාරික දූත පිරිසක් මෙම වැඩසටහනට සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික හා ආයෝජන අවස්ථා පිළිබඳව ජර්මානු ආයෝජකයින් තුළ පැවති ඇතැම් දුර්මත දුරු කිරීම මෙම දූත මෙහෙවරේ අරමුණ විය.

- ශ්‍රී ලංකාව නියෝජිත රටක තත්වයට උසස් කර ඇති අතර 2013 වසර සඳහා තෝරා ගන්නා ලද එකම ආසියානු ජාතිය වූයේ ශ්‍රී ලාංකිකයන්ය. "වියට්නාම්" කණ්ඩායම් සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය.

- ආයෝජනය කිරීමේ විභවයෙන් යුත් ජර්මානු සමාගම් සමඟ හා ස්විස් ඒෂියා වාණිජ මණ්ඩලය හා වෙනත් වාණිජ මණ්ඩල සමඟ ද ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූහ.

- ලංකා වාණිජ මණ්ඩලය නියෝජනය කරමින් සහභාගී වූ ශ්‍රී ලංකා ව්‍යාපාරික දූත පිරිස ආයෝජන ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වන ගරු බුද්ධි අතාවුද මහතා සමඟ සාකච්ඡාවක් පැවැත්වූහ.

- නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපති තුමා හා ජර්මනියේ (Rheinlad – Pfals) ශ්‍රී ලංකා කොන්සාල් ජනරාල්වරයා වන නිහාල් සමරසිංහ මහතා විසින් සංවිධානය කරන ලද ප්‍රැන්ක්ෆර්ට් හි පැවැත් වූ විදේශීය දූත මණ්ඩල කව අතර අන්තර් සම්බන්ධතා ඇති කිරීමේ සැසි සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය.

මෙම දූත මෙහෙවරේ ප්‍රතිඵලයක් ලෙස ජර්මානු ආසියා පැසිෆික් කවයේ දූත පිරිසක් 2014 වසරේදී ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම නියමිතව ඇත. 2013 වසරේ නොවැම්බර් මාසයේ පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය සඳහා ජර්මානු / ස්විස් ආයෝජකයන් කිහිප දෙනෙකු සහභාගී වූ අතර නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපතිවරයාගේ මඟ පෙන්වීම යටතේ 2013 සැප්තැම්බර් 03 වනදා සිට 08 වනදා දක්වා කාලය තුළ නෙදර්ලන්තයේ දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.
යුරෝපයේ ආයෝජන ප්‍රවර්ධන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන අධ්‍යක්ෂිකා (ප්‍රවර්ධන), නිලුපුල් ද සිල්වා මෙනවිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් මෙම දූත මෙහෙවරට සහභාගී වූවාය.

**ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර සඳහා 2013 මාර්තු 27 සිට 31 වනදා දක්වා චෙක් ජනරජයේ සංචාරය කිරීම**

චෙක් ජනරජයේ කර්මාන්ත සහ වෙළඳ අමාත්‍යවරයා වන ගරු මාර්ටින් කියුබා මහතාගේ ආරාධනයක් මත, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ 2013 මාර්තු 22 සිට 31 දක්වා කාලය තුළ චෙක් ජනරජයේ සංචාරය කළේය. ප්‍රමුඛ පෙළේ දේශීය සමාගම් (අපනයනකරුවන් / සංචාරක ව්‍යාපාරය) සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන අධිකාරිය හා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) යන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) නිලුපුල් ද සිල්වා මෙනවිය ද සමඟ ශ්‍රී ලංකාවේ පාරිසරික හා සුනිත්‍ය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා ද මෙම සංචාරයට සහභාගී විය. වැදගත් ක්ෂේත්‍රවල ආර්ථික හා දේශපාලන බැඳීම් මෙන්ම සංස්කෘතික සම්බන්ධතා සහ සහයෝගීතාව වඩාත් ශක්තිමත් කිරීම මෙම සංචාරයේ අරමුණ විය. ශ්‍රී ලංකාව තුළ ආයෝජන කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් චෙක් ජනරජයේ සුවිශාල විභවය පිළිබඳව මෙම සංචාරයේදී විශේෂ අවධානය යොමු කරනු ලැබීය.

● චෙක් ජනරජයේ කාර්මික සංවිධානය මගින් සංවිධානය කරන ලද ප්‍රථම ශ්‍රී ලංකා - ආර්ථික සංසදයේ සමාරම්භක උත්සවයේ දී දෙරටේම ඇමතිවරු එම සංසදය ඇමතූහ. චෙක් ජනරජය නියෝජනය කරමින් පුද්ගලයන් 60 දෙනෙකු හා ශ්‍රී ලාංකික සමාගම් 30ක් ද මෙම සංසදයට සහභාගී වූහ.

● රටවල් දෙක අතර වෙළඳ හා ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීමේ අනාගත අපේක්ෂාවන් පිළිබඳව හා ආර්ථිකයේ වැදගත් අංශවල හවුල් සමායෝජන කටයුතු සිදු කිරීම පිළිබඳව දෙරටේම අමාත්‍යවරුන්ගේ අවධානය යොමු විය. චෙක් ජනරජයට ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර කිහිපයක ආයෝජනය කිරීම සඳහා ඉතා විශාල විභවයක් පවතින බව මෙහිදී විශේෂයෙන් අවධාරණය කරනු ලැබීය. එම ක්ෂේත්‍ර වන්නේ,

- යටිතල පහසුකම්
- බල ශක්තිය
- ජලය හා පාරිසරික සුරක්ෂිතතාව
- ආහාර පිරි සැකසුම් කිරීම
- සීනි කර්මාන්තය
- විවේකය / විනෝද කටයුතු හා ආගන්තුක සත්කාරය
- උසස් අධ්‍යාපනය

"ඔබගේ ඊළඟ ආයෝජන ගමනාන්තය වන ශ්‍රී ලංකාව" යන මැයෙන් මෙම ආර්ථික සංසදයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඉදිරිපත් කිරීමක් සිදු කිරීමෙන් අනතුරුව ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වනු ලැබීය.

මෙම ද්විපාර්ශ්වික සාකච්ඡාවල දී, ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන ආයෝජකයින්ගෙන් මෙරට ආයෝජනය කිරීම සම්බන්ධයෙන් ප්‍රබල ඉල්ලීම් ඉදිරිපත් විය. චෙක් ජනරජයේ සමාගම් හඳුනාගත් ක්ෂේත්‍රවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් බලවත් උනන්දුවක් දැක්වූ අතර පවතින ව්‍යාපෘති (ව්‍යුහගත ව්‍යාපෘති) පිළිබඳව විශේෂ තොරතුරු තවදුරටත් ඉල්ලා සිටියහ. මෙම සංචාරය මගින් ශ්‍රී ලංකාවෙ හා චෙක් ජනරජය අතර පවතින සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමට හැකි විය.

ගරු අමාත්‍යවරයාගේ සංචාරය සම්බන්ධයෙන් විශේෂයෙන්ම චෙක් ජනරජයේ මාධ්‍යවලින් ද දේශීය සහ අන්තර්ජාතික වශයෙන් ද ඉහළ ප්‍රතිචාරයක් ලැබී තිබුණි. අදාළ රජයේ නියෝජිතයන් හා පුද්ගලික අංශයේ ප්‍රධාන පෙළේ සමාගම්වල ඒකාබද්ධ ප්‍රයත්නයක් ලෙස ශ්‍රී ලංකාව සහ චෙක් ජනරජය අතර ක්‍රියාත්මක වූ මෙම සංචාරය වෙළඳ, ආයෝජන හා සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සම්බන්ධ ප්‍රධාන සමාරම්භක පියවරක් ලෙස ඉතා ඵලදායක අන්දමින් ක්‍රියාත්මක වී ශ්‍රී ලංකාවට ඉතා සාර්ථක ප්‍රතිඵල ලබා දෙමින් නිමාවට පත් විය.

**2013 ජුනි මාසයේ දී ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර සඳහා චීනයේ සංචාරයක නිරත වීම**

- යුන්නන් කලාපීය රජය විසින් කුන්මින් හි ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට පූර්ණ අනුග්‍රාහකත්වය ලබා දෙන ලද අතර කුන්මින් හි ව්‍යාපාරික සංසදයක් සංවිධානය කිරීමට ද අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබීය. යුන්නන් කලාපීය රජය විසින් ද්විපාර්ශ්වික රැස්වීම් සංවිධානය කරනු ලැබීය.

- ශ්‍රී ලංකාවේ පැවති සිවිල් අර්බුදය නිමාවීමෙන් පසුව ආකර්ෂණීය ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ගොඩනැංවීමේ අරමුණින් යුන්නන් කලාපයේ සිටින චීන ව්‍යාපාරික ප්‍රජාවේ හඳුනාගත් නියෝජිතයන් පිරිසක් දැනුවත් කිරීමේ අවස්ථාව මෙන්ම ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් ඔවුන් සමඟ සමීප සම්බන්ධතා ගොඩ නඟා ගැනීමේ අවස්ථාව ද කුන්මින් හි පැවැති ඉහත වැඩසටහන මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලැබිණි.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, කුන්මින් ෂින්සි සමූහ ආයතනයේ (ප්‍රමුඛ පෙළේ චීන පොත් ගබඩාවේ) නියෝජිතයින් පිරිසක් 2013 අගෝස්තු මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර චීන භාෂාව, සංස්කෘතිය සහ සම්ප්‍රදායන් ප්‍රවර්ධනය කිරීම සඳහා චීන සහ ඉංග්‍රීසි පොත් බෙදාහැරීමේ ස්ථානයක් ද ඔවුන් විසින් මේ වන විට ස්ථාපනය කර තිබේ.

පොදු රාජ්‍ය මණ්ඩලීය සංසදය අතරතුර පැවති "ශ්‍රී ලංකාවේ ආයෝජන ශක්‍යතාව පිළිබිඹු කිරීමේ" ප්‍රදර්ශනය නැරඹීම සඳහා යුන්නන් චුං චිං බයලොපිල් ඉංජිනියරින් සමාගමේ දූත පිරිස් පැමිණියහ. යුන්නන් සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානයේ හා යුන්නන් කලාපයේ මහජන රජය තොරතුරු පරීක්ෂා කිරීමේ සංචාරයක් සඳහා නොවැම්බර් 27 වනදා සිට 28 වනදා දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණියහ.

**ආයෝජන ප්‍රවර්ධන මෙහෙවර සඳහා ජපානයට සංචාරය කිරීම**

2013 මාර්තු මාසයේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජපාන නිල සංචාරය අතරතුරදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජන සංසද දෙකකට සහභාගී විය. ජපාන විදේශීය වෙළඳ නියෝජිත කාර්යාලය (JETRO) හා ජපාන වාණිජ කර්මාන්ත මණ්ඩලය (JCCI) මගින් මෙම සංසද සංවිධානය කරනු ලැබීය. එම සංසදවලට පසුව එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) මගින් සම්බන්ධීකරණ කරනු ලැබූ ද්විපාර්ශ්වික සාකච්ඡා ද පවත්වනු ලැබීය.

මෙම දූත මෙහෙවරේ ප්‍රතිඵල ලෙස

2013 දෙසැම්බර් 09 වනදා "කුමෝන් ඒෂියා ඕෂනියා (පුද්.) සමාගමේ" කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය.

2013 අප්‍රේල් 19 වනදා ACM සමාගමේ නියෝජිතයන් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. ඔවුහු හෝටලයක් ඉදිකිරීම පිළිබඳව උනන්දුවක් දක්වති.

රෙයිකෝ අසවාන් මෙනවිය සීගිරිය ප්‍රදේශයේ හෝටලයක් ඉදිකිරීමට අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබුවාය.

2013 මැයි මාසයේදී "ඉටොචු සමාගමේ" දූත පිරිසක් කෙසෙල් වගාව පිළිබඳ පර්යේෂණයක් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

2013 මැයි මාසයේ මරුබෙනි සමාගම බලශක්ති සහ ජන ව්‍යාපෘති පිළිබඳ පර්යේෂණයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ. 2013 ජුනි මාසයේදී සුමිටුමෝ සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීහු මුණ ගැසුණහ.

ෂිවාන් ද සිල්වා මහතා, විධායක අධ්‍යක්ෂ (ප්‍රවර්ධන සහ අති විශාල ව්‍යාපෘති) සහ ධම්මික බස්නායක මහතා, සහකාර අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ ජපානයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ශාඛා කාර්යාලය භාර නිලධාරී මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කළහ.

ආර්ථික සංවර්ධන අමාත්‍ය, ගරු බැසිල් රාජපක්ෂ මහතාගේ ජපාන සංචාරය අතරතුර පැවති ආයෝජන සංසදයකට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ද සහභාගී විය. මෙම සංසදය JETRO හා ටෝකියෝ නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සංවිධානය කරන ලදී.

මෙම සංසදයෙන් පසු JETRO හා ටෝකියෝ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලැබූ ද්විපාර්ශ්වික සාකච්ඡා ද පවත්වනු ලැබීය. රන්ජන් ලිබේරා මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන) මෙම සංසදයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කළේය.

JETRO මගින් සංවිධානය කළ මෙම දූත මෙහෙවරේ ප්‍රතිඵලයක් ලෙස ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා සමඟ තවදුරටත් සාකච්ඡා පැවැත්වීම සඳහා දූත පිරිසක් 2013 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

**ආයෝජන සහ ප්‍රවර්ධන මෙහෙවර සඳහා කොරියාවට සංචාරය කිරීම**

"කොරියා ඕවර්සීස් ට්‍රේඩ් ඒජන්සි" (KOTRA) මගින් සංවිධානය කරනු ලැබූ කොරියා විදේශීය ආයෝජන ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය. ඉන් පසු KOTRA හා කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් සංවිධානය කරන ලද ද්වි පාර්ශ්වික සාකච්ඡා ද පවත්වනු ලැබීය.

මෙම දූත මෙහෙවරේ ප්‍රතිඵල ලෙස

මෙගා වොට් 500 ක ගල් අඟුරු බලාගාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා හුන්ඩායි ඇම්කෝ සමාගම 2013 ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලැබීය.

විභේදනය කරන ලද නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය නිවාස පහසුකම් සැපයීමේ ගිවිසුම යටතේ KOLON සමාගම 2013 ජූනි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය. ශිවාන් ද සිල්වා, විධායක අධ්‍යක්ෂ (ප්‍රවර්ධන සහ මහා පරිමාණ ව්‍යාපෘති) සහ කුමාරණතුංග, අධ්‍යක්ෂ (ආයෝජන) මෙහිදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කළහ.

**2013 ශ්‍රී ලංකාවට පැමිණි දූත පිරිස්**

| රට | දූත පිරිස | දින | විශේෂ කරුණු | උනන්දුවක් දක්වන ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| **ජර්මනිය** | 6 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | පෙබරවාරි 5 වනදා | කොළඹ ජර්මානු තානාපති කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබීය. | නිෂ්පාදන |
| **එස්ටෝනියාව** | එස්ටෝනියාවේ වාණිජ හා කාර්මික මණ්ඩලයේ 12 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | පෙබරවාරි 14 වනදා | යුරෝපීය වාණිජ මණ්ඩලය විසින් සමායෝජනය කරනු ලැබීය. | නිෂ්පාදන, ගබඩාකරණය, සැපයුම්, තොරතුරු තාක්ෂණය සහ විදුලි සන්දේශනය |
| **බෙල්ජියම** | ෆ්ලැන්ඩර්ස් ට්‍රේඩර් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් සමාගමේ 12 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | 2013 මැයි 29 වනදා | යුරෝපීය වාණිජ මණ්ඩලය විසින් සමායෝජනය කරනු ලැබීය. | යටිතල පහසුකම්, නිෂ්පාදන, සංචාරක කර්මාන්තය හා අධ්‍යාපනය |
| **නෙදර්ලන්තය** | 13 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | සැප්තැම්බර් 3-8 දක්වා | හේග් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබීය. | කෘෂිකර්මාන්තය, කිරි නිෂ්පාදන සංවර්ධනය, ස්වර්ණාභරණ නිෂ්පාදනය, විදුලි බල හා බල ශක්තිය |
| **ප්‍රංශය** | 8 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | සැප්තැම්බර් 11 වනදා | ශ්‍රී ලංකාවේ ප්‍රංශ වෙළඳ කොමිසම මගින් සංවිධානය කරනු ලැබීය. | යටිතල පහසුකම්, සංවර්ධනය, රාජ්‍ය සහ පෞද්ගලික හවුල |
| **ස්විට්සර්ලන්තය** | ස්විට්සර්ලන්ඩ් ග්ලෝබල් එන්ටර්ප්‍රයිසස් මගින් සාමාජිකයින් 4 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | ඔක්තෝබර් 3 සහ 4 වනදා | ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය මගින් සංවිධානය කරන ලදී. | නිෂ්පාදන හා ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳ සාමාන්‍ය තොරතුරු |

| රට | දූත පිරිස | දින | විශේෂ කරුණු | උනන්දුවක් දක්වන ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| ජපානය | ඇල්බියන් කම්පැණි ලිමිටඩ් ආයතනයේ කණ්ඩායමක් | පෙබරවාරි 5 සිට 7 දක්වා | ගරු මැදගම ගමගේ සුනිල්, ජපානයේ සිටින ශ්‍රී ලංකා කොන්සාල්වරයා විසින් සංවිධානය කරන ලදී. | සුවඳ විලවුන් නිෂ්පාදන සහ අදාළ පර්යේෂණ |
| | මිට්ෂුබිෂි කෝපරේෂන් හි කණ්ඩායමක් | ජූනි මාසය | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සංවිධානය කරන ලද පසුගිය දූත මෙහෙවර පිළිබඳව පසු විපරම් කිරීමේ සංචාරය | යටිතල පහසුකම් සහ බන්කර් සැදීමේ සේවා |
| | රෝහ්ටො කම්පැණි ලිමිටඩ් ආයතනයේ කණ්ඩායමක් | ජූලි 16 සිට 18 දක්වා | - එම - | ඖෂධ සම්බන්ධ නිෂ්පාදන |
| | මිට්සුයි ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් හි දූත පිරිසක් | ජූලි 23 සිට 24 දක්වා | - එම - | යටිතල පහසුකම් උනන්දුවක් දක්වන ක්ෂේත්‍රය |
| | සුමිටොමෝ කෝපරේෂන් හි දූ පිරිස | අගෝස්තු | - එම - | යටිතල පහසුකම්, සුනිත්‍ය බල ශක්තිය |
| | ප්‍රමුඛ පෙළේ ජපාන සමාගම් සහ කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර නියෝජනය කරමින් සාමාජිකයින් 31 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | ඔක්තෝබර් 14 සිට 17 දක්වා | ජපාන විදේශ වෙළඳ සංවිධානය (JETRO) විසින් සංවිධානය කරන ලදී. | යටිතල පහසුකම්, ඉලෙක්ට්‍රොනික අයිතම, ස්වයංක්‍රීය කොටස්, සුවඳ විලවුන් වර්ග, ඖෂධ සම්බන්ධ නිෂ්පාදන, ආහාර පිරි සැකසුම් කිරීම සහ සංචාරක කර්මාන්තය |
| චීනය | පවර් චයිනා ආයතනයෙන් දූත පිරිසක් | ජනවාරි 30 වනදා | විධායක අධ්‍යක්ෂ (ප්‍රවර්ධන හා අතිවිශාල ව්‍යාපෘති) සමඟ හේලීස් පීඑල්සී හි මර්වින් ද සිල්වා මහතා හමුවක් සංවිධානය කරනු ලැබීය. | ශ්‍රී ලංකාවේ මෙගා වොට් 100 විදුලි බලාගාරයක් ස්ථාපනය කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමට සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ව්‍යාපෘති හා දේපළ සංවර්ධනය පිළිබඳව උනන්දුවක් දක්වයි. |
| | චීන සංවර්ධන බැංකු සමාගම මගින් කැඳවාගෙන ආ දූත පිරිස | මාර්තු 06 වනදා | විධායක අධ්‍යක්ෂ (ප්‍රවර්ධන හා අතිවිශාල ව්‍යාපෘති) හමුවිය | |
| | වුහාන් හුන්ගායි ටෙක්නොලොජි කොම්පැණි ලිමිටඩ් හි සභාපතිවරයා වන ශෞහොන්ග් මහතා විසින් මඟ පෙන්වනු ලැබූ දූත පිරිස | මාර්තු 06 වනදා | චීන සංවර්ධන බැංකු සමාගම මගින් කැඳවාගෙන ආ දූත පිරිස | වායු සමීකරණ නිෂ්පාදනය හා දේපළ සංවර්ධනය |

| රට | දූත පිරිස | දින | විශේෂ කරුණු | උනන්දුවක් දක්වන ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| චීනය | හයිනන් ප්‍රොවින්ෂල් බියුරෝ ඔෆ් ජියොලොජි දූත පිරිස | මාර්තු 19 සිට 20 දක්වා | විධායක අධ්‍යක්ෂ (ආයෝජන), ජී. රාජපක්ෂ මහත්මිය හමුවිය. එමෙන්ම, GSMB හා ලංකා මිනරල් සෑන්ඩ්ස් (පුද්.) සමාගම සමඟ ද රැස්වීමක් පවත්වනු ලැබීය. | ශ්‍රී ලංකාවේ ඛනිජ වැලිවල විභවය පිළිබඳව ගවේෂණය කිරීම |
| | හෙනන් පළාතේ දූත පිරිස | අප්‍රේල් 03 වනදා | ධම්මික බෝපිටිය (විදේශීය මෙහෙයුම් ප්‍රධානි, ෂැන්ග්කුයු ආර්ථික සංවර්ධන කලාපය) විසින් කැඳවා ගෙන එනු ලැබීය. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා හමුවිය. | ගුවන්තොටුපොළක් සංවර්ධනය කිරීමට, වානේ කර්මාන්ත ශාලාවක්, මිශ්‍ර වානේ, වානේ තැටි, මිණුම් උපකරණ, බැටරි මගින් ක්‍රියාත්මක වන සයිකල්, කන්ටේනර් සැකසීම, සංචාරක කර්මානත්ය, සුඛෝපභෝගී බද්ධ නිවාස / නගර සංවර්ධනය පිළිබඳව උනන්දුවක් දක්වයි. |
| | හොන්ඩා ග්ලෝබල් ඉන්ජිනියරින් සමාගමේ දූත පිරිස | අප්‍රේල් 05 වනදා | මෙම දූත පිරිස ඉදිකිරීම් කර්මාන්තයේ කුසලතා සංවර්ධනය හා පුහුණුව සඳහා විධායක අධ්‍යක්ෂ (ප්‍රවර්ධන හා අතිවිශාල ව්‍යාපෘති) කටුනායක නිදහස් වෙළඳ කලාපයේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු සමාග මක ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවිය. | දේපළ සංවර්ධනය, සංචාරක කර්මාන්තය, ගොල්ෆ් ක්‍රීඩාංගන ආදිය |
| | චීන ජාතික ඇඟලුම් සංගමයේ (CNGA) සාමාජිකයින් 15 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිස | මැයි 05 සිට 09 වනදා දක්වා | බීජිං නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සංවිධානය කරන ලදී. | ඇඟලුම් කර්මාන්තය |
| | චීන ජාතික ඇඟලුම් සංගමයේ (CNGA) දූත පිරිස | මැයි 07 වනදා | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, JAAF | ඇඟලුම් කර්මාන්තය |
| | රාජ්‍ය සමාගම් සඳහා වන චීන සංගමයේ දූත පිරිස | මැයි 22 වනදා | බීජිං නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබීය. | |

| රට | දූත පිරිස | දින | විශේෂ කරුණු | උනන්දුවක් දක්වන ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| | "ගුඩ් ආර්ක් ඉලෙක්ට්‍රොනික්ස්" හි එන්.බී.වූ. සුෂව් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසක් | මැයි 30 වනදා | මෙම සංගමය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සංවර්ධන මණ්ඩලයේ හා JAAF හි ජ්‍යෙෂ්ඨ නිලධාරීහු හමුවූහ. | ඇඟලුම් අංශයේ හා හවුල් ව්‍යාපාරවල අයෝජනය අපේක්ෂා පිළිබඳ සාකච්ඡා කිරීමට |
| | රාජ්‍ය සමාගම් සඳහා වන චීන සංගමයේ දූත පිරිසක් | මැයි 22 වනදා | කොළඹ කොටස් හුවමාරුවේ නිලධාරීන් සමඟ ද හමුවක් සූදානම කරනු ලැබීය. | කොටස් සමගාම්වල ආයෝජනය කිරීම |
| | "ගුඩ් ආර්ක් ඉලෙක්ට්‍රොනික්ස්" හි එන්.බී.වූ. සුෂව් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසක් | මැයි 22 වනදා | කොළඹ කොටස් හුවමාරුවේ නිලධාරීන් සමඟ ද හමුවක් සූදානම කරනු ලැබීය. | කොටස් සමගාම්වල ආයෝජනය කිරීම |
| | දකුණු කාර්මික උයන අන්හුයි පළාතේ වූහු නගරයේ අන්හුයි ෂොන්ග්ලින් එලිවේටර් කම්පැනි ලිමිටඩ් හි නිලධාරීහු | ජූලි මාසය | ශ්‍රී ලංකා චීන තානාපති කාර්යාලය මගින් සංවිධානය කරන ලද හමුව. | අපනයන වෙළඳපොළ සඳහා කාර්මික ආරෝහක නිෂ්පාදනය කිරීම. |
| | චීන යුන්නන් කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරින් ගෲප් කම්පැනි ලිමිටඩ් හි ආයතනයේ දූත පිරිසක් | ජූලි 30 වනදා | ස්ටෙෆනි ආන්ග් මෙනවිය විසින් මෙම දූත පිරිස කැටුව ආවාය. | ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති කාර්යාලයක් ස්ථාපනය කිරීමට |
| | "ටිඅන්ජින් සබ් කවුන්සිල්", චීනයේ අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා වන කවුන්සලයේ දූත පිරිසක් | ඔක්තෝබර් 8 වනදා | පාලිතගේ සිංහලගේ මහතා විසින් තනි පුද්ගල සම්බන්ධතාවක් ලෙස සංවිධානය කරනු ලැබීය. | ශ්‍රී ලංකාවේ ආයෝජන පරිසරය හා විදේශීය වෙළඳපොළ පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට |
| | යුන්නන් සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ දූත පිරිසක් කැටුව ආහ. | ඔක්තෝබර් 24 වනදා | කොළඹ යුන්නන් වෙළඳ නියෝජිතයන්ගේ කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබීය | ඉදිකිරීම්, හෝටල්, වෙළඳාම, ධීවර කර්මාන්තය, කැණීම් හා රබර් නිෂ්පාදන |
| | "සව්ෂාන් ටින්ග් යූ ඇක්කවාටික් ප්‍රොඩක්ට් කම්පැනි ලිමිටඩ්" ආයතනයේ දූත පිරිසක් | නොවැම්බර් 18 - 19 වනදා දක්වා | NAQDA සභාපතිවරයා සමඟ තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා කර්මාන්තශාලා සංචාරයක් හා රෑ ස්වීමක් සූදානම් කරනු ලැබීය. | ඉස්සන් බෝ කිරීම / කූණිස්සන් බෝ කිරීම, ආහාර නිෂ්පාදනය ආදිය |

**විශේෂ ප්‍රවර්ධන අවස්ථා**

● පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය

II වන ආංශික කණ්ඩායම 2013 නොවැම්බර් 12 සිට 14 දක්වා පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය සංවිධානය කිරීම සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබා දෙනු ලැබූ අතර 2013 නොවැම්බර් 15 සිට 17 දක්වා ශ්‍රී ලංකාවේ පැවති 23 වන පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව (CHOGM) හා සම්බන්ධ වන පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසද සංවිධාන කමිටුවේ ප්‍රධාන සාමාජිකයකු ද විය.

පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය වූ කලී පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල් අතර සංවිධානය කරනු ලබන පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් සහ අයත් නොවන රටවල රාජ්‍ය නායකයන්, අමාත්‍යවරුන් සහ ඉහළ පෙළේ ව්‍යාපාරික නායකයන් මුණ ගැසෙන ප්‍රමුඛතම ව්‍යාපාරික හමුවයි. මෙම ව්‍යාපාරික සංසදය පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික කවුන්සලයේ (CBC) හා ශ්‍රී ලංකා රජයේ සමායෝජනය මත සංවිධානය කරනු ලැබූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙහිදී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ලැබීය. ශ්‍රී ලංකා ජනාධිපතිවරයා වන අතිගරු මහින්ද රාජපක්ෂ විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය නිල වශයෙන් විවෘත කරනු ලැබීය. සභාවේ රැස්ව සිටි පිළිගත් කථිකයන් කිහිප දෙනෙකු විසින් විවිධ ව්‍යාපාරික මනාපයන් එකම ස්ථානයකට රැස් කරමින් සභාව ඇමතූහ.

ආයෝජන හැකියාව සහිත ආයෝජකයන්ට ආයෝජන මණ්ඩල නිලධාරීන් සමඟ ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා පිළිබඳ ව සාකච්ඡා කිරීමට ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය පැවැත්වූ අතර එහිදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් "ශ්‍රී ලංකා ආයෝජන මධ්‍යස්ථානයේ ආයෝජනය කරන්න" යන මැයෙන් විශාල ආකර්ෂණීය පැවිලියමක් පවත්වාගෙන යමින් ශ්‍රී ලංකාව ආයෝජන ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපාරික සංසදය අද්විතීය අවස්ථාවක් බවට පරිවර්තනය කර ගන්නා ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය පැවති කාලය තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා රේඛීය නියෝජිත ආයතනවල සහාය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් රාජ්‍ය අංශයේ ව්‍යුහගත ව්‍යාපෘති 50 ක් සකස් කරනු ලැබීය.

● ශ්‍රී ලංකාවේ ආයෝජන ශක්‍යතාව පිළිබිඹු කිරීම සහ වෙළඳ ප්‍රදර්ශනය

පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදයට සමගාමීව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය සම සංවිධායකයන් වශයෙන් ශ්‍රී ලංකා අපනයන මණ්ඩලය (EDB) සමග එක්ව සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ අතිශයින්ම වාසිදායක ආයෝජන අවස්ථා" යන තේමාවෙන් පැවැත්වූ වෙළඳ ප්‍රදර්ශනය අතරතුර ගැණුම්කරුවන් සහ අලෙවිකරුවන් අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගීම සඳහා පැවැත්වූ සැසියට විශේෂ සහාය ලබා දීමේ අරමුණින් II වන ආංශික කණ්ඩායම මෙම වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී විය.

● ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) එකම වහලක් යටින් සියලු සේවා ලබාගත හැකි මධ්‍යස්ථානය

පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය අතරතුර ආයෝජනය කිරීමේ හැකියාව සහිත ආයෝජකයන්ට සහාය ලබා දීමේ අරමුණින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) මගින් ස්ථාපනය කරන ලද එකම වහලක් යටින් සියලු සේවා ලබාගත හැකි මධ්‍යස්ථානයට ද රජයේ නියෝජිත ආයතන 30ක් සමඟ II වන ආංශික කණ්ඩායම සහභාගි විය.

## III වන ආංශික කණ්ඩායම

අපනයන වෙළඳපොළ හා දේශීය වෙළඳපොළ සඳහා සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන සැකසීම පිළිබඳ යෝජනා මෙන්ම අපනයන වෙළඳපොළ සේවා සැපයීම ද අන්තරාල වෙළඳපොළ සේවා සැපයීම ද සම්බන්ධ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳ ව 2013 වසර තුළ දී සලකා බලනු ලැබීය. ආයෝජන පාදක කර ගනිමින් හා පහත දක්වා ඇති නීති / රෙගුලාසිවල සඳහන් කර ඇති වෙනත් මෙහෙයුම් නිර්ණායක පාදක කර ගනිමින් නව්‍ය ව්‍යාපෘති හා දැනට පවතින ව්‍යාපෘති පුළුල් කිරීම් සඳහා ද අනුමැතිය ලබා දෙනු ලැබීය.

i. දේශීය ආදායම් පනත
ii. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත
iii. ක්‍රියාකාරී මධ්‍යස්ථාන මෙහෙයුම්වලට අදාළ වන මූල්‍ය පනත

ඒ අනුව අවම වශයෙන් රු. මිලියන 50ක ආයෝජන සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳව සලකා බලනු ලැබීය.

**සමස්ත කාර්යසාධනය**
**3 වන ආංශික කණ්ඩායමේ ක්‍රියාත්මක කිරීමේ අදියර**

| කාර්ය තත්ත්වය | ඇගලුම් | ප්‍රාදේශීය හා සේවා | නිෂ්පාදන | අංශයේ මුළු ගණන | ශ්‍රී. ල. ආ. ම. මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | අංශයේ කාර්ය තත්වය |
|---|---|---|---|---|---|---|
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | 2 | 5 | 20 | 27 | 46 | 59% |
| අනුමත කර ගිවිසුම් අත්සන් කිරීමට නියමිත ව්‍යාපෘති | 2 | | 8 | 10 | 81 | 12% |
| ගිවිසුම් අත්සන් කරනු ලැබූ ව්‍යාපෘති | 9 | 13 | 28 | 50 | 125 | 40% |
| වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති | 6 | 37 | 28 | 71 | 250 | 28% |
| වාණිජ මෙහෙයුම් සිදු වන ව්‍යාපෘති | 430 * | 215 | 383 | 1028 * | 1736 * | 59% |
| එකතුව | **449** | **270** | **467** | **1186** | **2238** | **53% **** |

* ඇගළුම් කම්හල් 200 යටතේ මෙහෙයවනු ලබන ව්‍යාපෘති 135 ක් ඇතුළත්ව

** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 53% (ව්‍යාපෘති 1186) ක් සඳහා 3වන ආංශික කණ්ඩායම මගින් දායකත්වය සපයයි.

**මුළු අපනයන (ඇ. ඩො. මි. වලින්)**

| වර්ෂය | ජාතික | | ශ්‍රී.ලං.ආ.ම. වටිනාකම | ජාතික වටිනාකම ප්‍රතිශතයක් ලෙස ශ්‍රී. ලං. ආ. ම. % | ජාතික වටිනාකමින් (කාර්මික) ප්‍රතිශතයක් ලෙස ශ්‍රී. ලං. ආ. ම. |
|---|---|---|---|---|---|
| | මුළු වටිනාකම | කාර්මික වටිනාකම | | | |
| 2001 | 4,817 | 3,712 | 3,083 | 64% | 83% |
| 2002 | 4,699 | 3,634 | 3,123 | 66% | 86% |
| 2003 | 5,133 | 3,977 | 3,492 | 68% | 88% |
| 2004 | 5,757 | 4,518 | 3,858 | 67% | 85% |
| 2005 | 6,347 | 4,952 | 4,355 | 69% | 88% |
| 2006 | 6,883 | 5,385 | 4,699 | 68% | 87% |
| 2007 | 7,640 | 5,967 | 5,170 | 68% | 87% |
| 2008 | 8,111 | 6,159 | 5,330 | 66% | 87% |
| 2009 | 7,085 | 5,305 | 4,563 | 64% | 86% |
| 2010 | 8,570 | 6,154 | 5,175 | 60% | 84% |
| 2011 | 10,559 | 7,992 | 6,572 | 62% | 82% |
| 2012 | 9,774 | 7,371 | 6,125 | 63% | 83% |
| 2013 | 10.394 | 7,749 | 6,606 | 64% | 85% |

**විදේශීය සෘජු ආයොජන (FDI) සඳහා ආංශික දායකත්වය (ඇ. ඩො. මි. වලින්)**

| | ඇඟලුම් | ප්‍රාදේශීය හා සේවා | නිෂ්පාදන | අංශයේ එකතුව | ශ්‍රී.ලං.ආ.ම. යේ මුළු වි.සෘ.ආ. ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| වි. සෘ. ආ. (FDI) | 116.577 | 44.866 | 190.084 | 1.391 | 351.527 |

**අංශයේ රැකියා උත්පාදනය (තාවකාලික)**

| | ඇඟලුම් | ප්‍රාදේශීය හා සේවා | නිෂ්පාදන | අංශයේ එකතුව |
|---|---|---|---|---|
| රැකියා | 3,529 | 77 | 996 | 4,602 |

## අංශය මත පදනම් වූ කාර්යසාධනය

### ඇඟලුම් අංශය

2013 දෙසැම්බර් මාසය අවසානයේදී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 430 ක් පමණ විය. 2013 දෙසැම්බර් 31 වන විට අංශයේ මුළු රැකියා උත්පාදනය දළ වශයෙන් 284,258 ක් විය. දිවයිනේ ප්‍රධානඅපනයන ආදායම් උපයනු ලැබුවේ ඇඟලුම් අංශයෙනි. 2013 වර්ෂය සඳහා මුළු ජාතික අපනයනවලින් හා 42.4% ක් හා මුළු කාර්මික අපනයනවලින් 38% ක් වූ ඇඟලුම් අපනයන ආදායම ඇ. ඩො. බිලියන 4.5 ක් විය. වසරින් වසර පදනම මත අපනයන වර්ධනය 11.5% ක් විය.

### 2013 වර්ෂයේ කාර්යසාධනය

2013 වර්ෂය අවසානයේ දී ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘති අයදුම්පත්‍රවල කාර්ය තත්වය පහත දක්වා ඇත.

| මෙහෙයුම් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන (රු. මිලියන වලින්) | | | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|
| | | විදේශ | දේශීය | එකතුව | |
| වාණිජ මෙහෙයුම් සිදුවන ව්‍යාපෘති | 5 | 699.29 | 421.221 | 1120.506 | 1599 |
| වාණිජ මෙහෙයුම් සිදු කිරීමට  අපේක්ෂිත ව්‍යාපෘති | 1 | 264.67 | - | 264.670 | 723 |
| ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 4 | 2135.21 | 395.158 | 2530.370 | 1044 |
| ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 2 | 68.34 | 111.350 | 179.691 | 224 |
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | 2 | 63.44 | 1595.077 | 1658.521 | 678 |
| **එකතුව** | **14** | **3230.952** | **2522.806** | **5753.758** | **4268** |

### උතුරු හා නැගෙනහිර පළාත්වලට ව්‍යාපෘති පුළුල් කිරීම්

"නැගෙනහිර නවෝදය" හා "උතුරු වසන්තය" වැඩසටහන් යටතේ උතුරු හා නැගෙනහිර පළාත්වල ආයෝජන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පියවර ගෙන තිබේ. 2011/2012 වසර වලදී අතිරේක ගිවිසුම් අත්සන් කරනු ලැබූ ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| සමාගමේ නම | තක්සේරු කළ ආයෝජනය (ඇ. ඩො.මි. වලින්) | තථ්‍ය සේවා නියුක්තිය (සංඛ්‍යාත්මකව) | පිහිටීම | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| බ්‍රැන්ඩික්ස් ඇපරල්ස් ලිමිටඩ් | 9.00 | 550 | මඩකලපුව | වානිජ මෙහෙයුම් ක්‍රියාත්මකව පවතී |
| මාස් ඇක්ටිව් (පුද්.) සමාගම | 3.00 | 561 | කිලිනොච්චිය | - එම - |
| ෆර්ගසම් ගාර්මන්ට් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් | 2.30 | 383 | මන්නාරම | - එම - |
| ටයිමෙක්ස් ගාර්මන්ට්ස් ලිමිටඩ් | 2.30 | 418 | මන්නාරම | - එම - |
| ඔමෙගාලයින් (පුද්.) සමාගම | 20.00 | 882 | වවුනියාව | - එම - |
| යුනිවෙලා (පුද්.) සමාගම | 4.9 | 563 | කිලිනොච්චිය | - එම - |
| එකතුව | 41.5 | 3357 | | |

## ප්‍රාදේශීය වැඩසටහන් හා අපනයන සේවා අංශය

| 2013 වසරේදී ලැබුණු ව්‍යාපෘති යෝජනාවල මෙහෙයුම් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන (රු. මිලියන වලින්) | | | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|
| | | විදේශ | දේශීය | එකතුව | |
| වාණිජ මෙහෙයුම් සිදුවන ව්‍යාපෘති | - | - | - | - | - |
| වාණිජ මෙහෙයුම් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | - | - | - | - | - |
| ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 2 | 1010.790 | 1256.830 | 2267.620 | 137 |
| ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | - | - | - | - | - |
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | 3 | 3998.950 | 138.395 | 4137.348 | 418 |
| එකතුව | 5 | 5009.743 | 1395.225 | 6404.968 | 555 |

පහත දැක්වෙන උප අංශ යටතේ අනුමත කරනු ලැබූ ව්‍යාපෘති වලින් මෙම අංශය සමන්විත වේ.

i. අපනයන පාදක සේවා
**ii.** ප්‍රාදේශීය වැඩසටහන් (ව්‍යවසාය වැඩසටහන් 300 හා උතුරු හා නැගෙනහිර සංවර්ධන වැඩසටහන්)
**iii.** ක්‍රියාකාරී මධ්‍යස්ථාන මෙහෙයුම් සඳහා වන ව්‍යාපෘති

2013 වර්ෂයේ විදේශ ඍජු ආයෝජන සඳහා වූ ආංශික ඉලක්කය ඇමරිකානු ඩොලර් මිලියන 50.3 කි. උපලබ්ධි වූ විදේශ ඍජු ආයෝජන වටිනාකම ඇ. ඩො. මි. 44.866 කි. 2013 දෙසැම්බර් 31 වන විට රැකියා උත්පාදනය දළ වශයෙන් 43,679 ක් විය. 2013 වර්ෂයේදී අංශයේ සියලුම ව්‍යාපෘති සඳහා තථ්‍ය ආයෝජනය රු. මිලියන 69,397.198 ක් පමණ විය.

### අපනයන සේවා හා ප්‍රාදේශීය වැඩසටහන්

ප්‍රාදේශීය මෙහෙයුම් මූලස්ථාන, කළමනාකරණ උපදේශන, මුහුදු නැව් බඩු සේවා, මුද්‍රණ හා ප්‍රකාශන සේවා, නාවික සේවා, මෝටර් රථ සේවා හා වෙනත් සේවා ආදී වශයෙන් අපනයන සේවා යටතේ අනුමත කරනු ලැබූ කර්මාන්ත ප්‍රභේද යටතේ මෙහෙයවනු ලබන ව්‍යාපෘති 70ක් පමණ තිබේ.

2013 දෙසැම්බර් 31 වනදා වන විට ව්‍යවසාය වැඩසටහන් 300 (300 EP) යටතේ බල පැවැත්වෙන අනුමැති සංඛ්‍යාව 168 ක් විය. සමාගම් 140ක් ක්‍රියාකාරීව පවතී. ව්‍යවසාය වැඩසටහන් 300 ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව 2012 දෙසැම්බර් 31 වනදා වන විට අවසන් විය.

උතුරු හා නැගෙනහිර සංවර්ධන වැඩසටහන යටතේ බල පැවැත්වෙන ව්‍යාපෘති අනුමැතිවල එකතුව 33ක් විය. මේ සඳහා තක්සේරු කරන ලද ආයෝජන ප්‍රමාණය රු. මිලියන 8,933.742 ක් වූ අතර රැකියා උත්පාදනය 6,595 ක් විය. (ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ව්‍යාපෘති සංඛ්‍යාව 02, වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සංඛ්‍යාව - 14, දැනට මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ව්‍යාපෘති සංඛ්‍යාව - 17කි.)

### ක්‍රියාකාරී මධ්‍යස්ථානවල මෙහෙයුම් කටයුතු සඳහා වන ව්‍යාපෘති

මූල්‍ය පනත යටතේ හඳුන්වා දී ඇති මෙහෙයුම් නිර්ණායක පාදක කර ගෙන ක්‍රියාකාරී මධ්‍යස්ථානවල මෙහෙයුම් කටයුතු යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී තිබේ.

i. ආනයනය කිරීම, සුළු පිරිසැකසුම් කටයුතු කිරීම හා නැවත අපනයනය කිරීම ඇතුළු අන්තරාල වෙළඳ කටයුතු

**ii.** ශ්‍රී ලංකාවට භාණ්ඩ රැගෙන ඒමකින් තොරව එක් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර වෙනත් රටකට නැව්ගත කළ හැකි විදේශ රටවල ලියාපදිංචි කළ ව්‍යාපාර

**iii.** විදේශ සේවා දායකයන්ට ගනුදෙනුව ආරම්භයේදීම මුදල් ගෙවීමේ සේවා සැපයීම

**iv.** මූල්‍ය කළමනාකරණ සැපයුම් දාමය හා බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රමුඛ පෙළේ ගනුදෙනුකරුවන් සඳහා ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් කටයුතු

**v.** බන්ධිත ගබඩා වැනි සැපයුම් සේවා හෝ ශ්‍රී ලංකාව තුළ බහු-රාජ්‍ය ඒකාබද්ධවීම් වැනි අවස්ථාවල සැපයුම් සේවා සපුරාලීම

මෙම උප අංශය යටතේ ලැබුණු ව්‍යාපෘති යෝජනාවල තත්වය (2013/12/31 දින වන විට) පහත සඳහන් කර තිබේ.

| | |
|---|---|
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | - 03 |
| ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | - 01 |
| ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති | - 04 |

අනුමත කළ ව්‍යාපෘති මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ හා කටුනායක අපනයන සැකසුම් කලාපයේ පිහිටා තිබේ. මුළු තක්සේරු කළ ආයෝජන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 44කි.

**නිශ්පාදන අංශය**

| මෙහෙයුම් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන (රු. මිලියන වලින්) | | | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|
| | | විදේශ | දේශීය | එකතුව | |
| වාණිජ මෙහෙයුම් සිදුවන ව්‍යාපෘති | 2 | 151.570 | 1320.660 | 1472.23 | 740 |
| වාණිජ මෙහෙයුම් අපේක්ෂිත ව්‍යාපෘති | 4 | 642.82 | 872.852 | 1515.672 | 358 |
| ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 18 | 20815.93 | 11202.084 | 32018.014 | 2508 |
| ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති | 9 | 7416.606 | 4966.855 | 12383.461 | 1311 |
| අනුමැතිය අපේක්ෂිත ව්‍යාපෘති | 15 | 5547.303 | 6339.164 | 11886.467 | 1734 |
| එකතුව** | 48 | 34574.229 | 24701.615 | 59275.844 | 6651 |

** පුළුල් කිරීම් ඇතුළත්ව

2013 වර්ෂයේදී ව්‍යාපෘති යෝජනා හතළිස් අට (48) ක් ලැබුණු අතර අපේක්ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රු. බිලියන 59.275 කි. මෙයින් රු. බිලියන 34.574 ක් විදේශ සෘජු ආයෝජන වනු ඇත. අපේක්ෂිත මුළු රැකියා උත්පාදනය පුද්ගලයන් 6,651 ක් විය. මෙම වසරේ දී, වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති සංඛ්‍යාව 18කි.

2013 වර්ෂය සඳහා පුරෝකථනය කළ මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 216.42 ක් වූ අතර මෙයින් ඇමරිකානු ඩොලර් මිලියන 190.084 ක් උපලබ්ධි විය. මෙම ප්‍රමාණය පුරෝකථනය කළ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 87.83% ක් විය. දෙසැම්බර් 31 වනදා වන විට ව්‍යාපෘති 345 කින් උත්පාදනය කළ මුළු රැකියා සංඛ්‍යාව 55,654 කි.

ත්‍රිකුණාමලයේ ටෝක්යෝ සිමෙන්ට් ගෲප් හි අනුබද්ධ ආයතනයක් වන ටෝක්යෝ ඊස්ටන් සිමෙන්ට් කම්පැණි ලිමිටඩ් ඇමරිකානු ඩොලර් මිලියන 50 ක ආයෝජනයක් සිදු කිරීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. ඉඩමක් වෙන් කර ඉතා ඉක්මනින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. නැගෙනහිර පළාතේ සිමෙන්ති සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

දිවයිනේ ප්‍රථම පිටි කර්මාන්ත සමාගම වන ප්‍රීමා සිලෝන් ලිමිටඩ් ආයතනය, ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් ආයෝජනය කර එහි ධාරිතාව පුළුල් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටියි.

## 3. පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය

ශ්‍රී ලංකාවේ දැනට පවතින ආයෝජන වාතාවරණය තුළ මෙරට වෙත ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන විදේශ සෘජු ආයෝජන පරිමාව ලබා ගැනීම සඳහා උපදේශන කටයුතු වැඩිදියුණු කිරීම අතිශයින්ම වැදගත් වන බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් හඳුනා ගෙන ඇත. එම නිසා, අදාළ විදේශ සෘජු ආයෝජන ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම පිළිබඳ යෝජනා ලබා දීමේ හා උපදේශන කටයුතු ඉටු කිරීමේ බලය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය **(R&PA)** වෙත පවරා ඇත. එබැවින් ආයෝජන ආශ්‍රිත ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ ප්‍රධානතම උත්ප්‍රේරකයා ලෙස පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය ක්‍රියා කරයි. මෙම සන්දර්භය තුළ, ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා විවිධ ප්‍රතිපත්ති, නීති හා ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම් සම්බන්ධ යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම මෙන්ම ශ්‍රී ලාංකික ව්‍යාපාරික පරිසරය වැඩි දියුණු කිරීම සඳහා රජයට සහාය ලබා දෙමින් අප රටට වඩාත් අවශ්‍ය වන විදේශීය හා දේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම පිළිබඳ වගකීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය (R&PA) වෙත පැවරී තිබේ.

මෙයට අමතරව, සුවිශේෂී ලාභදායක වෙළඳපොළ සඳහා ව්‍යාපාරික පර්යේෂණ පැවැත්වීම, ආයෝජන අවස්ථා පිළිබඳ ආකෘතිය හඳුනා ගැනීම හා වැඩි දියුණු කිරීම, ප්‍රමුඛත්වය දිය යුතු ආයෝජන අංශ හඳුනා ගැනීම සඳහා දේශය මත පදනම් වූ හා අංශය මත පදනම් වූ පර්යේෂණ සිදු කිරීම, උපදේශාත්මක ප්‍රචාරක පත්‍රිකා පිළියෙල කිරීම, තරඟකාරී හා සංසන්දනාත්මක ප්‍රතිලාභ මත පදනම් වෙමින් ආයෝජන ප්‍රවර්ධන ක්‍රමෝපාය සැකසීම, ආයෝජන ආශ්‍රිත දත්ත සම්පාදනය කිරීම, විශ්ලේෂණය කිරීම, බෙදා හැරීම හා ආයෝජන කටයුතුවලට බාධා පමුණුවන ගැටළු හඳුනා ගැනීම හා එවැනි ගැටළු විසඳීම සඳහා විසඳුම් යෝජනා කිරීම ද මෙම අංශය වෙත පැවරී ඇති රාජකාරී අතරට ඇතුළත් වේ.

තවද, ආයෝජකයන්ගේ (ආයෝජකයන්ගේ තරඟකාරී අවශ්‍යතා හා වෙනත් අවශ්‍යතා මත පදනම්ව) නීත්‍යානුකූල ප්‍රතිපත්ති කටයුතු පිළිබඳව ක්‍රියාකරමින් ආයෝජන පරිසරයේ (ශ්‍රේණිගත කිරීම්වල) ක්‍රමික වැඩිදියුණු කිරීම් තහවුරු කිරීම සඳහා යෝජනා ලබා දීමට ද පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය බැඳී සිටියි. එමෙන්ම, විදේශ අයෝජන හා නිදහස් වෙළඳ ගිවිසුම් (BITs & FTAs) ප්‍රවර්ධන කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පවතින ද්වි පාර්ශ්වික ආයෝජන ගිවිසුම් මෙන්ම ආයෝජන ප්‍රතිපාදන ඇතුළත් වන සවිස්තරාත්මක ආර්ථික හවුල් ගිවසුම්වලට (CEPAS) අදාළ වන පර්යේෂණ අධ්‍යයන කෙටුම්පත් කිරීම / සාකච්ඡා කිරීම හා පර්යේෂණ අධ්‍යයන සිදු කිරීමේ කටයුතුවල දී එක්සත් ජාතීන්ගේ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ කොමිසම (UNCTAD) සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානය (WTO) ආදි අන්තර්ජාතික සංවිධානය සමඟ සමීපව කටයුතු කිරීමේ කටයුතුවල ද මෙම අංශය නිරතව සිටියි. ඒ අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය මගින් විදේශ හා දේශීය ආයෝජන ශ්‍රී ලංකාව තුළට ආකර්ෂණය කර ගැනීම සම්බන්ධයෙන් වැදගත් දායකත්වයක් ලබා දී තිබේ.

## 4. ආයෝජක සේවා අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ආනයන හා අපනයන ක්ෂේත්‍රවල ලියාපදිංචි වී සිටින ආයෝජකයන්ට අලෙවියෙන් පසු සේවා සැපයීම ආයෝජක සේවා අංශයේ කාර්යභාරය වේ. නැව් භාණ්ඩ සත්‍යාපනය කිරීමේ මධ්‍යස්ථාන 09 ට අමතරව, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 6 වන මහල, කොළඹ, කටුනායක, බියගම, කොග්ගල අපනයන සැකසුම් කලාප හා මහනුවර කාර්මික උද්‍යානයේ පිහිටා ඇති ආයෝජක සේවා මධ්‍යස්ථාන 05කින් මෙම අංශය සමන්විත වේ.

ආයෝජක සේවා අංශය මගින් සපයනු ලබන සේවා

ආනයන / අපනයන ලේඛන සැකසීම
ආනයනය හා අපනයනය කරන ලද නැව් භාණ්ඩ සත්‍යාපනය කිරීම
යුරෝපීය ප්‍රජාවට අයත් රටවලට අපනයනය කරනු ලබන රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සඳහා ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම
බන්ධිත ගුදම්වලින් භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබාදීම
උප කොන්ත්‍රාත්තු, හුවමාරු හා දේශීය අලෙවිය සඳහා අනුමැතිය ලබාදීම
අයිතම ප්‍රති ආනයනය හා ප්‍රති අපනයනය
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් වෙළඳ ව්‍යාපාර මුහුණ දෙන ගැටළුවලට විසඳුම් සෙවීමේදී රජයේ සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

ආනයන හා අපනයන මෙහෙයුම් ස්වයංක්‍රීය කිරීම

නැව් භාණ්ඩ නිෂ්කාශනය කිරීමේ කටයුතුවල දී මිනිස් මැදිහත් වීම් අවම කිරීම, ලේඛනවල අවශ්‍යතාව අඩු කිරීම හා ගත වන කාලය අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල ආනයන, අපනයන කටයුතු හා වෙනත් අදාළ ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය ව මෙහෙයවම සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබීය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ආනයන හා අපනයන ව්‍යාපෘතිවලට අවසර ලබා දීම සඳහා ආනයන අපනයන රේගු ප්‍රකාශන (CUSDECS) සැකසීම ආයෝජක සේවා අංශයේ ප්‍රධානතම කටයුතු වලින් එකකි.
2012 වසරේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ආයෝජකයන් සඳහා ඇසිකුඩා ලෝක පරිගණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් සියලුම ව්‍යාපාරික ආයතනවලට විද්‍යුත් භාර දීම, විද්‍යුත් සැකසුම, විද්‍යුත් ගෙවීම හා විද්‍යුත් අනුමැතිය යන පහසුකම් ආනයන හා අපනයන ක්‍රියාකාරකම්වල දී ලබා ගත හැකි විය. එයට අමතරව, දේශීය විකුණුම් සඳහා වන ක්‍රියා මාර්ග පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය ව මෙහෙයවනු ලැබූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් එහි ආයෝජකයන්ගේ මෙන්ම ආයෝජන ප්‍රකාශ කරන්නන්ගේ ද ප්‍රයෝජනය සඳහා පෙර ගෙවුම් ගිණුම්කරණ පද්ධතිය ද හඳුන්වා දෙනු ලැබිය.

"ශ්‍රී ලංකා රේගුවේ පත්‍රිකා රහිත අපනයන නිෂ්කාෂණ ආරම්භ කිරීම" හා සමගාමීව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපාරික ආයතන සඳහා පත්‍රිකා රහිත ඉලෙක්ට්‍රොනික වෙළඳාම (ඊ-වෙළඳාම) හඳුන්වා දීම සඳහා වැඩසටහන් කීපයක්ම ආරම්භ කර තිබේ. අපනයන ක්‍රියාවලියේ දී මේ දක්වා අවශ්‍ය වූ ලේඛන සංඛ්‍යාව 12-16 ක් වූ අතර මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, අවශ්‍ය වන ලේඛන සංඛ්‍යාව 4-5 ක් දක්වා අඩු කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අපේක්ෂා කරයි. අපනයන කාර්යාලයට ලේඛන පිටපත් ලබා නො දී රේගු ප්‍රකාශන (CUSDEC) අනුමත කිරීමට කටයුතු කිරීම මෙම වැඩසටහනේ මුල් පියවරකි.

අවසානයේ, වෙළඳාමේ හා ප්‍රවාහනයේ නියැළී සිටින සියලුම පාර්ශ්වයන්ට අදාළ වන සියලුම වෙළඳ ලේඛන හා තොරතුරු එකවර එකම ප්‍රවේශ ස්ථානයකින් ඉදිරිපත් කර ඔවුන්ගේ සියලුම වෙළඳ හා නියාමන අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව ලබා දෙන "තනි කවුළු (SW) පහසුකම මගින් සියලුම ආයෝජකයන්ට ප්‍රතිලාභ ලබා ගත හැකිය.

| | |
|---|---|
| 2013 වසර සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත ව්‍යාපාරික ආයතන සඳහා දෙන ලද මුළු ආනයන TEUS | 75520 TEUS |
| 2013 වසර සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත ව්‍යාපාරික ආයතන සඳහා භාර දෙන ලද මුළු අපනයන TEUS | 88640 TEUS |
| 2013 වසර සඳහා අපනයන වටිනාකම | රු. මිලියන 867,653.82 |
| 2013 වසර සඳහා ආනයන වටිනාකම | රු. මිලියන 622,453.24 |

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායන් සඳහා බහාලුම් ගතකළ නැව් භාණ්ඩ (ආනයන / අපනයන)**

| | 2012 | 2013 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 67,048 | 75,520 | 8,472 | 11.22 |
| අපනයන | 77,345 | 88,640 | 11,295 | 12.74 |



**පිරිසැකසූ රේගු ප්‍රකාශන සංඛ්‍යාව**

| | 2012 | 2013 | වෙනස | වර්ධනය(%) |
|---|---|---|---|---|
| ආනයන | 193,481 | 214,608 | 21,127 | 9.84 |
| අපනයන | 328,950 | 340,868 | 11,918 | 3.50 |




**ආනයන සහ අපනයනවල වටිනාකම (රු. මිලියන)**

| ස්වරූපය | 2012 | 2013 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 558,306.66 | 622,453.24 | 64,146.58 | 10.31 |
| අපනයන | 761,111.06 | 867,653.82 | 106,542.76 | 12.28 |



**රජය සඳහා ආදායම් - බදු** (රු. මිලියන)

| | 2012 | 2013 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආදායම | 10,004.14 | 10,937.29 | 933.15 | 8.53 |




## 5. අධීක්ෂණ ඒකකය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධීක්ෂණ ඒකකය 2013 වසරේ අවසාන භාගයේදී ස්ථාපනය කරන ලදී. මෙම ඒකකයට පවරනු ලැබූ කටයුතු වන්නේ,

- දීර්ඝ කාලයක් මුළුල්ලේ ගෙවා නොමැති, ගෙවිය යුතු මුදල් නැවත අයකර ගැනීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපාරික ආයතන මගින් ලබා ගන්නා තථ්‍ය විදේශ සෘජු ආයෝජන හා දේශීය ආයෝජන ප්‍රමාණ තක්සේරු කිරීම.

**දීර්ඝ කාලයක් මුළුල්ලේ ගෙවා නොමැති ගෙවිය යුතු මුදල් නැවත අයකර ගැනීම**

අධීක්ෂණ ඒකකය මගින් දීර්ඝ කාලයක් මුළුල්ලේ ගෙවා නොමැති, ගෙවිය යුතු මුදල් නැවත අයකර ගැනීම සඳහා සඵලදායක ක්‍රමයක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි. උදාහරණයක් ලෙස මූල්‍ය හා නෛතික අංශ මගින් පවත්වාගෙන යනු ලබන අදාළ ව්‍යාපෘති ලිපිගොනු සමාලෝචනය කිරීම හා විශ්ලේෂණය කිරීම මෙන්ම ගිවිසුම් බලාත්මකව පවතින ව්‍යාපාරික ආයතන සමග සන්නිවේදන කටයුතු සිදු කිරීම, ඒ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීම හා එවැනි ව්‍යාපාරික ආයතන සමග සාකච්ඡා පැවැත්වීම ආදී පියවර ගැනීම තුළින් ගෙවිය යුතු මුදල් නැවත ලබා ගැනීමට කටයුතු කිරීම, ගෙවිය යුතු මුදල් ඉල්ලුම් කිරීමේ ලිපි යැවීමේදී හා ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ගතයුතු අනෙකුත් නෛතික පියවරවලදී නෛතික අංශය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ වෙනත් අදාළ අංශ හා කලාපීය කාර්යාලවලින් මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කරන විට එම අංශ සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා ගෙවිය යුතු මුදල් නැවත අයකර ගැනීමට උත්සාහ කිරීම අධීක්ෂණ ඒකකයේ කාර්ය භාරය වේ.

ණය ගෙවීම පැහැර හැර ඇති ව්‍යාපාරික ආයතනවලට ගොස් ගෙවිය යුතු ණය මුදල් අයකර ගැනීම සඳහා ණය මුදල් එකතු කරන පුද්ගලයෙකු බඳවා ගැනීම / එවැනි පුද්ගලයෙකුගේ සේවය ලබා ගැනීම පිළිබඳ යෝජනාවක් මානව සම්පත් අංශය වෙත ඉදිරිපත් කර තිබේ. මානව සම්පත් අංශය මේ වන විට සුදුසු පුද්ගලයෙකු බඳවා ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි.

## විදේශීය සෘජු ආයෝජන හා දේශීය ආයෝජන ඇගයීම

අධීක්ෂණ අංශය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපාරික ආයතන පිළිබඳව පහත සඳහන් සමීක්ෂණ සිදු කරනු ලබයි.

**i.** මාස හතරකට වරක් සමීක්ෂණ පැවැත්වීම මගින් රට තුළට ගෙන එනු ලබන විදේශ සෘජු ආයෝජන පිළිබඳව හා අතිරේක දේශීය ආයෝජන පිළිබඳව තක්සේරු කිරීම තුළින් ආයෝජන යොමුවීමේ ප්‍රවණතා හා ආයෝජන යොමු කරනු ලබන කාර්මික අංශ හඳුනා ගැනීම.

**ii.** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 16 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කරනු ලැබූ ව්‍යාපෘතිවල මෙහෙයුම් කටයුතු පිළිබඳව වසරකට වරක් සමීක්ෂණ පැවැත්වීම.

මෙම කාර්යභාරයන් ඉටු කිරීමේදී, අධීක්ෂණ අංශය මගින් ගිවිසුම් ක්‍රියාත්මක ව පවතින හා විදේශ සෘජු ආයෝජන හා දේශීය ආයෝජන රැස් කරනු ලබන හා සම්පාදනය කරනු ලබන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාරික ආයතනවලට විදේශ සෘජු ආයෝජන හා දේශීය ආයෝජන පිළිබඳ සමීක්ෂණ ලිපි හා ප්‍රශ්නාවලි මාස හතරකට වරක් ඉදිරිපත් කරනු ලැබේ. එයට අමතරව, අංශය අනුව, රට අනුව හා ව්‍යාපෘති අනුව ආදී විවිධ ප්‍රභේදවලට අනුව අධීක්ෂණ අංශය මගින් විදේශ සෘජු ආයෝජන දත්ත සකස් කරනු ලබන අතර මෙසේ ගණනය කරන ලද විදේශ සෘජු ආයෝජන දත්ත ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදාළ අංශවලට කලින් කලට ඉදිරිපත් කරනු ලබන අතර ව්‍යාපෘති කළමනාකරණ තොරතුරු පද්ධතියට (MIS) ද මෙම විදේශ සෘජු ආයෝජන දත්ත සෑම මාස තුනකට වරක් ම ඇතුළත් කරනු ලබයි.

තවද, මෙම අංශය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 16 වන වගන්තිය යටතේ මෙහෙයවනු ලබන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපාරික ආයතනවලට වාර්ෂික සමීක්ෂණ ලිපි හා ප්‍රශ්නාවලි ඉදිරිපත් කරනු ලබන අතර එකී සමීක්ෂණවල විස්තර ව්‍යාපෘති කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) ට ද ඇතුළත් කරනු ලැබේ.

මෙම අධීක්ෂණ ඒකකය වාර්ෂිකව සමුච්චිත උපලබ්ධි ආයෝජන (විදේශීය හා දේශීය) ගණනය කිරීමේ නිරතව සිටින අතර එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට හා ව්‍යාපෘති  කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) ට ද ඇතුළත් කරනු ලැබේ.

## අත්පත් කරගත් ප්‍රගතිය

■ අධීක්ෂණ ඒකකය ක්‍රියාත්මක වූ මෙම කෙටි කාලය තුළ, උදාහරණයක් ලෙස 2013-06-01 සිට 2013-12-31 දක්වා කාලය තුළ ගෙවීම පැහැර හැර ඇති ව්‍යාපාරික ආයතනවලින් 2012 වසර හා එම වසරට පෙර කාල පරිච්ඡේදය සඳහා වාර්ෂික ගාස්තු හා බිම් කුලිය ලෙස රුපියල් මිලියන 58.687 ක් ආපසු අයකර ගැනීමට සමත් විය.

■ 2013 වර්ෂයේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් විදේශ සෘජු ආයෝජන ලෙසඇ. ඩො. මිලියන 1,391.4ක් අත්පත් කර ගැනීමට සමත් වූ බව ද සඳහන් කළ යුතුය.

**2013 වසරේදී පුරෝකථනය කළ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණ හා සත්‍ය වශයෙන්ම ලබාගත් විදේශ සෘජු ආයෝජන ප්‍රමාණ**

| අනු අංකය | අංශය | විදේශ සෘජු ආයෝජන පිළිබඳ මළු පුරෝකථනය / තථ්‍ය ලැබීම් 4වන කාර්තුව (2013 ඔක්.- දෙසැ.) (ඇ. ඩො. මිලියන වලින්) | | මුළු විදේශ සෘජු ආයෝජන පිළිබඳ මුළු පුරෝකථනය / තථ්‍ය ලැබීම් (2013 ජනවාරි - දෙසැම්බර්) (ඇ. ඩො. මිලියන වලින්) | | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අංශ මගින් ලබාගත් විදේශ සෘජු ආයෝජන% 2013 ජන. - දෙසැ. |
|---|---|---|---|---|---|---|
| | | මුළු පුරෝකථනය කළ වි. සෘ. ආ 2013 ඔක්තෝබර්- දෙසැම්බර් | තථ්‍ය ලෙස එක් රැස් කළ වි. සෘ. ආ. 2013 ඔක්තෝබර් - දෙසැම්බර් | මුළු පුරෝකථනය කළ වි. සෘ. ආ 2013 ජනවාරි - දෙසැම්බර් | තථ්‍ය ලෙස එක්රැස් කළ වි. සෘ. ආ. 2013 ජනවාරි - දෙසැම්බර් තුළ | |
| 1 | උපයෝගිතා | 260.50 | 213.61 | 678.00 | 559.42 | 40% |
| 2 | යටිතල පහසුකම් | 414.51 | 103.97 | 655.00 | 225.30 | 16% |
| 3 | නිෂ්පාදන | 126.40 | 57.80 | 216.90 | 190.08 | 14% |
| 4 | රෙදිපිළි හා ඇඟලුම් | 24.30 | 32.88 | 93.00 | 116.58 | 9% |
| 5 | සංචාරක කර්මාන්තය | 183.50 | 17.00 | 330.00 | 67.67 | 5% |
| 6 | කලාපීය සංවර්ධනය | 22.50 | 8.35 | 50.30 | 44.87 | 3% |
| 7 | කෘෂි කර්මාන්තය | 3.60 | 2.21 | 23.00 | 30.67 | 2% |
| 8 | දැනුමැති සේවා | 9.70 | 6.55 | 27.00 | 19.02 | 1% |
| 9 | අධ්‍යාපනය | 20.34 | 0.71 | 54.00 | 15.02 | 1% |
| 10 | 16 වන වගන්තිය | 6.00 | 78.30 | 20.00 | 122.77 | 9% |
| | එකතුව | 1,071.35 | 521.38 | 2,147.20 | 1391.40 | 100% |

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායන්වල විදේශ සෘජු ආයෝජන**
**(ඇමෙරිකානු ඩොලර් මිලියන 1.0 ක අවමයක් සහිත)ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ජේදය (තාවකාලික)**

| අනු අංකය | අංශය | ව්‍යවසායේ නම ඇ. ඩො. මිලියන | රට / රටවල් | විදේශ ණය හැර (විදේශ විනිමය නොවන බැංකු ඒකක) (ඇ. ඩො. මිලියන) | විදේශ ණය ඇතුළත්ව (විදේශ විනිමය නොවන බැංකු ඒකක) (ඇ. ඩො. මිලියන) |
|---|---|---|---|---|---|
| 1 | 0971/94 | ඩයලොග් ඒෂියාටා පීඑල්සී | මැලේසියාව | 36.30 | 171.50 |
| 2 | 4418/11 | සීමාසහිත කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස්(පුද්.) සමාගම | චීනය 140.00 හොංකොං 16.270 | 16.27 | 156.27 |
| 3 | 0690/93 | සීමාසහිත එටිසලාට් ලංකා (පුද්.) සමාගම | එ. අ. එ | 89.50 | 103.96 |
| 4 | 4650/13 | සීමාසහිත වෝටර්ප්‍රන්ට් ප්‍රොපර්ටීස් (පුද්.) සමාගම | රටවල් හඳුනාගෙන නැත | 83.10 | 83.10 |
| 5 | 0085/80 | ලංකා ඔරිකස් ලීසින් කම්පැණි පීඑල්සී | නෙදර්ලන්තය 36.895 ස්විට්සර්ලන්තය 12.600 ප්‍රංශය 10.029 ලක්සම්බර්ග් 5.000 | - | 64.52 |
| 6 | 4562/12 | සීමාසහිත මාස් ෆැබ්රික්ස් (පුද්.) සමාගම | හොංකොං | - | 46.00 |
| 7 | 0568/93 | සීමාසහිත මොබිටෙල් (පුද්.) සමාගම | චීනය | | 42.58 |
| 8 | 3875/08 | සීමාසහිත කයිරන් ලංකා (පුද්.) සමාගම | එක්සත් රාජධානිය 38.345 මුරුසිය 0.400 | 38.75 | 38.75 |
| 9 | 4545/12 | සීමාසහිත ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා සමාගම | චීනය | 35.00 | 35.00 |
| 10 | 1743/98 | සීමාසහිත හොල්සිම් ලංකා සමාගම | ස්විට්සර්ලන්තය 0.010 සිංගප්පූරුව 5.650 නෙදර්ලන්තය 14.010 මාලදිවයින 3.000 | 14.02 | 22.67 |
| 11 | 0424/92 | සීමාසහිත ලෝට්ස්ටාර් (පුද්.) සමාගම | කැනඩාව | 22.29 | 22.29 |
| 12 | 4540/12 | සීමාසහිත ක්‍රිශ් ට්‍රාන්ස්වර්ක්ස් කළම්බු (පුද්.) සමාගම | ඉන්දියාව | 22.06 | 22.06 |
| 13 | 0300/92 | සීමාසහිත හචිසන් ටෙලිකමියුනිකේෂන් (පුද්.) සමාගම | හොංකොං | 20.52 | 20.52 |
| 14 | 4054/09 | සීමාසහිත යුනිලීවර් ශ්‍රී ලංකා (පුද්.) සමාගම | නෙදර්ලන්තය | 20.00 | 20.00 |
| 15 | 3602/07 | ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී | නෙදර්ලන්තය | 18.80 | 18.80 |
| 16 | 107/95 | සීමාසහිත ටොයොටා ලංකා (පුද්.) සමාගම | ජපානය | 18.21 | 18.21 |
| 17 | 4349/11 | සීමසහිත ශන්ග්‍රී-ලා ඉන්වෙස්ට්මන්ට් ලංකා (පුද්.) සමාගම | හොංකොං | 15.80 | 15.80 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 18 | 0155/88 | සීමාසහිත ඇන්සෙල් ලංකා (පුද්.) සමාගම | ඕස්ට්‍රේලියාව | 14.00 | 14.00 |
| 19 | 2607/02 | සීමාසහිත කෙම්සෙල් (පුද්.) සමාගම | ඇ. එ. ජ. | 13.22 | 13.22 |
| 20 | 4162/10 | සීමාසහිත වරුන් බෙවරේජර්ස් ලංකා (පුද්.) සමාගම | මුරුසිය | - | 13.00 |
| 21 | 4657/13 | සීමාසහිත පී. එච්. රිසෝර්ට්ස් (පුද්.) සමාගම | තායිලන්තය | 11.73 | 11.73 |
| 22 | 1720/12 | සීමාසහිත කළම්බු සිටි සෙන්ටර් පාර්ට්නර්ස් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 11.70 | 11.70 |
| 23 | 4473/12 | සීමාසහිත ඉනෝ ඊසී පොලිමර් ලංකා (පුද්.) සමාගම | සිංගප්පූරුව | 11.49 | 11.49 |
| 24 | 1865/98 | සීමාසහිත ඔමෙගා ලයින් (පුද්.) සමාගම | ලක්සම්බර්ග් | 11.02 | 11.02 |
| 25 | 2373/01 | සීමාසහිත ප්‍රීමා සිලෝන් සමාගම | සිංගප්පූරුව | 10.50 | 10.50 |
| 26 | 1816/13 | සීමාසහිත පිරමීඩ් විල්මර් ප්ලාන්ටේෂන් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 10.50 | 10.50 |
| 27 | 0052/80 | සීමාසහිත ට්‍රෙලෙබෝර්ග් (පුද්.) සමාගම | නෙදර්ලන්තය | 10.06 | 10.06 |
| 28 | 1729/98 | සීමාසහිත සිලෝන් ස්ටීල් කෝපරේෂන් (පුද්.) සමාගම | බ්‍රිතාන්‍ය වර්ජියානු දූපත් | 10.00 | 10.00 |
| 29 | 4191/10 | හොටෙල් සර්විසස් (සිලෝන්) පීඑල්සී | ජර්මනිය | - | 10.00 |
| 30 | 3952/09 | සීමාසහිත මාකොළ යාතම හෝල්ඩින්ස් (පුද්.) සමාගම | සවුදි අරාබිය | - | 10.00 |
| 31 | 3174/05 | සීමාසහිත මිරෙකා හෝම්ස් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 9.30 | 9.30 |
| 32 | 4139/10 | සීමාසහිත නෝර් ලංකා මැනුෆැක්චරින් කළම්බු (පුද්.) සමාගම | හොංකොං | 8.90 | 8.90 |
| 33 | 1859/13 | සීමාසහිත යු සී රේන්බෝ ලංකා (පුද්.) සමාගම | චීනය | 7.80 | 7.80 |
| 34 | 3506/07 | සීමාසහිත ට්‍රෙලෙබෝර්ග් ටයර්ස් ලංකා (පුද්.) සමාගම | නෙදර්ලන්තය | 7.27 | 7.27 |
| 35 | 4614/13 | සීමාසහිත කිව් ඊ ජී ලංකා (පුද්.) සමාගම | සිංගප්පූරුව 0.775 | 0.78 | 7.00 |
| 36 | 0091/83 | කළම්බු ඩොක්යාර්ඩ් පීඑල්සී | හොංකෝ 6.226 ජපානය | 16.92 | 6.92 |
| 37 | 4520/12 | සීමාසහිත ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම | සිංගප්පූරුව 5.060 එක්සත් රාජධානිය 1.375 | 6.44 | 6.44 |
| 38 | 4573/12 | සීමාසහිත කෙප්පෙල් සී ටී ඩෙවලොප්මන්ට්ස් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 6.29 | 6.29 |
| 39 | 4610/13 | සීමාසහිත රැෆල්ස් ඇසෙට්ස් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 6.08 | 6.08 |
| 40 | 4306/10 | සීමාසහිත නිව් හෝප් ලංකා සමාගම | සිංගප්පූරුව 5.584 බංගලාදේශය 0.283 | 5.87 | 5.87 |
| 41 | 4404/11 | සීමාසහිත ඉන්දුසියෑන් ඩෙවලොපර්ස් (පුද්.) සමාගම | ඉන්දියාව | 5.16 | 5.16 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 42 | 3199/05 | සීමාසහිත ඩෝල් ලංකා (පුද්.) සමාගම | මුරුසිය 1.479<br>හොංකොං 3.514 | 4.99 | 4 .99 |
| 43 | 3540/07 | සීමාසහිත ප්ලැටිනම් රෙලිටි ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම | මුරුසිය | 4.35 | 4.35 |
| 44 | 4645/13 | සීමාසහිත යොශිදාශා (පුද්.) සමාගම | තායිවානය | 4.34 | 4.34 |
| 45 | 0188/90 | සීමාසහිත ට්‍රෙලෙබෝර්ග් වීල් සිස්ටම්ස් ලංකා (පුද්.) සමාගම | නෙදර්ලන්තය | 4.25 | 4.25 |
| 46 | 4689/13 | සීමාසහිත මොහාර් මැරීන් සර්විසර්ස් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 4.00 | 4.00 |
| 47 | 1508/97 | සීමාසහිත ඒෂියා පැසිෆික් බ්‍රෙවරි ලංකා (පුද්.) සමාගම | බෙල්ජියම 2.00<br>සිංගප්පූරුව 1.90 | 3.90 | 3.90 |
| 48 | 4503/12 | සීමාසහිත වෙල්කම් හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම | ඉන්දියාව | 3.90 | 3.90 |
| 49 | 3264/06 | සීමාසහිත බෙන්පී සමාගම | ලක්සම්බර්ග් | 3.85 | 3.89 |
| 50 | 1274/11 | ආනන්තර කළුතර ව්‍යාපෘතිය | තායිලන්තය | 3.76 | 3.76 |
| 51 | 3173/05 | සීමාසහිත ඩබ්ලිව් එස් ඕ ටු ලංකා (පුද්.) සමාගම | ඇ. එ. ජ. | 3.73 | 3.73 |
| 52 | 3110/05 | සීමාසහිත මිරෙකා කැපිටල් ලෑන්ඩ් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 3.40 | 3.40 |
| 53 | 4639/13 | සීමාසහිත බිලූ ඕෂන් ෆිෂරි (පුද්.) සමාගම | චීනය | 3.35 | 3.35 |
| 54 | 4348/11 | සීමාසහිත ශන්ග්‍රී-ලා හොටෙල්ස් ලංකා (පුද්.) සමාගම | හොංකොං | 3.26 | 3.26 |
| 55 | 3487/07 | සීමාසහිත ඒ ටී පී ඔකියුපේෂනල් (පුද්.) සමාගම | එක්සත් රාජධානිය | 3.20 | 3.20 |
| 56 | 4550/12 | සීමාසහිත බුටානි කැපිටල් සමාගම | ඇ. එ. ජ. | 3.11 | 3.11 |
| 57 | 4604/13 | සීමාසහිත බෙන් කොන්සෝර්ටියම් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්.) සමාගම | කැනඩාව | 3.07 | 3.07 |
| 58 | 4587/12 | සීමාසහිත සැන්ට ඩෝරා (පුද්.) සමාගම | එක්සත් රාජධානිය | 3.00 | 3.00 |
| 59 | 0035/79 | සීමාසහිත ඉන්ඩස්ට්‍රියල් ක්ලෝදින්ස් සමාගම | එ. අ. එ. 0.696<br>කේමන් දිවයින 2.204 | 2.90 | 2.90 |
| 60 | 4536/12 | සීමාසහිත හයිරු නාවල් ක්‍රාෆ්ට් ඉන්ජිනියරින් (පුද්.) සමාගම | කොමොරොස් | 2.85 | 2.85 |
| 61 | 4461/12 | සීමාසහිත මයිකල් හෝල්ඩින්ස් (පුද්.) සමාගම | රුසියාව | 2.80 | 2.80 |
| 62 | 1783/13 | සීමාසහිත ට්‍රිලන්ඩ් ඉන්ටර්නැෂනල් හෝල්ඩින්ස් (පුද්.) සමාගම | චීනය | 2.80 | 2.80 |
| 63 | 4477/12 | සීමාසහිත යූ ටී එම් ටී රිසෝර්ට් (පුද්.) සමාගම | ඔස්ට්‍රියාව | 2.80 | 2.80 |
| 64 | 4541/12 | සීමාසහිත පී එම් මෙටල පැකේජින් ලංකා (පුද්.) සමාගම | හොංකොං | 2.75 | 2.75 |
| 65 | 2122/00 | සීමාසහිත ජේ ජේ මිල්ස් ලංකා (පුද්.) සමාගම | ඉන්දියාව | 0.66 | 2.64 |
| 66 | 1701/98 | සීමාසහිත බිරුකි ඩයමන්ඩ් (පුද්.) සමාගම | බෙල්ජියම | 2.62 | 2.62 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 67 | 0299/92 | සීමාසහිත බොඩිලයින් (පුද්.) සමාගම | ඇ. එ. ජ. 1.305<br>හොංකොං 1.305 | 2.61 | 2.61 |
| 68 | 1704/98 | සීමාසහිත වර්චුසා (පුද්.) සමාගම | නෙදර්ලන්තය | 2.57 | 2.57 |
| 69 | 1239/11 | සීමාසහිත සිනෝ ලංකා හොටෙල් හෝල්ඩින්ස් (පුද්.) සමාගම | සිංගප්පූරුව | 2.56 | 2.56 |
| 70 | 4099/09 | සීමාසහිත සුකාසා කෝබෝ කම්පැණි (පුද්.) සමාගම | ජපානය | 2.55 | 2.55 |
| 71 | 2860/04 | සීමාසහිත පිරමීඩ් ලංකා (පුද්.) සමාගම | මුරුසිය 1.499<br>බ්‍රිතාන්‍ය වර්ජියානු දූපත් 0.875 | 2.37 | 2.37 |
| 72 | 4500/12 | සීමාසහිත ලිඔක් ලංකා (පුද්.) සමාගම | සිංගප්පූරුව | 2.36 | 2.36 |
| 73 | 4529/12 | සීමාසහිත ස්නැකා-ලංකා (පුද්.) සමාගම | ඉන්දියාව | 0.20 | 2.33 |
| 74 | 1435/96 | සීමාසහිත මිලේනියම් අයි ටී සොෆ්ට්වෙයාර් (පුද්.) සමාගම | එක්සත් රාජධානිය | 2.26 | 2.26 |
| 75 | 4627/13 | සීමාසහිත මොඩර්න් ප්‍රින්ටින් ඩිසයින් ලංකා (පුද්.) සමාගම | හොංකොං | 2.26 | 2.26 |
| 76 | 0080/80 | නෙස්ලේ ලංකා පීඑල්සී | ස්විට්සර්ලන්තය | 2.26 | 2.26 |
| 77 | 1896/99 | සීමාසහිත මිලේනියම් ඉන්පොමේශන් ටෙක් සමාගම | එක්සත් රාජධානිය | 2.25 | 2.25 |
| 78 | 4080/09 | කාට්සු-හයිලි එඩ්වානස්ඩ් මෙඩිකල් ටෙක්. ට්‍රා. සෙන්ටර් | ජපානය | - | 2.05 |
| 79 | 1157/94 | සීමාසහිත ඕෂන් ලංකා (පුද්.) සමාගම | හොංකොං | 2.03 | 2.03 |
| 80 | 4488/12 | සීමාසහිත ප්ලාන්ට් ලිපිඩ්ස් ලංකා (පුද්.) සමාගම | ඉන්දියාව | 2.03 | 2.03 |
| 81 | 4464/12 | සීමාසහිත මැක්සිමිස් හෝල්ඩින්ස් (පුද්.) සමාගම | රුසියාව | 2.02 | 2.02 |
| 82 | 4504/12 | සීමාසහිත ඇනෝඩිස් කොකෝවා (පුද්.) සමාගම | සිංගප්පූරුව | - | 2.00 |
| 83 | 4763/99 | සීමාසහිත ඉන්ටර්ටෙක් ලංකා (පුද්.) සමාගම | එක්සත් රාජධානිය | 1.90 | 1.90 |
| 84 | 0613/93 | සීමාසහිත ස්ට්‍රෙච්ලයින් (පුද්.) සමාගම | හොංකොං | 1.90 | 1.90 |
| 85 | 4632/13 | සීමාසහිත ඇනි විලාස් දික්වෙල (පුද්.) සමාගම | ඇ. එ. ජ. | 1.86 | 1.86 |
| 86 | 2377/01 | සීමාසහිත ලිනියා ඇක්වා (පුද්.) සමාගම | ඇ. එ. ජ. 0.930<br>එක්සත් රාජධානිය 0.930 | 1.86 | 1.86 |
| 87 | 4564/12 | සීමාසහිත වික්ටෝරියා හයර් එඩියුකේශන් (පුද්.) සමාගම | එ. අ. එ. | 1.82 | 1.82 |
| 88 | 4544/12 | සීමාසහිත ෆොන්ඩා ග්ලෝබල් ඉන්ජි. ලංකා (පුද්.) සමාගම | එ. අ.එ. | 1.82 | 1.82 |
| 89 | 0970/10 | සීමාසහිත ඩායි මේ එස් එල් කේ (පුද්.) සමාගම | ජපානය | 1.75 | 1.75 |
| 90 | 2140/00 | සීමාසහිත ඇමෙරිකන් ඇන්ඩ් ඉෆර්ඩ් ලංකා (පුද්.) සමාගම | ඇ. එ. ජ. | 1.63 | 1.63 |
| 91 | 2831/03 | සීමාසහිත එවරෙස්ට් ඉන්ඩස්ට්‍රියල් ලංකා (පුද්.) සමාගම | එ. අ. එ. | 1.63 | 1.63 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 92 | 2022/99 | සීමාසහිත ක්වොන්ටම් ලංකා (පුද්.) සමාගම | එක්සත් රාජධානිය | 1.63 | 1.63 |
| 93 | 0245/91 | සීමාසහිත කොග්ගල ගාර්මන්ට්ස් (පුද්.) සමාගම | හොංකොං | 1.61 | 1.61 |
| 94 | 4443/11 | සීමාසහිත පීකොක් ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම | එක්සත් රාජධානිය | 1.50 | 1.50 |
| 95 | 4321/10 | සීමාසහිත ෆියුචර් එනර්ජි (පුද්.) සමාගම | ඉන්දියාව | 0.99 | 1.49 |
| 96 | 3466/07 | සීමාසහිත සෙරෙන්ඩිපෝල් (පුද්.) සමාගම | ඇ. එ. ජ. 0.161<br>ජර්මනිය 0.027<br>නෙදර්ලන්තය 1.300 | 0.19 | 1.49 |
| 97 | 0131/87 | සීමාසහිත යුනයිටඩ් ටොබැකෝ ප්‍රොක්. (පුද්.) සමාගම | බෙල්ජියම | 1.48 | 1.48 |
| 98 | 1459/96 | සීමාසහිත ඒෂියා පවර් (පුද්.) සමාගම | ඩෙන්මාර්කය 0.209<br>එක්සත් රාජධානිය 0.489<br>ජපානය 0.745 | 1.44 | 1.44 |
| 99 | 3156/05 | සීමාසහිත ජාකෝබි කාර්බන්ස් ලංකා (පුද්.) සමාගම | ස්වීඩනය | 1.44 | 1.44 |
| 100 | 2024/99 | සීමාසහිත ඉන්ටර්නැෂනල් ට්‍රිමින්ස් ඇන්ඩ් ලේබල්ස් ලංකා (පුද්.) සමාගම | එක්සත් රාජධානිය | 1.37 | 1.37 |
| 101 | 2670/03 | සීමාසහිත වින්කොන් ඩෙවලොප්මන්ට් සිලෝන් (පුද්.) සමාගම | මැලේසියාව | 1.32 | 1.32 |
| 102 | 4387/11 | සීමාසහිත බයෝ එනර්ජි සොලියුෂන් (පුද්.) සමාගම | කොමොරොස් | 1.32 | 1.32 |
| 103 | 4147/10 | සීමාසහිත හම්බන්තොට ට්‍රේඩින් කම්පැණි (පුද්.) සමාගම | ඔස්ට්‍රේලියාව | 1.31 | 1.31 |
| 104 | 1928/99 | සීමාසහිත සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (පුද්.) සමාගම | නෙදර්ලන්තය 0.854<br>තායිවානය 0.260 | 1.31 | 1.31 |
| 105 | 2975/04 | සීමාසහිත ඩබ්ලිව්. එන්. එස්. ග්ලෝබල් සර්විසස් (පුද්.) සමාගම | මුරුසිය | 1.30 | 1.30 |
| 106 | 3757/08 | සීමාසහිත ඇට්ලැන්ටිස් ඩෙවලොප්මන්ට් (පුද්.) සමාගම | ඉන්දියාව | - | 1.29 |
| 107 | 1273/95 | සීමාසහිත වර්ක්වෙයාර් ලංකා (පුද්.) සමාගම | කේමන් දිවයින | 1.26 | 1.26 |
| 108 | 3367/06 | සීමාසහිත පිරමල් ග්ලාස් සිලෝන් (පුද්.) සමාගම | ඉන්දියව | 1.23 | 1.23 |
| 109 | 0133/87 | සීමාසහිත කොලන්ඩියම් (පුද්.) සමාගම | බෙල්ජියම | 1.19 | 1.19 |
| 110 | 4575/12 | සීමාසහිත සන් බිල්ඩින් ඉන්ඩ්. (පුද්.) සමාගම | තායිවානය | 1.18 | 1.18 |
| 111 | 4399/11 | සීමාසහිත ක්‍රිස්ටල් මාර්ටින් සෙන්ට්‍රල් (පුද්.) සමාගම | හොංකොං | 1.17 | 1.17 |
| 112 | 4355/11 | සීමාසහිත මුලඩැට් හොටෙල් ඇන්ඩ් රිසෝර්ට් (පුද්.) සමාගම | හොංකොං | 1.17 | 1.17 |
| 113 | 3218/05 | සීමාසහිත එස්. එම්. එල් ඩුවල්ප්ලාස්ට් ලංකා (පුද්.) සමාගම | සිංගප්පූරුව | 1.12 | 1.12 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 114 | 2200/00 | කේස්වර්ඩ් ජර්සි ලංකා පීඑල්සී | චීනය | 1.12 | 1.12 |
| 115 | 2297/00 | සීමාසහිත මර්බොක් එම්. ඩී. එෆ්. ලංකා (පුද්.) සමාගම | මැලේසියාව | 1.10 | 1.10 |
| 116 | 0002/78 | සීමාසහිත ස්මාර්ට් ෂර්ට්ස් (ලංකා) (පුද්.) සමාගම | චීනය | 1.09 | 1.09 |
| 117 | 4665/13 | සීමාසහිත ඒට්කන් ස්පෙන්ස් සී. ටී. ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්.) සමාගම | ඇ. එ. ජ. | 1.09 | 1.09 |
| 118 | 4512/12 | සීමාසහිත ටියුනිප් ලංකා (පුද්.) සමාගම | ඉන්දියාව | 1.02 | 1.02 |
| 119 | 4592/13 | සීමාසහිත ජයින් ඉන්ප්‍රාප්‍රොජෙක්ට්ස් (ලංකා) සමාගම | සිංගප්පූරුව | 1.00 | 1.00 |
| 120 | 1903/13 | සීමාසහිත ඉසෙඩ්. පී. එම්. සී. ලංකා (පුද්.) සමාගම | චීනය | 1.00 | 1.00 |
| 121 | 1886/13 | ඉම්පෝර්ට් එක්ස්පෝර්ට් ට්‍රේඩින් හවුස් | චීනය | 1.00 | 1.00 |
| 122 | 1880/13 | සීමාසහිත ලෙපර්ඩ් මෝටර් (පුද්.) සමාගම | චීනය | 1.00 | 1.00 |
| 123 | 1764/13 | සීමාසහිත වී. ඊ. සී. වී. ලංකා (පුද්.) සමාගම | ඉන්දියාව | 1.00 | 1.00 |
| | | එකතුව | | **802.71** | **1,304.60** |
| | | ඇමෙරිකානු ඩොලර් මිලියන 1.0 කට වඩා අඩු වෙනත් ව්‍යවසායන් | | 83.92 | 86.80 |
| | | මුළු එකතුව | | **866.63** | **1,391.41** |

2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ මුළු විදේශ ඍජු ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1391.405 ( ඇ.ඩො. මිලියන 504.779 ක් වූ විදේශ ණය ප්‍රමාණයද ඇතුළත්ව) ක් විය.

# 6. නෛතික අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නෛතික අංශය ආයෝජන මණ්ඩලයට මෙන්ම ආයෝජකයන් වෙත ද වෘත්තීය උපදෙස් / සේවා සැපයීම පිළිබඳව වගකීම දරයි. ආයෝජන සඳහා අදාළ වන නෛතික පද්ධතිය තුළ ආයෝජකයන්ට සේවා සැපයීම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වන වගන්තිය යටතේ හා 2008 අංක 14 දරණ (සංශෝධිත) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත ව්‍යාපෘති සම්බන්ධ ආයෝජන ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම නෛතික අංශයේ ප්‍රධාන කාර්යභාරය ලෙස දැක්විය හැකිය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට එදිරිව ආයතනික නඩු පැවරීම්වලට අදාළ සංස්ථාපිත නෛතික කටයුතුවලට අනුකූලවන කාර්යභාරය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නෛතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ආරම්භ කිරීමේ රාජකාරී කටයුතු ද මෙම අංශය මගින් ඉටු කරයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වන වගන්තිය සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති ස්ථාපනය කිරීමේ නෛතික ක්‍රමය පිළිබඳ තොරතුරු බෙදාහරීම හා ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරීමට අවසර ලබා දී ඇති ව්‍යාපෘති පවත්වා ගැනීම සම්බන්ධ වගන්ති මනාව අධ්‍යයනය කර පිළිගැනීම ඇතුළු ආයෝජක පහසුකම් සැලසීමේ නෛතික සේවාවන් නෛතික අංශය මගින් උපදේශන සේවා ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ නව ව්‍යාපාරික ආයතන ස්ථාපිත කිරීම සඳහා ගිවිසුම් 106 කට ඇතුළත් වන ලදී. 2008 අංක 14 දරණ සංශෝධිත ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන ව්‍යාපෘති 07ක් ද මෙයට ඇතුළත් වේ. එකී ව්‍යාපෘති 07 වන්නේ,

1. ට්‍රින්කොමලී පවර් කම්පැණි ලිමිටඩ්
2. ලේක් ලෙෂර් හෝල්ඩින්ග්ස් (පුද්.) සමාගම
3. වෝටර්ෆ්‍රන්ට් ප්‍රොපර්ටීන් (පුද්.) සමාගම
4. ක්වින්ස්බරි ලෙෂර් ලිමිටඩ්
5. වෙක් පෝර්ට් සිටි කලම්බු (පුද්.) සමාගම
6. ප්‍රොස්පර්ටි ප්ලේස් ලංකා (පුද්.) සමාගම
7. ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් (ලංකා) සමාගම

සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාපනය කරන ලද ඉලක්කය ඉක්මවීමට සමත් වූ මෙම ගිවිසුම් 07ට ඇතුළත් වීමට හැකි වීම අංශය මගින් අත්පත් කරගත් විශාල ජයග්‍රහණයක් ලෙස සැළකිය හැකිය.

තවද,
1. වෙල්කම් හොටෙල්ස් (පුද්.) සමාගම
2. ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම
3. සිනෝ ලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්.) සමාගම
4. යුක්ලෑන් ලංකා (පුද්.) සමාගම

යන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලැබී තිබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දැනට පවතින ව්‍යාපෘති සම්බන්ධයෙන් වැඩිදුර ආයෝජනය කිරීම, පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම, ව්‍යාපාරික විෂය පථය වෙනස් කිරීම හා ව්‍යාපෘති ප්‍රතිස්ථාපනය කිරීම, පාඩු ලබන කර්මාන්ත අත්පත් කර ගැනීම සහ ඒවා නැවත යථා තත්වයට පත් කිරීමට අදාළව පරිපූරක ගිවිසුම් 277 ක කටයුතු අවසන් කර තිබේ.

ඉහත කරුණුවලට අමතරව, ආයෝජකයන්ගේ කර්මාන්ත ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම් සැපයීම මගින් ආයෝජකයන් හා සම්බන්ධ සේවා ව්‍යාප්ත කිරමේ කටයුතුවලද මෙම අංශය නිරතව සිටී.

# 7. තාක්ෂණික සේවා අංශය

(1) තාක්ෂණික සේවා අංශය පහත සඳහන් කටයුතු පිළිබඳව ප්‍රධාන වශයෙන් වගකිවයුතු වේ.

(i) නව අයෝජන කලාප / ව්‍යාපෘති සඳහා ස්ථාන හඳුනා ගැනීම.
(ii) නව ආයෝජන කලාප සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම.
(iii) නව ආයෝජන කලාපවල මූලික සංවර්ධන කටයුතු භාර ගැනීම.

මූලික කටයුතු සඳහා කලාප ඒකක ස්ථාපනය කිරීම සහ කලාපවල මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා අනෙකුත් කලාපයන්හි සිදුකළ ආකාරයට බලතල බෙදා හැරීම මගින් අදාළ කලාප අධ්‍යක්ෂවරුන් වෙත ක්‍රමානුකූලව කටයුතු පැවරීම.

(iv) පවත්නා අපනයන සැකසුම් කලාප 12 සිදු කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පරිදි තාක්ෂණික සහාය ලබාදීම.

(v) පවත්නා ආයෝජන කලාප 12 ජල සැපයුම, ජලාපවාහන පද්ධතිය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය මෙහෙයවීම සහ නඩත්තු කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

(vi) විශේෂ ආයෝජන ව්‍යාපෘති සම්බන්ධ ඉඩම් කටයුතු සඳහා මෙන්ම යටිතල පහසුකම් සැපයීම සඳහා ද සහාය සේවා සහ තාක්ෂණික යෙදවුම් සැපයීම.

(vii) යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ක්‍රියාකාරී සැළසුම් මුළුමනින්ම පාලනය කිරීම.

(viii) සමෝධානික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය / කාර්මික උද්‍යානයක් ස්ථාපනය කිරීම සඳහා මෙන්ම කලාපවල ජල ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා යෝජනා පිළියෙල කිරීම, ස්ථාන හඳුනා ගැනීම හා අවශ්‍ය අනුමැති ලබාගැනීම.

(ix) නිසි බලධාරියා සමඟ සමායෝජන කටයුතු සිදු කරමින් 2011 අංක 43 දරණ පනත යටතේ රජයට පවරාගත් වත්කම් නැවත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පවරා ගැනීම.

(x) මහජන අයිතිවාසිකම් සම්බන්ධයෙන් පාරිසරික ගැටළුවලට හා අර්බුදවලට මුහුණ දුන් කාර්මික පිරිවිතරවල තාක්ෂණික අංශ පිළිබඳව පරීක්ෂා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

(2) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු වත්මන් අපනයන සැකසුම් කලාප වෙනත් රටවල දක්නට ලැබෙන අන්තර්ජාතික කලාපවල ප්‍රමිතියට අනුකූලව ආදර්ශ කාර්මික කලාප ලෙස ඉහළ තත්වයකට පත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල තීරණයට අනුව, 2013 වසරේදී, අපනයන සැකසුම් කලාපවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා එම කලාප ඉහළ තත්වයකට පත් කිරීම සඳහා රු. මිලියන 263.0 ක මුදලක් ද, නව කලාප සංවර්ධනයට රු. මිලියන 376.0 ක මුදලක් ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් වැය කරනු ලැබීය.

(3) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අළුතින් ස්ථාපනය කරනු ලැබූ මීරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය හා හම්බන්තොට සූරියවැව ආයෝජන කලාපවල යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදුකරන අතරතුර කාර්මික උද්‍යානයක්, වාණිජ හා නිවාස සංකීර්ණයක්, රෝහල් සඳහා පහසුකම් සහ විනෝදය හා සංචාරක ව්‍යාපාර ව්‍යාපෘති සංවර්ධනය කිරීමේ අරමුණින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අමතර ඉඩම් කට්ටි 4ක් සහිත අක්කර 250 ක මුළු භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා ගනු ලැබීය. 2013 වසර තුළ මූලික සැලසුම් කටයුතු හා අවශ්‍ය නිෂ්කාෂණ ලබාගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී.

## 2012 දෙසැම්බර් 31 වන විට පැවැති අපනයන සැකසුම් කලාප පිළිබඳ විස්තරය

| | KEPZ | BEPZ | KgE-PZ | KIP | MwEPZ | PEPZ | MEPZ | HEPZ | SEPZ | MjEPZ | WEPZ | MalEPP |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ සිට ඇති දුර (කි. මී.) | 31 | 24 | 131 | 135 | 106 | 77 | 65 | 54 | 47 | 234 | 42 | 32 |
| ස්ථාප-නය කළ වර්ෂය | 1978 | 1985 | 1991 | 1995 | 2000 | 2000 | 1998 | 1999 | 1999 | 1999 | 1998 | 1998 |
| භූමි ප්‍රමා-ණය | Total 528.93 △ කාර්මික 288.59 △ | 450 A | 227 A | 205 A | 53.15 A | 50 A | 260 A | 381 A | 431 A | 228 H | 123 A | 32 A |
| ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව | 90 | 59(වාණිජ මෙහෙයුම්) | 22 | 21 | 07 | 05 | 10 | 13 | 30 | 03 | 18 | 04 |
| රැකියා අවස්ථා | 39,397 | 21862 | 13058 | 7338 | 5200 | 3788 | 2850 | L – 1727F –24 | 20,729 | 1559 | 9191 | 1500 |

### අපනයන සැකසුම් කලාප/IP/EPP




**KEPZ** = කටුනායක අපනයන සැකසුම් කලාපය
**BEPZ** = බියගම අපනයන සැකසුම් කලාපය
**KgEPZ**= කොග්ගල අපනයන සැකසුම් කලාපය
**KIP** = මහනුවර කාර්මික උද්‍යානය
**MwEPZ**= මාවතගම අපනයන සැකසුම් කලාපය
**PEPZ** = පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය
**MEPZ** = මීරිගම අපනයන සැකසුම් කලාපය
**HEPZ** = හොරණ අපනයන සැකසුම් කලාපය
**SEPZ** = සීතාවක අපනයන සැකසුම් කලාපය
**MjEPZ** = මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය
**WEPZ** =වතුපිටිවල අපනයන සැකසුම් කලාපය
**MalEPZ** = මල්වත්ත අපනයන සැකසුම් කලාපය

# 8. පාරිසරික කළමනාකරණ අංශය

අංශයේ ප්‍රධාන කාර්යයන්වල සාරාංශය පහත සඳහන් කර ඇත.

● ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වන කොටස යටතේ මෙහෙයුම් කටයුතු සිදුවන ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමග එක්ව පාරිසරික අනුමැතිය ලබාදීම.

ජාතික පාරිසරික (ව්‍යාපෘති අනුමත කිරීම සඳහා වන පටිපාටිය) රෙගුලාසි ප්‍රකාරව, පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය (EIA) අවශ්‍ය වන ව්‍යාපෘති සඳහා පැවැත්වෙන බලපෑම් ඇගයීමේ සැසිවලට සහභාගී වීම මගින් අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා පහසුකම් සැලසීම.

තවද, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය (PAA) වශයෙන් පත්කර ඇති අවස්ථාවලදී ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය (PAA) ලෙස කටයුතු කිරීම.

● මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමග එක්ව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) නිකුත් කිරීම.

● සන්නිවේදන කුළුණු ඉදිකිරීම සඳහා යෝජිත ස්ථාන සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත (TRC) පාරිසරික නිර්දේශ (ERR) නිකුත් කිරීම.

● ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවලට අදාළ පරිසර දූෂණ පැමිණිලි සම්බන්ධව විමර්ශන සිදුකිරීම සහ අදාළ ස්ථානය සඳහා අවශ්‍ය දූෂණ පාලන පියවර ගැනීම සහතික කිරීම මගින් ඒවා විසඳීම සිදු කිරීම.

● අපනයන සැකසුම් කලාපයන්වල කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම.

උක්ත කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| 1. (අ) ව්‍යාපෘති සඳහා ලබාදුන් පරිසර බලපත්‍ර සංඛ්‍යාව | 92 |
| (ආ) ව්‍යාපෘති පුළුල් කිරීම / ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලබාදුන් පරිසර බලපත්‍ර සංඛ්‍යාව | 19 |
| 2. නිකුත් කළ / අලුත් කළ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) සංඛ්‍යාව | *720 |
| 3. සන්නිවේදන කුළුණු ඉදිකිරීම සඳහා යෝජිත ස්ථාන සම්බන්ධයෙන් නිකුත් කළ පාරිසරික නිර්දේශ (ERR) ප්‍රමාණය | **216 |
| 4. පාරිසරික ගැටළු සම්බන්ධයෙන් විමර්ශනය කර විසඳුම් ලබා දුන් පැමිණිලි සංඛ්‍යාව | 25 |
| 5. පාරිසරික අධීක්ෂණ කටයුතු | |
| (අ) කර්මාන්තවලින් රැස්කළ අපද්‍රව්‍ය නියැදි සංඛ්‍යාව<br>(ආ) සාමාන්‍ය ජලාපවාහන පිරිපහදු යන්ත්‍රාගාර වලින් රැස්කළ අපද්‍රව්‍ය නියැදි සංඛ්‍යාව | 1001 |
| (ඇ) ජල නියැදි සංඛ්‍යාව | 152 |

*- EPL ගාස්තුවලින් ඉපැයූ ආදායම රු. 6,228,000.00
**- ER ගාස්තුවලින් ඉපැයූ ආදායම රු. 4,320,000.00
මුළු ඉපයීම් - රු. 10,548,000.00

● ඉහත කරුණට අමතරව, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් පාර්ශ්වයන් වෙතින් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, ආයෝජන මණ්ඩල ව්‍යාපෘති ශ්‍රී ලංකාව විසින් අත්සන් කර ඇති පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මුතිවලට අනුගත වන බව තහවුරු කරන ලදී. හානිකර අපද්‍රව්‍ය දේශසීමාවන් හරහා රැගෙන යාම පිළිබඳ බ්‍රසල්ස් සම්මුතිය, ඕසෝන් ස්ථරය ක්ෂය කිරීමේ ද්‍රව්‍ය පිළිබඳ මොන්ට්‍රියල් සම්මුතිය, නොදිරන ඓන්ද්‍රිය පරිසර දූෂක පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතිය, රසායනික අවි සම්මුතිය සහ අන්තරායකර ඖෂධ සහ මානසික ව්‍යාකූලත්වය ඇති කරන ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීමට එරෙහි සම්මුතිය යනාදිය ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මුති වේ.

**අත්පත් කරගත් ජයග්‍රහණ**

● පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) සහ පාරිසරික නිර්දේශ (ERR) නිකුත් කිරීමේ කටයුතු මගින් රු. මිලියන 10.5 කට ආසන්න ආදායමක් උපයනු ලැබිය.

● මීරිගම අපනයන සැකසුම් කලාපයේ (MEPZ) උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කළ යුතු මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව (IEER) සහායක සෙන්ට්‍රල් ලැන්කෂයර් (UCLan) විශ්වවිද්‍යාලය විසින් සපයනු ලැබිය. මීරිගම අපනය සැකසුම් කලාපයේ ඉදිකරනු ලබන මෙම ව්‍යාපෘතියේ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව (IEER) මධ්‍යම පරිසර අධිකාරිය (CEA) මගින් පිළිගෙන එම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ද ලබා දී තිබේ.

● ISO 9001 : 2008 තත්ත්ව සහතිකය මත පදනම් වූ ගුණාත්මක කළමනාකරණ පද්ධතිය යටතේ 2013 වර්ෂයේ ස්ථාපනය කළ ඉලක්කය වූයේ ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවලින් 95% ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) ලබාගැනීම තහවුරු කළ යුතු වීමයි. ඒ අනුව, එම ඉලක්කයෙන් 97% ක් සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

● යෝජිත මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය හා සූරියවැව ආයෝජන ප්‍රවර්ධන කලාපය සම්බන්ධයෙන් දැනට සකස් කරනු ලබන පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා (EIARR) "ස්කිල්ස් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම" මගින් තක්සේරු කරනු ලැබිය. මෙම වාර්තා සඳහා අවශ්‍ය වන නිවැරදි කිරීම් / වැඩි දියුණු කිරීම් හඳුනාගෙන ඇති අතර ඒ අනුව මෙම වාර්තා වැඩි දියුණු කරන ලෙස අදාළ උපදේශකවරයාට දන්වා ඇත.

● පහත දැක්වෙන තාක්ෂණික කමිටු එම අවස්ථාව නියෝජනය කරමින් සහභාගී වූ අතර එහි තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ද එම තාක්ෂණික කමිටු සක්‍රීය අන්දමින් දායක වන ලදී.

(අ) මධ්‍යම පරිසර අධිකාරිය මුලසුන හෙබවූ ඉහළ හා මධ්‍යම පරිමාණ පරිසර දූෂණය සිදුවන කර්මාන්ත අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යානවලට පරිබාහිරව ස්ථාපනය කළ යුතු ස්ථාන පිළිබඳව තීරණය කිරීමේ කමිටුව
(ආ) මධ්‍යම පරිසර අධිකාරිය මුලසුන හෙබවූ මූලික තාක්ෂණික ඇගයුම් කමිටුව
(ඇ) පාරිසරික හා සුනිත්‍ය බලශක්ති අමාත්‍යාංශය මුලසුන හෙබවූ දේශගුණික වෙනස්කම් සඳහා වන එක්සත් ජාතීන්ගේ රාමුව
(ඈ) පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා මුලසුන හෙබවූ කාර්මික පළිබෝධනාශක ආනයනය කිරීම

**පුහුණු වැඩසටහන් සඳහා පරිසර දෙපාර්තමේන්තුවෙන් සහභාගී වූ නිලධාරීන් පහත දක්වා ඇත.**

**දේශීය**

- මහ නගර සභාවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- පරිසරය මනාව කළමනාකරණය කිරීම හා පොලික්ලෝරිනීකෘත බයි ෆීනයිල්(ඡක්ෂ්) අපහරණය හා අපද්‍රව්‍ය සහ විෂබීජ පැතිරුණු උපකරණ අපහරණය කිරීම.
- රසායනික අනතුරු වැළැක්වීම හා පෙර සූදානම් වැඩසටහන.
- පරිසර දූෂණය පාලනය හා ඒ සඳහා ගතයුතු පියවර
- හරිතාගාර වායු සඳහා ඉන්වෙන්ටරි සකස් කිරීම

**විදේශීය**

| | | |
|---|---|---|
| ■ තායිලන්තය | - | රසායනික අනතුරු වැළැක්වීම හා පෙර සූදානම. |
| ■ මැලේසියාව | - | "ඉන්ටර්නැෂනල් ග්‍රීන්ටෙක් ඇන්ඩ් එකෝ ප්‍රොඩක්ට්ස්" ප්‍රදර්ශනය/සම්මන්ත්‍රණයට සහභාගී වීම හා සමෝධානිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධ්‍යයන චාරිකාවට සහභාගී වීම |

# 9. ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති අංශය

ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති අංශය උප අංශ දෙකකින් සමන්විත වේ. ඒවා නම්,

I. ඉංජිනේරු අනුමත කිරීමේ අංශය
II.ඉඩම් අංශය

**ඉංජිනේරු අනුමත කිරීමේ අංශය**

ඉංජිනේරු අනුමත කිරීමේ අංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ස්ථාන නියාමනය කිරීම සම්බන්ධ අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාකරන අතර මෙමගින් ප්‍රධාන සේවා හතරක් ඉටුවේ. 17 වන වගන්තිය යටතේ වන ව්‍යාපෘති සඳහා ස්ථානීය අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, ප්‍රමාණ සහතික කිරීම සහ අනුකූලතා සහතිකය නිකුත් කිරීම එම ප්‍රධාන සේවා හතර වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ඕනෑම ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීම සඳහා ස්ථානීය අනුමත කිරීම් පූර්ව අවශ්‍යතාවක් වේ. ආයෝජන දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපෘති යෝජනාව අනුමත කිරීමෙන් අනතුරුව, ඉංජිනේරු අනුමත කිරීමේ අංශය හා පරිසර දෙපාර්තමේන්තුව මගින් ස්ථානීය පරීක්ෂා සිදු කරනු ලබන අතර අනාගත ව්‍යාපෘතිය සඳහා ස්ථානයේ යෝග්‍යතාව එමගින් තක්සේරු කරයි. ඒ අතර, වෙනත් අදාළ රාජ්‍ය නියෝජිතයන්ගේ හා අදාළ පළාත් පාලන ආයතනවල අදහස් හා නිර්දේශ ද සලකා බලනු ලැබේ. මෙම කෙටි තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අවසානයේ දී, ස්ථානීය අනුමත කිරීමේ ලිපිය නිකුත් කරනු ලැබේ.

2013 වසර තුළ දී, ඉංජිනේරු අනුමත කිරීමේ අංශය මගින් ස්ථාන 217 ක් පරීක්ෂා කරනු ලැබූ අතර ස්ථාන 158 ක් අනුමත කරනු ලැබීය. ස්ථාන 20 ක් ප්‍රතික්ෂේප කරනු ලැබීය. අවස්ථා 39 කදී, විවිධ හේතු මත ආයෝජකයින් විසින් ස්ථානය වෙනස් කරනු ලැබීය.

අනාගත ව්‍යාපෘති ගොඩනැගිලි අදාළ සියලුම විශේෂ හා නෛතික ප්‍රමිතීන්වලට අනුකූල වන බව තහවුරු කිරීම සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සිදු කරයි.

2013 වසර තුළදී, ඉංජිනේරු අනුමත කිරීමේ අංශ මගින් ව්‍යාපෘති 181 ක ගොඩනැගිලි සැලසුම් අනුමත කරනු ලැබීය.

ප්‍රමාණ සහතික කිරීම 17 වන වගන්තිය යටතේ වූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා තීරුබදු රහිතව ඉදිකිරීමේ අයිතම ආනයනය කිරීම හා සම්බන්ධ වේ. එවැනි අයිතම ආනයනය කිරීමේදී, ඇඳීම් හා ගොඩනැගිලිවල ප්‍රමාණ සහතික සමඟ ප්‍රමාණ පරීක්ෂා කරනු ලබන අතර ඒවා ගොඩනැගිලිවලට අදාළ මුළු අවශ්‍යතා සීමාව තුළ පවතින බව තහවුරු වුවාහොත්, ආයෝජකයාට අයිතිවාසිකම් කිව හැකි බදු සහන සමඟ එම අයිතම නිෂ්කාෂණය කර ගත හැකිවන පරිදි අවශ්‍ය නිර්දේශ ආයෝජක සේවා අංශයට ඉදිරිපත් කරනු ලැබේ.

2013 වර්ෂය තුළ, ඉංජිනේරු අනුමත කිරීමේ අංශය මගින් ප්‍රමාණ සහතික 2369 ක් නිකුත් කරනු ලැබීය.

වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා ගොඩනැගිල්ල සූදානම් බව අනුකූලතා සහතිකය (COC) මගින් තහවුරු කෙරේ. ඉදිකිරීමේ අදියර අවසානයේ දී, ආයෝජකයාගේ ඉල්ලීම පරිදි ඉංජිනේරු අනුමත කිරීමේ අංශය මගින් ගොඩනැගිල්ල සවිස්තරාත්මකව පරීක්ෂා කරයි. අනුමත සැලසුම් අනුව ඉදිකිරීම් සිදුකර ඇති බව තහවුරු වීමෙන් අනතුරුව අනුකූලතා සහතිකය (COC) නිකුත් කරයි.

2012 වසර තුළදී, මෙම අංශය මගින් ව්‍යාපෘති 40ක් සඳහා අනුකූලතා සහතික (COC) නිකුත් කර තිබේ.

**ඉඩම් අංශය**

ඉඩම් අංශය පහත සඳහන් කර ඇති සේවා සැපයීම පිළිබඳව වගකිව යුතුය.

- ආයෝජන ව්‍යාපෘති සඳහා ලබාගත හැකි රජයේ ඉඩම් හඳුනා ගැනීම හා ආයෝජකයන්ගේ ප්‍රයෝජනය සඳහා අදාළ තොරතුරු ඉඩම් බැංකුවක පවත්වාගෙන යෑම.

- 17 වගන්තිය යටතේ වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් අන්සතු කිරීමේ ක්‍රියාවලිය සමායෝජනය කිරීම හා ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදුකිරීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ආයෝජන කලාප ස්ථාපනය කිරීම සඳහා රජයේ ඉඩම් හා පුද්ගලික ඉඩම් හඳුනාගැනීම

හා ඒවා අත්පත් කර ගැනීම සඳහා කටයුතු කිරීම.

- ඉඩම් ගැටළු සම්බන්ධයෙන් විසඳුම් සෙවීමට ආයෝජකයන්ට සහාය වීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉඩම් ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**2013 වසරේදී අත්පත් කරගත් ප්‍රගතිය**

- උතුරු පළාතේ ආයෝජන ප්‍රවර්ධන කලාප, කෘෂිකාර්මික කලාප හා වෙනත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘති ස්ථාපනය කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමේ අරමුණින් පර්යේෂණයක් පැවැත්වීම.

- වවුනියාව දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 587 ක් වූ මුළු ඉඩම් ප්‍රමාණය නිදහස් කර දීර්ඝ කාලීන බදු පදනම මත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා ගැනීමට හැකිවන පරිදි සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කරනු ලැබීය.

- පොදු රාජ්‍ය මණ්ඩලීය ආයෝජන සංසදයට පැමිණි ආයෝජකයන්ට ලබා දීම සඳහා ස්ථාන 14ක් හඳුනා ගන්නා ලදී.

- කාර්මික උද්‍යානයක් ඉදිකිරීම සඳහා මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි අක්කර 50 ක ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කරනු ලැබීය.

- පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපයේ යෝජිත පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පැවති "සෝපිස් වත්ත" ලේකම් කොට්ඨාශයේ පිහිටි අක්කර 50ක ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කරනු ලැබීය.

- පුත්තලමේ ඇති අක්කර 250ක ඉඩම නැවත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා ගැනීමේ කාර්ය භාරය ක්‍රියාත්මක කිරීම සඳහා 2013-12-10 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබීය.

- වසා දැමූ වෙළඳ ව්‍යාපාර නැවත ක්‍රියාත්මක කිරීම යටතේ කලින් පැවති ඇඟළුම් කර්මාන්ත 50 හා 200 යන වැඩසටහන් යටතේ පැවති පහත සඳහන් කර්මාන්ත ශාලා නැවත ක්‍රියාත්මක කරනු ලැබීය.

- ප්‍රයිම් කලෙක්ෂන් (පුද්.) සමාගම, ඩී.එස්.එල්. ලංකා (පුද්.) සමාගමට බදු දෙනු ලැබීය.

- හීනටිගල ගාර්මන්ට්ස් (පුද්.) සමාගම (200GFP) සීඅයිසි ඇග්‍රි බිස්නසස් (පුද්.) සමාගමට බදු දෙනු ලැබීය.

- පීරිකේ එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම (200 GFP) "බ්‍රැන්ඩික්ස් එන්ටිමේට්ස්" (පුද්.) සමාගමට බදු දෙනු ලැබීය.

- විනෝ ලංකා (පුද්.) සමාග ම (200GFP) රේන්බෝ පැෂන්ස් (පුද්.) සමාගමට බදු දෙනු ලැබීය.

# 10. කාර්මික සබඳතා අංශය

ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාරික ස්ථාන තුළ මනා කාර්යක්ෂමතාවක් හා ඵලදායිතාවක් ඇති කර ගැනීම සඳහා කාර්මික සබඳතා මනාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ **කාර්මික සබඳතා අංශය** මගින් ඉටුකරනු ලබයි. එකී ඉලක්කය සපුරාගැනීම සඳහා කාර්මික සබඳතා අංශය විසින් පහත සඳහන් කටයුතු පරිපාලනය කරනු ලැබේ.

■ ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යාපාරික ස්ථානවල කම්කරු කළමනාකරණය, සම්බන්ධීකරණය, කාර්මික සාමය සහ සහයෝගීතාව මෙන්ම ඉහල ඵලදායීතාවක් පවත්වාගෙන යාම පිණිස ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම.

■ ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ස්ථානවල කළමනාකරුවන්ට සහ සේවකයන්ට අවශ්‍ය අවස්ථාවන්වල කම්කරු නීති / රෙගුලාසි සහ කාර්මික සබඳතා පිළිබඳව උපදේශන සේවා හා මාර්ගෝපදේශනය සැපයීම.

■ අපනයන සැකසුම් කලාපවල ක්‍රියාත්මකව පවතින ආයෝජන මණ්ඩල සේවා නියුක්ති ඒකක, රැකියා බැංකු වෙබ් අඩවි හා බඳවා ගැනීමේ සහායක වැඩසටහන් සංවිධානය කිරීම තුළින් ආයෝජකයන්ගේ අවශ්‍යතාව පරිදි ශ්‍රම බලකායක් බඳවා ගැනීමට සහාය ලබා දීම.

**2013 වර්ෂය තුළ කාර්මික සබඳතා අංශය මගින් පහත දැක්වෙන ප්‍රගතීන් අත්පත් කර ගන්නා ලදී.**

■ කම්කරු ප්‍රමිති පවත්වාගෙන යාම

කලාපවලට අනුබද්ධිත සහ ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධිත කාර්මික සබඳතා නිලධාරීන් විසින් කම්කරු නීති/රෙගුලාසි සහ ආයෝජන මණ්ඩල කම්කරු ප්‍රමිතිවල හා වෘත්තීය සබඳතා අත්පොතෙහි සඳහන් කම්කරු ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සඳහා ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ස්ථානවල කලින් කලට කම්කරු විගණන පවත්වනු ලබයි.

2013 වර්ෂයේදී, කලාප තුළ පිහිටි ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ස්ථාන සහ කලාපවලින් බැහැර ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ස්ථාන 1165 ක කම්කරු විගණන සිදුකර ඇති අතර අදාළ විගණනවලදී සොයා ගන්නා ලද අඩුපාඩු / ප්‍රමාද දෝෂ නිවැරදි කිරීම සඳහා පියවර ගෙන ඇත.

■ කම්කරු කළමනාකරණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම

"සේවක සභා" යනු ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ආයතනවල කම්කරු කළමනාකරණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගත් ප්‍රධානතම මෙවලම විය. වෘත්තීය සමිති දිරිමත් කරමින් වෘත්තීය සමිති සමඟ සහයෝගීතාවෙන් කටයුතු කරන අතරතුර කම්කරු කළමනාකරණය සහයෝගීතාව සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ආයතනවල සේවකයන්ගේ පුළුල් සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් සේවක සභාවලට මඟ පෙන්වනු ලැබේ.

**2013 වර්ෂය තුළදී, සේවක සභා 110ක් ඇති කිරීම සහ මෙහෙයවීම සඳහා කාර්මික සබඳතා අංශය මගින් පහසුකම් සලසන ලදී.**

වෘත්තීය සමිති නිලධාරීන්ට කලාපයේ කම්කරුවන් නිදහසේ හා පෞද්ගලිකව හමුවීම සඳහා කටුනායක, බියගම සහ කොග්ගල අපනයන සැකසුම් කලාපයන්හි ස්ථාපනය කරන ලද පහසුකම් සැලසීමේ මධ්‍යස්ථාන අදාළ කම්කරු සබඳතා ඒකක මගින් සාර්ථකව මෙහෙයවනු ලබයි.

තවද, 2013 වර්ෂය තුළ අදාළ රජයේ නියෝජිතායතනවල සහයෝගය ලබා ගැනීම තුළින් ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ආයතනවල සේවකයන් හා කළමනාකරණ නිලධාරීන්වෙනුවෙන් සමාජ සංවාද, සාමාන්‍ය දැනුවත්භාවය, වැඩබිමේ සහයෝගීතාව, සුහදශීලී වැඩ පුරුදු, සෞඛ්‍ය හා ආරක්ෂාව වැනි විවිධ මාතෘකා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 82ක් පවත්වා ඇත.

■ කාර්මික අර්බුද විසඳීම සඳහා මැදිහත් වීම / බේරුම් කිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාරික ආයතනවල කාර්මික සාමය හා සමාදානය පවත්වාගෙන යාමේදී, එම ව්‍යාපාරික ආයතන තුළ ඇතිවන ඕනෑම කාර්මික අර්බුදයක් පසිඳලීම සඳහා කම්කරු සබඳතා නිලධාරීන් මැදිහත් වේ. 2013 වර්ෂය තුළදී කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහාය ඇතිව කාර්මික අර්බුද / වැඩ වර්ජන 13ක් සමථයකට පත් කරන ලදී.

■ බඳවා ගැනීමේ උපකාරක වැඩසටහන්

ආයෝජන මණ්ඩලයේ රැකියා බැංකු වෙබ් අඩවිය (www.boijobbank.com) මගින් ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ආයතන සහ රැකියා අපේක්ෂිත තරුණයන් අතර අන්තර් සබඳතා ගොඩ නගා ගැනීම සඳහා පහසුකම් සලසයි. ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ආයතනවල පවතින රැකියා අවස්ථා පිළිබඳව මහජනතාව වෙත දැනුම්දීමේ අරමුණින් මෙම සේවාව නොමිලයේ පවත්වාගෙන යනු ලැබේ.

2013 වර්ෂය තුළදී, රැකියා අපේක්ෂිතයින් 66,189 ක් අපනයන සැකසුම් කලාපවලට අයත් වෘත්තීය සේවා ඒකකවල ලියාපදිංචි වී සිටි අතර ඉන් 65,671 ක් ස්ථානගත කිරීමේ අරමුණින් පවත්වනු ලබන බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සඳහා ව්‍යාපාරික ආයතන වෙත යොමුකර ඇත.

තවද, කම්කරු සබඳතා අංශය මගින් රැකියා අපේක්ෂිතයින් ආයෝජන මණ්ඩල ව්‍යාපාරික ආයතනවල පවතින රැකියා අවස්ථා සඳහා වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමේ අභිලාෂයෙන් යුක්තව අදාළ වෙනත් නියෝජිතායතන සමඟ සහයෝගිතාවෙන් රැකියා පොළ / වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සංවිධානය කිරීමට පහසුකම් සලසයි. 2013 වර්ෂය තුළ, දිවයින පුරා එබඳු රැකියා පොළවල් 24ක් සංවිධානය කර ඇත.

# 11. තොරතුරු තාක්ෂණ අංශය

**1. අංශයේ කටයුතු පිළිබඳ සාරාංශය**

අ. ආයෝජන මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් හඳුනා ගැනීම, ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් හා තාක්ෂණික සහාය සැපයීම.

ආ. ආයෝජන මණ්ඩලයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණික සම්පත් සැලසුම් කිරීම, නිර්දේශ කිරීම, ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරනය කිරීම, බලතල පැවරීම සහ නඩත්තු කිරීම.

ඇ. ඒකාබද්ධ ජාල හා දත්ත සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කිරීම සහ කළමනාකරණය කිරීම.

ඈ. ආයෝජන මණ්ඩලයට අවශ්‍ය මෘදුකාංග පද්ධති සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

ඉ. දෘඩාංග, මෘදුකාංග, සන්නිවේදන, ජාල, විද්‍යුත් තැපෑල සහ පරිගණක වෛරස්වලට අදාළ ගැටළු විසඳීමේදී පරිශීලක-සහාය සැපයීම.

ඊ. ව්‍යාපාර ප්‍රති-ඉංජිනේරුකරණ ප්‍රයත්නයන් සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමේදී අනෙකුත් දෙපාර්තමේන්තුවලට සහාය ලබා දීම.

උ. ඒකාබද්ධ දත්ත ශබ්ද කෝෂය, දත්ත පාදම / පද්ධති සහ අදාළ පද්ධති ලේඛන ගත කිරීම, වැඩි දියුණු කිරීම සහ පවත්වාගෙන යාම.

**2. 2013 දී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති**

2.1. 2013 වසර තුළදී තොරතුරු තාක්ෂණ සම්පත් හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලයට තොරතුරු තාක්ෂණික සේවා සැපයීමට නව ජාල සම්බන්ධතා 85 ක් (කලාප කාර්යාල ද ඇතුළත්ව) සපයමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ LAN/WAN ජාලය වැඩි දියුණු කිරීම.

(ආ) බියගම අපනයන සැකසුම් කලාපයේ (BEPZ) පුස්තකාලය, කොග්ගල අපනයන සැකසුම් කලාපයේ ඇතුළුවීමේ අවසර පත්‍ර නිකුත් කරන කාර්යාලය, 27 මට්ටමේ පිහිටි ආයෝජන මධ්‍යස්ථානය හා 6 වන මට්ටමේ පිහිටි IS අංශය සඳහා දත්ත ඒකක 125 ක් සහිත නව තන්ත්‍ර ජාල ස්ථාපනය කරනු ලැබීය.

(ඇ) කලාප කාර්යාල ද ඇතුළත් ව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්යාල සඳහා පුද්ගලික පරිගණක 80ක්ද, මුද්‍රණ යන්ත්‍ර 84 ක්ද සවි කරනු ලැබීය.

(ඈ) UPS 14 ක්ද, ස්විච 10ක්ද, ජාල උපාංග (NIC, Media Converter) ආදිය ද ප්‍රසම්පාදනය කිරීම හා සවිකිරීම සිදුකරනු ලැබීය.

(ඉ) SLCERT සහාය ඇතිව ජාල ආරක්ෂක ඇගයුම් සමීක්ෂණය පැවැත්වීම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ජාලයේ සුරක්ෂිතභාව වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.

(ඊ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වයට බාධා රහිත විද්‍යුත් තැපැල් සේවයක් ලබා ගැනීමට හැකිවන පරිදි නව විද්‍යුත තැපැල් පොකුරු සැපයුම්කාර සේවාවක් ක්‍රියාත්මක කිරීම.

2.2. මෘදුකාංග යෙදවුම් වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම

2.2.1. නව්‍ය ව්‍යාපෘති

(අ) ව්‍යාපෘති ආශ්‍රිත තොරතුරු ලබා ගැනීම හා කාර්යසාධන දත්ත අධීක්ෂණය කිරීම සඳහා සියලු ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ මධ්‍යස්ථානය සඳහා මෘදුකාංග මොඩියුලයක් සැකසීම.

(ආ) ආයෝජන විමසුම් වාර්තා ගත කිරීම හා විමසුම් සම්බන්ධ ඉදිරි කටයුතු වඩාත් ඵලදායක ලෙස ඉටු කිරීම

(ඇ) වෙබ් තුළින් ලැබෙන ඉල්ලීම් ලබා ගැනීම සඳහා ගේට්ටු දෙක සහ මාසික ඇතුළුවීමේ අවසර පත්‍ර නිකුත් කරන කාර්යාලය ද සම්බන්ධ කරමින් කටුනායක අපනයන සැකසුම් කලාපයේ ඇතුළුවීමේ අවසර පත්‍ර නිකුත් කරන වෙබ් ආශ්‍රිත පද්ධතිය සකස් කිරීම. මෙම ක්‍රමය භාවිත කිරීමෙන් කඩදාසි භාවිතය හා ෆැක්ස් භාවිතය අතහැර දැමිය හැකිය.

(ඈ) දේශීය විකුණුම් පෙර ගෙවුම් ගිණුම් පද්ධතිය සමඟ සමෝධානය කරනු ලබන අතර පෙර ගෙවුම් ගිණුම් පද්ධතිය තුළින් සේවා ගාස්තු පිළිබඳ මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීයව ඉටු කරනු ලැබේ.

(ඉ) පෙර ගෙවුම් ගිණුම් තුළින් රේගු ප්‍රකාශනවලට අදාළ නොවන සේවා ගාස්තු එකතු කිරීම සඳහා IS (අයි එස්) අංශය සඳහා වෙනම මොඩියුලයක් වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඊ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතනවල සැබෑ විදේශ ඍජු ආයෝජන වටිනාකම් ලබා ගැනීම සඳහා අංශ අනුව හා ව්‍යාපෘති අනුව ක්‍රමයක් සැලසුම් කිරීම, වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(උ) ආසිවල්ඩ් නව පද්ධතියට අනුව ආනයන / අපනයන දත්ත හුවමාරු කිරීමේ වැඩසටහනක් නැවත සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

2.2.2. පවතින ක්‍රමය සඳහා කළ යුතු වැඩි දියුණු කිරීම්

- MIS (එම් අයි එස්) : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ගාස්තු හා විදේශ ඍජු ආයෝජන ප්‍රකාශනය පහසුවෙන් නිරීක්ෂණය කිරීම සඳහා MIS තුළ අන්තර්ගත කිරීම.

- පෙර ගෙවුම් ගිණුම : අධීක්ෂණ මධ්‍යස්ථාන හරහා මුදල් හා චෙක්පත් එක්රැස් කිරීම සඳහා පවතින පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රකාශකයන් සඳහා හර / බැර නිවේදන / සටහන් හා ලෙජර් සාරාංශ තුළින් ගෙවීම් ගැළපීම.

- IEMS (අයි ඊ එම් එස්) : අනාගත වසර සඳහා ඒකාබද්ධ ඇප නිරූපණය කිරීමේ හා නව වසර ආරම්භ වූ විට ඒවා ස්වයංක්‍රීයව හුවමාරු කිරීමේ පහසුකම් සමෝධානය කිරීම, අදාළ නොවන කාර්යාලීය කේත සමඟ රේගු ප්‍රකාශන වලංගු කිරීම සීමා කිරීම හා අයිතිය පැවරීමේ රෙජිස්ටර යාවත්කාලීන කිරීමේ පහසුකම සත්‍යාපනය කිරීමේ මධ්‍යස්ථානවලට ලබා දීම.

- මාර්ග ගත දත්ත භාරදීම : අධීක්ෂණ මධ්‍යස්ථාන පදනමින් රැකියා දත්ත හා වාර්තා ලබාගැනීමේ පහසුකම් සැපයීමට හැකිවන පරිදි මෙම පද්ධතිය ප්‍රතිශෝධනය කර තිබේ.

- පෙර ගෙවුම් ගිණුම් අන්තර්ජාල වෙබ් අඩවි ඇතුළත් නාමාවලිය : අභ්‍යන්තර විගණන අංශය සඳහා දත්ත නිරීක්ෂණය කිරීමේ පහසුකම් ලබාදීම සඳහා අන්තර්ජාල වෙබ් අඩවි ඇතුළත් නාමාවලි දෙකක් ප්‍රතිශෝධනය කර ඇත. එමෙන්ම රේගු ප්‍රකාශනවලට අදාළ නොවන ගෙවීම්, ගෙවීම් විස්තර තෝරා ගැනීම්වලින් වෙන්කර ඇත.

# 12. මාධ්‍ය සහ ප්‍රචාරණ ඒකකය

ආයෝජන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය බාහිර සන්නිවේදන කටයුතු පිළිබඳව වගකිව යුතුය. 2013 වර්ෂයේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා, ව්‍යාපාරික වාතාවරණය, ආයෝජන මණ්ඩලයේ සාර්ථකත්වය ආදී කරුණු පිළිබඳව විවිධ මාධ්‍යයන් තුළින් විවිධාකාරයේ ප්‍රේක්ෂකයන් ආමන්ත්‍රණය කරමින් ඔවුන්ව දැනුවත් කිරීම සඳහා සමාරම්භක පියවර තබනු ලැබීය.

2013 වර්ෂයේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විවිධ මාධ්‍ය ආකාර භාවිතා කරමින් ප්‍රචාරක වැඩසටහන්වල නිරත විය. තවද, පුළුල් ප්‍රේක්ෂක ජනකායක් වෙත ආයෝජන මණ්ඩලයේ පණිවුඩය ප්‍රචාරය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් මුද්‍රිත ප්‍රවර්ධන ද්‍රව්‍ය වැඩි දියුණු කිරීම, ප්‍රකාශනවල ප්‍රචාරක දැන්වීම් පළ කිරීම, වාර්තාමය චිත්‍රපට නිෂ්පාදනය කිරීම ද සිදුකරනු ලැබීය.

### 2013 වසරේ විශේෂ සිදුවීම්

මාධ්‍ය අංශය මගින් සංවිධානය කරන ලද එමෙන්ම සමායෝජනය කරන ලද හා සහභාගී වූ විශේෂ අවස්ථා පහත සඳහන් කර ඇත.

- පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය (CBF)

2013 නොවැම්බර් මාසයේ 15-17 දක්වා ශ්‍රී ලංකාවේ පැවැත්වූ 23 වන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට (CHOGAM) සමගාමීව කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ නොවැම්බර් 12-14 දක්වා පැවැත්වූ ව්‍යාපාරික සංසදය හා "ශ්‍රී ලංකා ආයෝජන මධ්‍යස්ථානයේ ආයෝජනය කරන්න" යන මැයෙන් පැවැත්වූ විශේෂ අවස්ථාව ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සංවිධානය කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවැත්වූ විශාලතම ව්‍යාපාරික සම්මේලනය වූ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදයේ සත්කාරක දේශය වශයෙන් ශ්‍රී ලංකාව ක්‍රියා කරනු ලැබීය.

ලන්ඩනයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදයේ (CBC) සහයෝගීතාවෙන් හා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරමින් පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය සංවිධානය කරනු ලැබීය. ලෝකය පුරා විසිරී සිටින ප්‍රධාන පෙළේ බලවත් ව්‍යාපාරිකයන් හා නායකයන් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට මෙම සංසදයට හැකි විය. දේශයේ ආර්ථික සංවර්ධනයට ඉතා වැදගත් බලපෑමක් සිදු කිරීමට සමත් වූ මෙම ව්‍යාපාරික සංසදය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරනු ලැබීය.

# 13. පරිපාලන අංශය

පරිපාලන අංශය සවිස්තරාත්මක සැලසුම් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මගින් වෙනත් අංශවල මෙහෙයුම් කටයුතු සඳහා සහාය ලබා දෙයි. එමෙන්ම මෙම අංශය මගින් එහි සේවාදායක අංශවලට මෙන්ම අපනයන සැකසුම් කලාපවලටද ප්‍රශස්ත සේවා ලබා දෙයි. නිසි වේලාවට ප්‍රවාහන පහසුකම් සලසා දීම හා ද්‍රව්‍ය හා යටිතල පහසුකම් අවශ්‍යතා සැපයීම මගින් මෙම අංශය පහසුකම් සලසන්නාගේ කාර්ය භාරය ද ඉටුකරයි.

පරිපාලන අංශය පහත දැක්වෙන උප ඒකකවලින් සමන්විත වේ.

1. ගබඩා හා සැපයුම් ඒකකය
2. ප්‍රවාහන ඒකකය
3. ගොඩනැගිලි නඩත්තුව
4. සාමාන්‍ය පාලන
5. තැපැල් අංශය

### 2013 වසරේ අත්පත් කරගත් ජයග්‍රහණ

පරිපාලන අංශය මගින් නවතම මාදිලියේ වාහන මිලදී ගැනීම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ රථ ඇණියට තවත් වාහන එකතු කරනු ලැබීය. මූල්‍ය කල්බදු පදනම යටතේ කාර් නවයක් (09) ක් හා ඩබල් කැබ් රථ (06) මිලදී ගනු ලැබීය.

මහ මඟ ගමන් කිරීමට නුසුදුසු තත්වයට පත්ව තිබූ වාහන 19ක් වෙන්දේසි කරනු ලැබූ අතර එමගින් උපයාගත් මුළු ආදායම රු. 14,115,000/- කි.

ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 6 වන මහල යළි සකස් කිරීමේ කටයුතු සිදුකරනු ලැබූ අතර එම මහලේ ආයෝජක සේවා අංශය නැවත පිහිටවනු ලැබීය.

ස්ථාවර දුරකථන රැහැන් පද්ධතිය සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ පවතින ගිවිසුම තවත් වසර 03 ක කාල සීමාවකට දීර්ඝ කරනු ලැබීය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට රු. මිලියන 80ක් වැයකරමින් ගබඩා හා සැපයුම් ඒකකය එහි දායකත්වය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලබා දෙනු ලැබීය.

# 14. ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය

ආරක්ෂක හා ගිනි නිවීමේ අංශයට අයත් ආරක්ෂාව හා ගිනි නිවීමේ ක්ෂේත්‍රය තුළ වැදගත් ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමත් වූ වසරක් ලෙස 2013 වසර හැඳින්විය හැකි අතර ආරක්ෂක හා ගිනි නිවීමේ කාර්ය මණ්ඩලය ඔවුන්ට බෙදා වෙන් කරනලද ක්ෂේත්‍රවල මිනිස් ජීවිත හා වත්කම්වල ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සඳහා අවශ්‍ය ප්‍රමිති පවත්වා ගැනීම සම්බන්ධයෙන් ඉතා ප්‍රශංසනීය මෙහෙවරක් ඉටු කරනු ලැබීය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අවශ්‍ය සේවකයන් සංඛ්‍යාව බඳවාගෙන නොමැති වීම නිසා ඇතිවූ ගැටළුකාරී තත්ත්වය මධ්‍යයේ වුවද, මෙම ආයතනයේ සේවක මණ්ඩලයේ අප්‍රතිහත ධෛර්ය හා කැපවීම තුළින් මෙහෙයුම් කටයුතු අපේක්ෂිත මට්ටමින් සිදු කිරීමට හැකි විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට බඳවා ගත් සේවක මණ්ඩලයෙන් හා පෞද්ගලික ආරක්ෂක සමාගම්වලින් කුලියට ගත් ආරක්ෂක නිලධාරීන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එහි කාර්යාල / උද්‍යාන / කලාපවල සේවක මණ්ඩල හිඟය ආවරණය කර ගැනීමට ටෙන්ඩර් ක්‍රියා පටිපාටි මගින් වාර්ෂිකව පෞද්ගලික ආරක්ෂක සමාගම්වල සේවා ලබා ගනියි. නිසි බලධාරියාගෙන් පවරා ගන්නා ලද භූමිය හා ගොඩනැගිලිවල ආරක්ෂක කටයුතු ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය මගින් ඉටුකරනු ලබයි.

**දෙසැම්බර් 31 දින වන විට මුළු සේවක සංඛ්‍යාව - ආරක්ෂක හා ගිනි නිවීමේ ඒකක**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සේවකයන් හා කුලියට ගත් සේවකයන්**




| | | | |
|---|---|---|---|
| මුළු ආයෝජන මණ්ඩල ආරක්ෂක කාර්ය මණ්ඩලය | - | 89 | 135 |
| ගිනි නිවීමේ කාර්ය මණ්ඩලය | - | 46 | |
| කුලියට ගන්නා ලද මුළු පෞද්ගලික ආරක්ෂකයන් ගණන | - | 257 | 295 |
| වසනු ලැබූ ස්ථාන සඳහා මුළු පෞද්ගලික ආරක්ෂකයන් ගණන | - | 38 | |

**2013 දෙසැම්බර් 31 දින වන විට පැවති ආරක්ෂක ස්ථාන සංඛ්‍යාව පූර්ව වසරේ ආරක්ෂක ස්ථාන සංඛ්‍යාවට සමානය.**

**රාජකාරී ස්ථාන සංඛ්‍යාව - ස්ථාන අනුව**




ආරක්ෂක හා ගිනි නිවීම් ඒකකවලට පැවරී ඇති ප්‍රධාන කාර්යභාරයන් අතර වැදගත්ම කාර්යභාරය වන්නේ මිනිස් ජීවිත හා දේපළවල ආරක්ෂාව හා සුරක්ෂිතභාවය ඇතිකිරීමයි.

**ආරක්ෂාව**

- හිතාමතා හානි කිරීමේ අවස්ථා, විප්ලවකාරී කටයුතු, සොරකම්, අයිතම අළුත්වැඩියා කිරීම / නැවත භාර දීම ද ඇතුළත්ව තීරු බදු රහිත භාණ්ඩ හා වෙනත් භාණ්ඩ නීත්‍යානුකූල නොවන ආකාරවලින් ඉවත් කිරීම වැළැක්වීම.

- කලාපය ඇතුළතට හෝ පිටතට නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පිවිසීම හෝ පිටවීම පිළිබඳව ඉතා අවධානයෙන් පරීක්ෂා කිරීම සඳහා ඇතුළුවීමේ හා පිටවීමේ ස්ථානවලට සේවක පිරිස් යෙදවීම.

- සියළුම කලාපවල ජංගම හා පා ගමනින් මුර සංචාරක කටයුතු කිරීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලය යෙදවීම.

- තීරු බදු ක්‍රියාත්මකව පවතින ප්‍රදේශවල රාජකාරී කටයුතු සිදු කිරීම හා කලාපය ආශ්‍රිත ප්‍රදේශ තුළ පැය 24 පුරා සෝදිසියෙන් සිටීම හා එම ප්‍රදේශ සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කිරීම.

- මෙම රාජකාරිය ඉටු කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන්ම වගකිව යුතු සති අන්තය හා නිවාඩු කාලය හැර වැඩ කරන පැය ගණන තුළ හා ඉන් පරිබාහිරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලය හා එක්ව ඇතුළු වීමේ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම.

- සොරකම් කිරීමට තැත් කිරීම, කල් ඉකුත් වූ ඇතුළුවීමේ අවසර පත්‍ර අනිසි ලෙස භාවිත කිරීම ආදිය සොයා ගැනීම සඳහා සියළුම කලාපවල කර්මාන්තශාලා නිරන්තරයෙන් පරීක්ෂා කිරීම.

- කලාප කළමනාකරණය, වෙළඳ ව්‍යාපාර හා නීතිය ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටින බලධාරීන් සමඟ අවශ්‍ය සමායෝජන කටයුතු සිදුකිරීම.

- වසා දැමූ වෙළඳ ව්‍යාපාරවල ආරක්ෂාව පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

- සියළුම කලාපවල දෛනික / මාසික රැස්වීම්, උපදෙස් හෝ තොරතුරු ලබා දීමේ රැස්වීම්, පුහුණු කිරීම්, දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදෙස් ලබා දීමේ සැසි වාර පැවැත්වීම.

## ආරක්ෂක මෙහෙයුම් - කාර්ය සාධනය - 2013

| | අනාවරණ සංඛ්‍යාව | ගේට්ටු අවසරපත් වලින් ලද ආදායම (ආරක්ෂක අංශ මගින් මෙහෙයවනු ලබන) රු. | ආරක්ෂාව සම්බන්ධ වෙනත් සිදුවීම් | උසස්වීම් / මාරු කිරීම් / නව / විශ්‍රාම ගැන්වීම් |
|---|---|---|---|---|
| කටුනායක අ.සැ.ක. | 457 | 5,663,413.00 | 07 | P=1, T=1, R=2, N=1 |
| බියගම අ.සැ.ක. | 05 | 1,820,560.00 | 04 | P=1 |
| කොග්ගල අ.සැ.ක. | 01 | 1,628,320.00 | 02 | - |
| මහනුවර කාර්මික උද්‍යානය / මධ්‍යම කලාප කාර්යාලය | 01 | 924,220.00 | 02 | N=2 |
| සීතාවක අ.සැ.ක. | 01 | 4,505,500.00 | - | N=1 |
| හොරණ අ.සැ.ක. | 02 | 8,079,475.00 | 01 | - |
| තුල්හිරිය - වයඹ කලාපීය කාර්යාලය | - | - | - | - |
| මාවතගම අ.සැ.ක. | 20 | 806,600.00 | 02 | - |
| පොල්ගහවෙල අ.සැ.ක. | 07 | 778,070.00 | 04 | - |
| වතුපිටිවල අ.සැ.ක. | 03 | 4,573,175.00 | - | - |
| මල්වත්ත අ.සැ.ක. | - | 989,705.00 | - | - |
| මීරිගම අ.සැ.ක. | 08 | 955,200.00 | - | - |
| මිරිජ්ජවිල අ.සැ.ක. | - | - | - | - |
| යාපනය කලාප කාර්යාලය | - | - | - | - |
| ත්‍රිකුණාමලය අපනයන කලාපය | - | - | - | - |
| ප්‍රධාන කාර්යාලය / BJM | - | - | - | - |

### ගිනි නිවීම්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ගිනි නිවීම් ඒකක කටුනායක, බියගම හා සීතාවක අපනයන සැකසුම් කලාප පදනම් කරගෙන පිහිටුවා ඇත. මෙහිදී කම්කරුවන්ට ආරක්ෂිත සේවා පරිසරයක් ලබාදීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරා ඇත. මෙම කලාපවල සැලකිය යුතු කර්මාන්තශාලා සංඛ්‍යාවක් පිහිටා ඇති අතර එම කර්මාන්තශාලා සංඛ්‍යාව දිනෙන් දින වැඩිවේ. කලාපවල හදිසි තත්ත්වවලට අමතරව, කර්මාන්ත ශාලාවේ සේවයේ නියුතු පුද්ගලයන්ට ගිනි නිවීමේ කටයුතු පිළිබඳව පුහුණුවක් ලබා දීමේදී හා මෙම ප්‍රදේශවලට ප්‍රභූ පුද්ගලයන් සංචාරය කිරීමේදී ද, මෙම කලාපවලින් පිටත හා කලාපයට ඉතා ආසන්න ප්‍රදේශවල හදිසි අවස්ථා සඳහා ද මෙම ගිනි නිවීමේ ඒකක යෙදවේ. ප්‍රදේශයේ පොලිස් ස්ථානවල හා ආසන්නතම යුධ හමුදා කඳවුරුවල බලධාරීන් සමඟ සමායෝජන කටයුතු සිදු කරමින් සියළුම ගිනි නිවීම් කටයුතු මෙම ගිනි නිවීමේ ඒකක මගින් සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ප්‍රධාන කාර්යාලය ගිනි නිවීමේ කටයුතු සඳහා "ඕවර්සීස් රියල්ටි" ආයතනයේ හා කොළඹ ගිනි නිවීමේ ඒකකයේ සහාය ලබා ගන්නා අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ගිනි නිවීමේ ඒකක ස්ථාපනය කර නොමැති කලාපවල ගිනි නිවීමේ කටයුතු සඳහා මහ නගර සභාවල, ආසන්නතම යුධ හමුදා හා නාවික හමුදා කඳවුරුවල සහාය ලබා ගනියි.

- ගිනි ගැනීම් සම්බන්ධ ඇමතුම් සඳහා මෙන්ම හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම.
- ගිනි ගැනීම් වැළැක්වීමේ වාර්ෂික පිරික්සීම් කටයුතු තුළින් ගින්නක් හට ගැනීමේ අවදානම පිළිබඳව ඇගයීම් සිදු කිරීම.
- කර්මාන්තශාලාවල කාර්ය මණ්ඩල / සේවකයන් වෙනුවෙන් ගිනි ගැනීම්වල දී පුද්ගලයන් ඉවත් කිරීමේ අභ්‍යාස හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කාර්ය මණ්ඩලයට / කර්මාන්තශාලා සේවකයන්ට ගිනි නිවීමේ උපකරණ මෙහෙයවීම / ප්‍රථමාධාර පිළිබඳ පුහුණුවීම් ලබා දීම.
- වෙළඳ ව්‍යාපාර සඳහා අනුකූලතා සහතික, ගිනි නිවීමේ සහතික හා අනතුරුදායක ස්ථානවලින් පුද්ගලයන් ඉවත් කිරීමේ සහතික නිකුත් කිරීම.
- කර්මාන්තශාලාවල ගිනි නිවීමේ උපකරණ සවි කිරීම පිළිබඳව උපදේශනය.
- කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා ගිනි නිවීමේ උපකරණ දෛනිකව පරීක්ෂා කිරීම.
- ගිනි නිවීමේ උපකරණ සර්විස් කිරීම.
- කලාප කළමනාකරණයට සම්බන්ධ හදිසි තත්ත්වවලට ප්‍රතිචාර දැක්වීම.

**ගිනි නිවීම් හා සම්බන්ධ මෙහෙයුම් කටයුතු - කාර්යසාධනය - 2013 වසර**

| ප්‍රදේශය | මිනිසුන් ඉවත් කිරීමේ අභ්‍යාස සහ විමර්ශන | ප්‍රතිචාර දක්වන ලද ගිනි නිවීම් ඇමතුම් සංඛ්‍යාව | වෙනත් වැඩසටහන් |
|---|---|---|---|
| කටුනායක අ. සැ. ක. | 94 | 17 | 35 |
| බියගම අ. සැ. ක. | 64 | 38 | 51 |
| සීතාවක අ. සැ. ක. | 85 | 27 | 43 |

**වෙනත් වැදගත් සිදුවීම්**

- ගිනි නිවීමේ වාහන ලබා ගැනීම සඳහා ජපාන තානාපති කාර්යාලය සමඟ සාර්ථක අන්දමින් සාකච්ඡා පැවැත්වීම.

- 2013-07-24 දින කටුනායක අපනයන සැකසුම් කලාපයේ ක්‍රියාත්මක කළ රැගෙන යා හැකි TOHATSU ගිනි නිවන පොම්පය.

- 41-4081 දරන ගිනි නිවීමේ වාහනය සම්පූර්ණයෙන් අළුත්වැඩියා කර කටුනායක අපනයන සැකසුම් කලාපයේ එන්ජිමට / පොම්පයට සම්බන්ධ කර ඇත.

- කටුනායක නිදහස් වෙළඳ කලාපයේ පැවති ගිනි නිවීමේ වාහන නැවතුම් පොළ ගිනි නිවීමේ බර වාහන ගාල් කිරීමේ අරමුණින් නැවත ඉදිකරනු ලැබීය.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් 4ක් සිදු කර ඇත. උදාහරණයක් ලෙස මහනුවර ආරක්ෂක ඒකකයට සේවකයන් දෙදෙනෙකු (02) ද, කටුනායක නිදහස් වෙළඳ කලාපයට එක (01) සේවකයකු ද, සීතාවක අපනයන සැකසුම් කලාපයට එක (01) සේවකයකු බැගින් ද බඳවා ගෙන ඇත.

# 15. මානව සම්පත් කළමනාකරණ අංශය

**මානව සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්**

මානව සම්පත් කළමනාකරණ අංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම දරන ප්‍රධාන අංශ වේ. එහි ප්‍රධාන කටයුතු වන්නේ,

● මානව සම්පත් සැලසුම්කරණය
- වර්තමාන සහ අනාගත මානව සම්පත් අවශ්‍යතා ඇගයීම.
- උක්ත අවශ්‍යතා සපුරාලීම සඳහා බඳවා ගැනීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

● කාර්යසාධන ඇගයීම
- සේවක කාර්යසාධනය වාර්ෂිකව සමාලෝචනය කොට ඇගයීමට ලක් කරනු ලැබේ.
- සේවකයන්ගේ කාර්යසාධනය මත වාර්ෂික වැටුප් වැඩිකිරීම් ලබාදීම.
- සේවකයන්ගේ කාර්යසාධනය, සුදුසුකම් සහ පළපුරුද්ද මත ඔවුන් ඉහළ ශ්‍රේණිවලට උසස් කිරීම.

● මානව සම්පත් සංවර්ධනය
- පුද්ගල සහ සංවිධානමය සාර්ථකත්වය වර්ධනය කර ගැනීම සඳහා පුහුණු හා වෘත්තීය සංවර්ධන ප්‍රයත්න ඒකාබද්ධව භාවිතා කිරීම. එමගින්, ඔවුන්ගේ වර්තමාන රැකියා කටයුතු කිරීමට අවශ්‍ය වන ප්‍රධාන ශක්‍යතා පුද්ගලයන් තුළ සංවර්ධනය කළ හැකිවන අතරම මනාව සැලසුම් කරන ලද ඉගෙනුම් ක්‍රියාකාරකම් තුළින් අනාගත රැකියා ප්‍රවර්ධනය සඳහා ද අවකාශ සැලසීම.

● විනය පවත්වාගෙන යාම
- සේවකයන්ගේ විනය පවත්වාගෙන යාම හා දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- කම්කරු කාර්යාංශ, කම්කරු දෙපාර්තමේන්තුව, මානව සම්පත් කවුන්සල සහ අධිකරණ වැනි බාහිර ආයතනවල කම්කරු ගැටළු සම්බන්ධයෙන් සහභාගී වීම.

● පැමිණීම හා නිවාඩු පවත්වාගෙන යාම

● සේවක සුබසාධන සේවා
- විවිධ ආකාරයේ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ජීවිත හා ආබාධ සඳහා රක්ෂණ පහසුකම්, වෛද්‍ය පහසුකම්, අවමංගල්‍ය ආධාර යෝජනා ක්‍රමය, නිල බස් ප්‍රවාහන සේවාව, ප්‍රවාහන සහන සහ පැමිණීමේ දිරි දීමනා යෝජනා ක්‍රම ආදිය ක්‍රියාත්මක කිරීම.

**2013 වසරේදී අත්පත් කරගත් ජයග්‍රහණ / කාර්ය සාධනය**

● ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවකයන්ට කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිය.

● මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතියේ කාර්යසාධන කළමනාකරණ මොඩියුලය හඳුන්වා දෙනු ලැබිය.

● 2013 වසරේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි 35 වන සංවත්සරය සැමරූ අවස්ථාවේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවකයන් උදෙසා අභිනන්දන උළෙලක්ද පවත්වනු ලැබිය.

● ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් විධායක නිලධාරීන් හතර (04) දෙනෙකු ද, කළමනාකරණ සහකාර ප්‍රභේදයේ සේවකයන් විසි හතර (24) දෙනෙකු ද, ප්‍රාථමික මට්ටමේ සේවකයින් තිස් හය දෙනෙකු (36) දෙනෙකු ද ආයෝජන මණ්ඩලයේ සේවය කිරීම සඳහා අළුතින් බඳවා ගන්නා ලදී.

● කොන්ත්‍රාත්තු පදනම යටතේ සේවය කළ සේවකයන් දහනව (19) දෙනෙක් ද, අනියම් පදනම මත සේවය කළ සේවකයන් තිදෙනෙක් (03) ද ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරනු ලැබූහ.

● විධායක ශ්‍රේණියේ නිලධාරීන් එකසිය විසි තුන් දෙනෙක් (123) ද, කළමනාකරණ සහකාර ප්‍රභේදයේ සේවකයන් තිදෙනෙක් (03) ද, ප්‍රාථමික මට්ටමේ සේවකයන් හය දෙනෙක් ද (06) ඉහළ ශ්‍රේණිවලට උසස් කරනු ලැබූහ.

● විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් හැදෑරීම සඳහා නිලධාරීන් පහළොස් (15) දෙනෙකුට මූල්‍ය අනුග්‍රහය ලබාදෙනු ලැබූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවකයන්ට විදේශීය පුහුණු අවස්ථා තිස් පහක් (35) ක්ද සපයනු ලැබිය. තවද, සේවකයන් 876 ක් සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් එකොළහ (11) ක් ද, සේවකයන් 338 දෙනෙකුට බාහිර පුහුණු ආයතනවලදී රැකියා ආශ්‍රිත පුහුණු වැඩසටහන් ද ලබා දෙනු ලැබිය.

● පුද්ගලයන් හතළිස් පහක (45) කට රැකියාවේ නියැළී සිටිය දී පිළිගත් විශ්වවිද්‍යාල හා වෘත්තීය පුහුණු ආයතනවලින් මූල්‍යය හා ගණකාධිකරණය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, පරිගණක යෙදවුම්, ලඝු ලේඛනය, ලේකම් පරිචය, තාක්ෂණික පුහුණුව හා විගණනය යන ක්ෂේත්‍ර සම්බන්ධ පුහුණු අවස්ථා පිරිනමනු ලැබිය.

## ප්‍රධාන කාර්යසාධන ක්ෂේත්‍ර සංසන්දනය කිරීම - 2012 සහ 2013




| | නව බඳවාගැනීම් | ඉවත් කිරීම | කාර්යමණ්ඩල පුහුණු කිරීම |
|---|---|---|---|
| 2012 | 87 | 197 | 912 |
| 2013 | 64 | 132 | 1264 |

## සපයනු ලැබූ පුහුණුව සැසඳීම - 2012 සහ 2013




| | සේවාස්ථ පුහුණුව | විවිධ ක්ෂේත්‍ර | විදේශ පුහුණුව | ශාස්ත්‍රපති විද්‍යාපති උපාධි |
|---|---|---|---|---|
| 2012 | 528 | 362 | 10 | 12 |
| 2013 | 876 | 338 | 35 | 15 |

## සේවාස්ථ පුහුණුව - 2012 සහ 2013




| | | | |
|---|---|---|---|
| 2012 | 288 | 179 | 61 |
| 2013 | 231 | 484 | 161 |

## විවිධ ක්ෂේත්‍ර (කෙටි) 2012 සහ 2013




| | | | |
|---|---|---|---|
| 2012 | 261 | 90 | 11 |
| 2013 | 246 | 88 | 4 |

## විදේශ පුහුණුව - 2012 සහ 2013




| | |
|---|---|
| 2012 | 10 |
| 2013 | 35 |

## ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි වැඩසටහන 2012 සහ 2013




| | |
|---|---|
| 2012 | 12 |
| 2013 | 15 |




| | |
|---|---|
| විධායක නිලධාරීන් | 496 |
| කළමනාකරණ සහකාරවරු | 406 |
| ප්‍රාථමික මට්ටමේ සේවකයන් | 291 |
| මුළු කාර්ය මණ්ඩලය | 1193 |

ශ්‍රම බලකාය - වයස් කාණ්ඩය අනුව (2013-12-31 දින වන විට)

| | විධායක | කළමනාකරණ සහකාර | ප්‍රාථමික මට්ටමේ සේවකයන් | එකතුව |
|---|---|---|---|---|
| >=55 | 113 | 29 | 35 | 177 |
| 50-54 | 131 | 35 | 67 | 233 |
| 45-49 | 125 | 87 | 43 | 255 |
| 40-44 | 67 | 80 | 41 | 188 |
| 35-39 | 42 | 41 | 36 | 119 |
| 30-34 | 14 | 72 | 40 | 126 |
| 25-29 | 03 | 45 | 20 | 68 |
| <=24 | 01 | 17 | 09 | 27 |
| | 496 | 406 | 291 | 1193 |



## ශ්‍රී ලංකා ශ්‍රම බලකායේ වයස් මට්ටම විශ්ලේෂණය - 2013




### ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ශ්‍රම බලකාය ස්ත්‍රී / පුරුෂ භාවය අනුව විශ්ලේෂණය කිරීම - 2013.12.31 දිනට

| ශ්‍රේණිය | ස්ත්‍රී පුරුෂ භවය | | එකතුව |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| සභාපති | 01 | 00 | 01 |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 | 01 |
| විධායක අධ්‍යක්ෂ | 06 | 03 | 09 |
| අධ්‍යක්ෂ | 17 | 05 | 22 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ | 30 | 12 | 42 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 73 | 39 | 112 |
| සහකාර අධ්‍යක්ෂ | 59 | 55 | 114 |
| කනිෂ්ඨ කළමනාකරු | 104 | 91 | 195 |
| කළමනාකරණ සහකාරවරු | 227 | 179 | 406 |
| ප්‍රාථමික මට්ටමේ සේවකයන් | 286 | 05 | 291 |
| එකතුව | 804 | 389 | 1193 |

### කාර්ය මණ්ඩලය - ස්ථානවලට අනුව 2013-12-31 දින වන විට

| | විධායක | කළමනාකරණ සහකාර | කළමනාකරණ සහකාරප්‍රාථමික මට්ටමේ සේවකයන් | අදාළ ස්ථානයේ සිටින මුළු කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| (WTC ) ප්‍රධාන කාර්යාලය | 228 | 133 | 91 | 452 |
| (CVT )ඔරුගොඩවත්ත | 23 | 13 | 5 | 41 |
| (ACT )කටුනායක | 11 | 8 | 6 | 25 |
| කටුනායක අ.සැ.ක. | 81 | 80 | 44 | 205 |
| බියගම අ.සැ.ක. | 64 | 65 | 43 | 172 |
| දකුණු කලාප කාර්යාලය)කොග්ගල අ.සැ.ක. | 20 | 26 | 45 | 91 |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | 13 | 6 | 8 | 27 |
| මීරිගම අපනයන සැකසුම් කලාපය | 5 | 5 | 3 | 13 |
| මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය | 4 | 2 | 2 | 8 |
| සීතාවක අ.සැ.ක. | 13 | 26 | 16 | 55 |

**2013 වසර තුළ නව බඳවා ගැනීම්**

| තනතුර | බඳවා ගත් සේවකයන් සංඛ්‍යාව |
|---|---|
| විධායක කාර්යය මණ්ඩලය | |
| සහකාර අධ්‍යක්ෂ | 01 |
| කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවකයන් | 03 |
| මුළු නව බඳවා ගැනීම් - විධායක | 04 |
| කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය | |
| කළමනාකරණ සහකාර | 17 |
| තාක්ෂණික සහකාර | 05 |
| සැලසුම් ශිල්පි | 01 |
| ගිනි භට | 01 |
| මුළු නව බඳවා ගැනීම් - කළමනාකරණ සහකාර | 24 |
| ප්‍රාථමික මට්ටමේ සේවකයන් | |
| ආරක්ෂක නියාමක | 03 |
| රියදුරු | 02 |
| කාර්යාල / සහායක / කම්කරු | 31 |
| මුළු නව බඳවා ගැනීම් - ප්‍රාථමික මට්ටම | 36 |
| 2013 වසර තුළ මුළු නව බඳවා ගැනීම් සංඛ්‍යා | 64 |



### 2013 වසර තුළ සිදු කරන ලද සිරස් සේවා නියුක්තිය (උසස් කිරීම්)

| ශ්‍රේණිය | ඊළඟ ඉහළ ශ්‍රේණියට උසස් කරන ලද සේවකයන් සංඛ්‍යාව |
|---|---|
| **විධායක කාර්ය මණ්ඩලය** | |
| අධ්‍යක්ෂ | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 05 |
| සහකාර අධ්‍යක්ෂ | 04 |
| කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවකයන් | 109 |
| මුළු විධායක කාර්ය මණ්ඩල උසස් කිරීම් | 123 |
| **කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය** | |
| කළමනාකරණ සහකාර | 03 |
| මුළු කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩල උසස් කිරීම් | 03 |
| **ප්‍රාථමික මට්ටමේ සේවකයන්** | |
| ප්‍රාථමික මට්ටමේ සේවකයන් | 06 |
| මුළු ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩල උසස් කිරීම් | 06 |
| 2013 වසර තුළ සිදු කරන ලද මුළු උසස් කිරීම් සංඛ්‍යාව | 132 |




### 2013 වර්ෂය තුළ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් පිළිබඳ සාරාංශය

| | විධායක | කළමනාකරණ සහකාර | ප්‍රාථමික | එකතුව මට්ටමේ සේවකයන් |
|---|---|---|---|---|
| විදේශ පුහුණු අවස්ථා | 35 | - | - | 35 |
| විද්‍යාවේදී / ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් | 15 | - | - | 15 |
| දේශීය පුහුණුවීම් (මෘදු නිපුණතා) | 246 | 88 | 4 | 338 |
| සේවාස්ථ පුහුණු වැඩසටහන් | 231 | 484 | 161 | 876 |
| එකතුව | 527 | 572 | 165 | 1,264 |

# 16. අභ්‍යන්තර විගණන කටයුතු

2013 වසර තුළදී සිදු කරනු ලැබූ අභ්‍යන්තර විගණන කටයුතු මගින් ප්‍රධාන කාර්යාලය හා කලාප ආවරණය කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පාලන පරිසරයේ ඵලදායිතාව සම්බන්ධයෙන් සමතුලිත ඇගයීමක් ලබාදෙනු ලැබීය.

සංවිධාන පද්ධති, ක්‍රියාවලි, මෙහෙයුම් හා මූල්‍ය ක්‍රියාකාරකම්වල ඍජු බව සත්‍යාපනය කිරීමට හා සුරක්ෂිත කිරීමට විධිමත් පාරදෘශ්‍ය ක්‍රියාවලියක් අනුගමනය කරනු ලැබීය. මේ සඳහා අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව හා ඵලදායිතාව කලින් කලට අධීක්ෂණය කරනු ලැබූ අතර අතපසුවීම් පිළිබඳව හෝ විශේෂ / ක්ෂණිකව අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර පිළිබඳව නියමිත කාලයේ දී වාර්තා කරනු ලැබීය.

තවද, මෙම වසර සඳහා අභ්‍යන්තර විගණන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ගනුදෙනු පිළිබඳව හා අනෙකුත් අදාළ ක්ෂේත්‍ර පිළිබඳව ස්වාධීන පරීක්ෂණ සිදුකරනු ලැබූ අතර ක්‍රියාත්මකව පවතින පද්ධති සඳහා ඉදිරි වැඩි දියුණු කිරීම් සිදු කිරීම පහසු වන පරිදි කළමනාකරණය වෙත ධනාත්මක යෝජනා ද ඇතුළත් කරමින් වාර්තා ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලැබීය.

මූල්‍ය විගණන, කාර්ය සාධන විගණන, කොන්ත්‍රාත්තු විගණන හා පවත්නා පිළිවෙල පිළිබඳ විගණන සිදු කිරීම 2013 වසරේ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබූ විගණන වේ. පවත්නා පිළිවෙළ පිළිබඳව විධිමත් පරිදි සත්‍යාපනය කිරීමට අමතරව මහජනතාවගේ අයිතිවාසිකම් / දේපළ ආරක්ෂාව සඳහා විශේෂ විමර්ශන සිදුකිරීම පිළිබඳව මෙන්ම බාහිර පාර්ශ්ව සමඟ කාර්යක්ෂම හා ඵලදායි අන්දමින් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම පිළිබඳව ද අභ්‍යන්තර විගණන අංශය වගකිව යුතුය.

අගය එකතු කළ ක්‍රියාවලි, උදාහරණ වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ISO 9001 : 2008 අන්තර්ජාතික ප්‍රමිති මත පදනම් වූ තත්ත්ව කළමනාකරණ පද්ධතියේ අභ්‍යන්තර තත්ත්ව විගණන ද අභ්‍යන්තර තත්ත්ව විගණන කණ්ඩායම විසින් සිදු කරනු ලැබූ අතර 2013 වසර තුළ අභ්‍යන්තර තත්ත්ව විගණන කණ්ඩායම විසින් ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර අංශවල හා අනෙකුත් මෙහෙයුම් ස්ථාන 11ක අභ්‍යන්තර තත්ත්ව විගණන චක්‍රයක් බැගින් සම්පූර්ණ කර ඇත.

## විගණන කමිටු වාර්තාව

අංක PF/PE3 හා 1999.11.19 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව සංස්ථාපනය කරනු ලැබූ විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| 1. | සභාපති - | අනුර ජයසිංහ මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික) |
| 2. | සාමාජික - | සංජීව වික්‍රමනායක මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික) |
| 3. | සාමාජික - | චන්න පලන්සූරිය මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික) |
| 4. | සාමාජික - | කේ.එම්.එම්. සිරිවර්ධන මහතා ( මහා භාණ්ඩාගාර නියෝජිත) |
| 5. | සාමාජික - | ජගත් විජේවීර මහතා (ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජෙනරාල්) |

වැඩබලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන * ප්‍රධාන කාර්යාලය) විගණන කමිටුවේ ලේකම්/කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබීය.

රජයේ විගණන දෙපාර්තමේන්තුවේ කණ්ඩායම් නිලධාරී විගණකාධිපති නියෝජනය කරමින් නිරීක්ෂකයකු ලෙස විගණන කමිටුවට සහභාගී විය.
2013.12.31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ විගණන කමිටු රැස්වීම් 4 ක් පවත්වනු ලැබීය.

අවදානමක් පවතින බව හඳුනාගත් ක්ෂේත්‍ර හා ප්‍රධාන අභ්‍යන්තර පාලන ක්ෂේත්‍ර මත අවධානය යොමුකරමින් සකස් කරනු ලැබූ අභ්‍යන්තර විගණන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම මගින් විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණනයේ අරමුණු තවදුරටත් තහවුරු කරනු ලැබීය.

මෙම විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණක සමඟ නිරන්තර සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් ද අභ්‍යන්තර විගණන වාර්තාවලින් ලබාගන්නා ලද තොරතුරු භාවිත කරමින් ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අභ්‍යන්තර පාලන රාමුවේ අවදානම හා ඵලදායිතාව තක්සේරු කිරීම සමාලෝචනය කරනු ලැබූ අතර අපගමනයන්/උල්ලංඝණය කිරීම් වාර්තා වූ අවස්ථාවල ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නියෝග ලබා දෙනු ලැබීය.

සියලුම වැදගත් අංශ ඇතුළත් වන පරිදි කමිටුව සඳහා කොන්දේසි හා සමුද්දේශ සම්පාදනය කර ඇති බව විගණන කමිටුවේ මතය වේ.

# මූල්‍ය සමාලෝචනය - 2013

2013 වර්ෂය සඳහා අතිරික්තය රුපියන් මිලියන 290.92 ක් විය. 2012 සිට 2013 දක්වා කාල සීමාව තුළ ශුද්ධ අතිරික්තය 21.66% ක වර්ධනයක් වාර්තා කර ඇත.

| **මූල්‍යමය වශයෙන් වැදගත් අවස්ථා** | **2013** | **2012** | **වෙනස %** |
|---|---|---|---|
| ආදායම | 2,721.81 | 2,226.37 | 22.25 |
| වියදම | 2,493,38 | 2,088.77 | (19.37) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල | 228.43 | 137.60 | 66.01 |
| ශුද්ධ මූල්‍ය ආදායම | 85.12 | 130.49 | (34.77) |
| බදු අයකිරීමට පෙර අතිරික්තය | 313.55 | 268.09 | 16.96 |
| ආදායම් බදු සඳහා වියදම් | 22.63 | 28.96 | 21.86 |
| වසර සඳහා අතිරික්තය | 290.92 | 239.13 | 21.66 |
| මූල්‍ය ආදායම | 100.77 | 133.25 | (24.38) |
| රජයේ අයබදු පැනවීම | 148.12 | 47.81 | (209.78) |

## ආදායම

පූර්ව වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 2,359.62 සාපේක්ෂව 2013 වසරේදී, රුපියල් මිලියන 2,822.58 ක් දක්වා මුළු ආදායමේ වර්ධනයක් ලබා ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත් වී ඇත. මෙය පූර්ව වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 462.96 (19.62%) ක වර්ධනයකි.

ආදායම සඳහා ප්‍රධාන වශයෙන් දායක වන ආනයන / අපනයන සේවා ගාස්තු 2013 වර්ෂයේ දී රු. මිලියන 179.01 කින් වර්ධනය වී රු. මිලියන 809.69 දක්වා අගයක් වාර්තා කර තිබේ. 2012 සිට 2013 දක්වා කාල සීමාව තුළ බිම් කුලී ආදායම 22% ක වර්ධනයක් වාර්තා කර තිබේ.

2012 සිට 2013 දක්වා කාල සීමාව තුළ අඩු පොලී අනුපාත පැවතීම හා මණ්ඩලය සතු ආයෝජන ප්‍රමාණය පහත වැටීම හේතුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මුළු ආයෝජන ආදායම ද 30%කින් පහත වැටී ඇත.

2013 වසර සඳහා පොලී ආදායම රු. මිලියන 79.0 ක් විය.

## ආදායම් සංයුතිය






**වියදම**

පූර්ව වර්ෂයේ රුපියල් මිලියන 2,088.77 ක් වූ රජයේ අයබදු පැනවීම් හා ආයෝජන ප්‍රවර්ධන වියදම ඇතුළත් මුළු මෙහෙයුම් වියදම 2013 වසරේ 19.37% ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් මිලියන 2,493.38 දක්වා වැඩිවී ඇත.

පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව සඳහා සිදුකරන ලද වියදම් හේතුකොට ගෙන ආයෝජන ප්‍රවර්ධන වියදම 378% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 116.5 ක් දක්වා වැඩිවී ඇත.

පූර්ව වර්ෂයේ ගෙවනු ලැබූ රුපියල් මිලියන 76.77 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජය විසින් පනව ලද අයබදු හා වෙනත් බදු ලෙස රුපියල් මිලියන 170.74ක් ගෙවා තිබේ. 2013 වසරේදී යෙදවුම් සඳහා තහනම් කරන ලද වැට් බදු අවශෝෂණය කිරීම මෙයට ප්‍රධාන හේතුව විය.







**ප්‍රාග්ධන වියදම**

2013 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 671.74 ක් වූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මෙම මුළු ප්‍රාග්ධන වියදම අභ්‍යන්තර වශයෙන් උත්පාදනය කළ අරමුදල් මගින් ආවරණය කරනු ලැබීය.




මූල්‍ය වාර්තාකරණය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2012 වසරේ සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුගතව කටයුතු කිරීම ආරම්භ කළ අතර 2013 දෙසැම්බර් 31 වන විට පිළියෙල කරන ලද සියලුම මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති / ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇත.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
## ආදායම් ප්‍රකාශය
## 2013 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා

| | 2013 (රු.) | 2012 (රු.) |
|---|---|---|
| ආදායම | 2,715,788,306 | 2,226,369,460 |
| අඩු කළා : වියදම් | | |
| මෙහෙයුම් වියදම් | 337,242,895 | 230,057,542 |
| පරිපාලන වියදම් | 1,984,841,156 | 1,779,948,800 |
| රාජ්‍ය බදු | 148,175,366 | 47,814,539 |
| අනෙකුත් වියදම් | 24,300,318 | 30,949,090 |
| මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵල | 221,228,570 | 137,599,489 |
| මූල්‍ය ආදායම | 100,765,279 | 133,254,211 |
| මූල්‍ය වියදම | 15,646,075 | 2,768,533 |
| ශුද්ධ මූල්‍ය ආදායම | 85,119,204 | 130,485,678 |
| බදු වලට පෙර අතිරික්තය | 306,347,774 | 268,085,167 |
| බදු වියදම | 22,627,258 | 28,960,401 |
| වර්ෂය සඳහා අතිරික්තය | 283,720,516 | 239,124,766 |

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
## 2013 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා
## සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය

| | 2013 (රු.) | 2012 (රු.) |
|---|---|---|
| වර්ෂයේ අතිරික්තය | 283,720,516 | 239,124,766 |
| අනෙකුත් සවිස්තරාත්මක ආදායම් | | |
| IFRS ගැලපීම් කාර්ය මණ්ඩල ණය සඳහා පොලී | 20,237,830 | - |
| අඩුකළා : නිර්වචිත දායක සැලැස්ම ආයු ගණක අලාභය | 6,283,354 | 10,046,932 |
| කාර්ය මණ්ඩල ණය සඳහා කාර්ය මණ්ඩල පිරිවැය | 20,237,830 | - |
| අනෙකුත් සවිස්තරාත්මක ආදායම් | 6,283,354 | 10,046,932 |
| කාල පරිච්ඡේදය සඳහා මුළු සවිස්තරාත්මක ආදායම | 229,077,834 | 67,340,138 |

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**
**ආදායම් ප්‍රකාශය**
**2013 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | 2013<br>(රු.) | 2012<br>(රු.) |
|---|---|---|
| 2013 දෙසම්බර් 31 වන විට වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, යන්ත්‍රාගාර හා උපකරණ | 5,406,281,658 | 5,141,911,192 |
| ආයෝජන දේපල | 16,788,683,782 | 16,901,087,700 |
| ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු | 838,860,038 | 882,006,868 |
| මූල්‍ය වත්කම් | 430,811,757 | 428,647,715 |
| මුළු ජංගම නොවන වත්කම් | 23,464,637,236 | 23,353,653,475 |
| ජංගම වත්කම් | | |
| ඉන්වෙන්ටරි | 13,394,315 | 14,135,711 |
| අපහරණය සඳහා වන නිවාස | 2,551,000 | 4,051,000 |
| මූල්‍ය වත්කම් | 148,523,279 | 147,908,417 |
| වෙළඳ ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් | 170,968,291 | 209,093,547 |
| ඉදිරි ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු මුදල් | 73,618,778 | 76,666,466 |
| මුදල් හා මුදල් සාම්‍යතා | 811,476,128 | 276,374,467 |
| මුළු ජංගම වත්කම් | 1,220,531,792 | 728,229,608 |
| මුළු වත්කම් | 24,685,169,028 | 24,081,883,083 |
| කොටස් හිමිකම් සහ වගකීම් | | |
| කොටස් හිමිකම් | 6,680,775,289 | 6,528,728,331 |
| සමුච්චිත අරමුදල | 15,340,693,234 | 15,340,693,234 |
| අරමුදල් හා සංචිත | 22,021,468,523 | 21,869,421,565 |
| විලම්භිත ආදායම් | 2,094,695,897 | 1,792,358,277 |
| විලම්භිත වියදම් | -431,686,729 | -440,993,614 |
| | 1,663,009,167 | 1,351,364,664 |
| මුළු කොටස් හිමිකම් | 23,684,477,690 | 23,220,786,230 |
| ජංගම නොවන වගකීම් | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා බැඳීම් | 224,062,180 | 200,458,966 |
| වසරකට පසුව එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | 54,912,130 | 54,359,796 |
| මුළු ජංගම නොවන වගකීම් | 278,974,310 | 254,818,762 |
| ජංගම වගකීම් | | |
| වසරක් තුළ එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | 14,393,354 | 9,434,642 |
| උපචිත වියදම් හා ගෙවිය යුතු වෙනත් මුදල් | 702,395,961 | 589,761,254 |
| ගෙවිය යුතු බදු | 4,927,712 | 7,082,195 |
| මුළු ජංගම වගකීම් | 721,717,028 | 606,278,091 |
| මුළු සාමාන්‍ය කොටස් හා වගකීම් | 24,685,169,028 | 24,081,883,083 |

පිටු අංක 09 සිට 24 දක්වා පිළියෙළ කර ඇති "මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබා ඇත.

ආචාර්ය ලක්ෂ්මන් ජයවීර මහතා
සභාපති
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

එස්. පී. ද. එස්. මුතුකුමාරණ මිය
අධ්‍යක්ෂ (මූල්‍ය)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**
**සාමාන්‍ය කොටස් ප්‍රමාණ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**
**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සමුච්චිත අරමුදල (රු.) | ප්‍රත්‍යාගණන සංචිත (රු.) | මුළු සාමාන්‍ය කොටස් ප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 7,362,128,981 | 15,340,693,235 | 22,702,822,216 |
| වසර සඳහා අතිරික්තය | 229,077,834 | - | - |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් ආයතනයෙන් මෝටර් වාහනය මාරු කිරීම මගින් ලද ලාභය | 1,840,000 | - | - |
| පූර්ව වර්ෂය සඳහා ගැළපීම් | (43,544,675) | - | - |
| මහ භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම් | (1,000,000,000) | - | - |
| පුත්තලමේ පිහිටි ඉඩම සම්බන්ධ වියදම් මාරු කිරීම | (11,270,121) | - | - |
| ගිණුම් නොතැබූ ස්ථාවර වත්කම් ඇගයීම | - | - | - |
| අති විශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම | (9,503,691) | - | - |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 6,528,728,331 | 15,340,693,235 | 21,869,421,566 |
| වසර සඳහා අතිරික්තය | 284,637,643 | - | - |
| පූර්ව වර්ෂය සඳහා ගැළපීම් | (39,931,716) | - | - |
| මාරු කරන ලද ඉඩම් | (84,006,960) | - | - |
| ගිණුම් නොතැබූ ස්ථාවර වත්කම් ඇගයීම | 109,740 | - | - |
| අති විශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම | (1,561,266) | - | - |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,687,975,770 | 15,340,693,235 | 22,028,669,005 |

පිටු අංක 09 සිට 24 දක්වා පිළියෙළ කර ඇති "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2013 දෙසැම්බර් 31 වනදායින් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා

| | 2013<br>**රු. මිලියන** | **2012**<br>**රු. මිලියන** |
|---|---|---|
| 2013 දෙසැම්බර් 31 වනදායින් අවසන් වන කාල පරිච්ඡේදය | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය | | |
| මෙහෙයුම්වලින් උත්පාදනය වූ මුදල් | 1,166.35 | 844.03 |
| ගෙවූ ආදායම් බදු | (24.78) | (29.35) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගෙවීම | (13.58) | (13.16) |
| පසුගිය වර්ෂය සඳහා ගැළපීම් | (39.93) | 43.54) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / ගලා යෑම් | 1,088.06 | 757.98 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහයන් | | |
| ආයෝජන ආදායම | 107.55 | 132.11 |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (58.95) | (106.65) |
| ස්ථාවර වත්කම් විකිණීම් උත්පාදන | 33.28 | 9.40 |
| ස්ථාවර තැන්පතු | (0.25) | (0.22) |
| මහා පරිමාණ ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම | (1.56) | (8.00) |
| ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු | (463.70) | (732.37) |
| විශේෂ ව්‍යාපෘති | (125.31) | (18.12) |
| විලම්භිත වියදම් | (28.98) | (21.44) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / ගලා යෑම් | (537.93) | (745.30) |
| මූල්‍යකරණ කටයුතුවලින් මුදල් ප්‍රවාහයන් | - | |
| මූල්‍යකරණ කටයුතුවලින් මාරු කරන ලද අරමුදල් | (15.03) | (1,000.00) |
| පොලී ගෙවීම් | (15.03) | (2.15) |
| මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / ගලා යෑම් | 535.11 | (1,002.15) |
| මුදල් සහ මුදල් සාම්‍යතාවල ශුද්ධ වැඩිවීම් /(අඩුවීම්) | 276.37 | (989.47) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සාම්‍යතා | 811.48 | 1,265.84 |
| | | 276.37 |
| වසර අවසානයේ දී මුදල් හා මුදල් සාම්‍යතා සටහන | | |
| සටහන | | |
| මුදල් හා මුදල් සාම්‍යතා විශ්ලේෂණය කිරීම | 811.48 | 276.37 |
| බැංකු හා මුදල් ශේෂ | | |
| | 811.48 | 267.37 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 1. වාර්තාකරණ ආයතනය

1978 අංක 04 දරණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ස්ථාපනය කර තිබේ. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය සහ සංවිධානයේ ප්‍රධාන කාර්යාලය කොළඹ 01 ඇච්ලන් චතුරස්‍රයෙහි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ පිහිටා තිබේ.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1. අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

අන්තර්ජාතික ගිණුම් කරණ ප්‍රමිති මණ්ඩලය මගින් නිකුත් කරනු ලබන අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති නියෝජනය කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට (SLAS) අනුකූලව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම, සාමාන්‍ය කොටස්වල වෙනස්කම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයක් සහිතව සටහන් පිළියෙල කර තිබේ.

### 2.2. ඇස්තමේන්තු, විනිශ්චයන් හා උපකල්පනයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී, එහි කළමනාකාරීත්වය විසින් වාර්තා කරන දිනට ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් මෙන්ම අසම්භාව්‍ය වගකීම් අනාවරණය කිරීම පිළිබඳ වාර්තා කරනු ලැබූ ප්‍රමාණවලට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සිදුකළ යුතුය. මෙම ඇස්තමේන්තු හා අවධාරණය කරනු ලැබූ උපකල්පනයන් පවත්නා පදනම මත සමාලෝචනය කෙරේ. කෙසේ වුවද, මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අනියතතාව තුළින් අනාගතයේදී බලපෑමට ලක්විය හැකි වත්කම් හෝ වගකීම්වල ධාරණ ප්‍රමාණයට ද්‍රව්‍යමය ගැළපීම් සිදු කිරීම අවශ්‍ය වන ප්‍රතිඵල ලැබිය හැකිය.

### 2.3. ව්‍යාපාර සාර්ථකත්වය

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් සාර්ථක ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව ඇගයීමකට ලක් කර තිබේ. අනාගත මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා මෙම ආයෝජන මණ්ඩලයට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට සාධාරණ අපේක්ෂාවක් ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය සතු වේ. අනාගතය පිළිබඳ ලබාගත හැකි සියළු තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව මෙහෙයුම් කටයුතු ඈවර කිරීමේ හෝ නවතා දැමීමේ අවශ්‍යතාව ආයෝජන මණ්ඩලයට නොමැත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ව්‍යාපාරික සාර්ථකත්වය මත අඛණ්ඩව කටයුතු කිරීමේ පදනම අනුගමනය කිරීමට ආයෝජන මණ්ඩලය කටයුතු කරයි.

### 2.4. ව්‍යවහාර කරන මුදල් වර්ගය සහ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

ආයෝජන මණ්ඩලය මගින් ව්‍යවහාර කරන මුදල් වර්ගය ශ්‍රී ලංකා රුපියල් ලෙස තීරණය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශ ද ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ.

## 3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1. මූල්‍ය වත්කම්

ආයෝජන මණ්ඩලය මගින් ණය හා ලැබිය යුතු මුදල් හා කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන ලෙස එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනාගැනීමේදී, කළමනාකාරීත්වය මගින් මෙම වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබන අතර ආයෝජනය සිදු කිරීමේ හා ආයෝජන ලබා ගැනීමේ අරමුණ මත එය පදනම් වේ.

(අ) වර්ගීකරණය

**(i)** ණය හා ලැබිය යුතු මුදල්

ණය හා ලැබිය යුතු මුදල් යනු සක්‍රිය වෙළඳපොළකදී මිල සඳහන් කර නොමැති ස්ථාවර හෝ ගණනය කළ හැකි ගෙවීම් සමග ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් වේ. සාමාන්‍ය ගනුදෙනුවලදී ඇති වන ලැබිය යුතු මුදල් ද මෙම ප්‍රවර්ගය යටතේ ම වර්ගීකරණය කරනු ලබන අතර ඒවා හානිකරණ සඳහා සමාලෝචනය කරනු ලැබේ.

**(ii)** කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන

කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන යනු ස්ථාවර හෝ ගණනය කළ හැකි ගෙවීම් සමග ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් වන අතර කල් පිරෙන තෙක් තබා ගැනීම පිළිබඳව ධනාත්මක අභිප්‍රායක් හා හැකියාවක් ආයෝජන මණ්ඩල කළමනාකාරීත්වයට ඇති ස්ථාවර කල් පිරීම් වේ.

(ආ) හානිකරණය

සිදුවිය හැකි හානකරණයක් පිළිබඳ යම් හැඟවීමක් තිබේදැයි නිර්ණය කිරීම සඳහා මූල්‍ය වත්කම් එක් එක් ශේෂ පත්‍ර දිනයේ දී සමාලෝචනය කරයි. එසේ යම් හානිකරණයක් තිබේ නම්, එම වත්කමේ නැවත අයකර ගත හැකි ප්‍රමාණය පිළිබඳව තක්සේරු කරනු ලැබේ. වත්කමක ධාරණ ප්‍රමාණය හෝ එම වත්කමේ මුදල් උත්පාදන ඒකක වත්කමේ නැවත අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන විට හානිකරණ පාඩු හඳුනා ගත හැකිය. ආදායම් ප්‍රකාශ මගින් හානිකරණ පාඩු හඳුනා ගත හැකිය.

(ඇ) නැවත හඳුනා ගැනීම

පූර්ව කාලසීමාවලදී හඳුනා ගන්නා ලද හානිකරණ පාඩු අඩුවී ඇති බව හෝ තවදුරටත් නොපවතින බව හෝ හඳුනා ගැනීම පිණිස යම් හැඟවීමක් තිබේදැයි තක්සේරු කර ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේ දී ඇගයීමට ලක් කරනු ලැබේ. නැවත ගෙවිය හැකි මුදල නිර්ණය කිරීමට භාවිතා කරනු ලබන තක්සේරු කිරීම්වල වෙනසක් තිබීම මගින් හානිකරණ පාඩු නැවත හඳුනා ගැනේ.

3.2. දේපල පිරියත සහ උපකරණ

(අ) පිරිවැය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව, දේපළ පිරියත සහ උපකරණ තක්සේරු කිරීමේදී එහි අගයෙන් 2011 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය කිරීම් අඩු කොට ලැබෙන අගය 2011 ජනවාරි 01 දින වන විට එහි පිරිවැය ලෙස සැලකේ.

(ආ) ක්ෂය වීම්

ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනුයේ දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය / ඇගයීම පිළිබඳ සරල රේඛීයව පදනමිනි. ඉඩම් හැර දේපළ සහ උපකරණ සියල්ල ඒවායේ ඵලදායී ජීවිත කාලය පුරා වාර්ෂිකව ක්ෂය වී ඇත

| | 2012 | 2011 |
|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | වසර 20 | වසර 20 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | වසර 10 | වසර 10 |
| සවිකිරීම් හා එකලස් කිරීම් | වසර 10 | වසර 10 |
| කාර්යාල ලී බඩු හා උපකරණ | වසර 10 | වසර 10 |
| පරිගණක | වසර 03 | වසර 03 |
| මෝටර් වාහන | වසර 05 | වසර 05 |

මිලදී ගත් වර්ෂයේදී ස්ථාවර වත්කම් මත ක්ෂය කිරීම් අය නොකරන අතර අපහරණය කරන වර්ෂයේදී සම්පූර්ණයෙන් අය කෙරේ.

(ඇ) නැවත හඳුනා ගැනීම

අපහරණය කිරීමේදී හෝ දේපළ හා උපකරණ අයිතම භාවිතා කිරීමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් නොමැති විට දේපළ හා උපකරණ අයිතම නැවත හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතම නැවත හඳුනා ගැනීම මගින් ඇතිවන ලාභය හෝ අලාභය තීරණය කරනු ලබන්නේ විකුණුම්වලින් ලත් මුදල් සහ වත්කමෙහි ධාරණ ප්‍රමාණය අතර වෙනස මත වන අතර එය ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගැනේ.

(ඈ) ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු

වර්ෂය තුළ ඇතිවූ ශේෂ පත්‍ර දිනයට සම්පූර්ණ නොකරන ලද ප්‍රාග්ධන වියදම් ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු වශයෙන් හඳුන්වනු ලබන අතර වර්ෂය තුළ සම්පූර්ණ කළ සහ භාවිතය සඳහා ගත හැකි ඇති ප්‍රාග්ධන වත්කම් සියල්ල දේපළ, පිරියත සහ උපකරණ ගිණුමට මාරු කර ඇත.

(ඉ) කල් බදු වත්කම්

මූල්‍ය කල්බදු යටතේ අත්පත් කරගත් වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර අදාළ මූල්‍ය වගකීම් හඳුනාගෙන කල්බදු දුන් මෝටර් වාහන ප්‍රවර්ගය යටතට ඇතුළත් කරනු ලැබේ. මූල්‍ය කල්බදු යටතේ තබා ගන්නා වත්කම් ඒවා භාවිතා කරන කාල සීමාව මුළුල්ලේම ක්ෂය කරනු ලැබේ.

3.3. ආයෝජන දේපල

ආයෝජන දේපළ යටතේ එකී වත්කම් වර්ගීකරණය කරනු ලබන දිනයට පවතින පිරිවැයට ආයෝජන දේපළ දැක්වේ.

3.4. ඉන්වෙන්ටරි

සියලු ඉන්වෙනටරි අඩු පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගය යන දෙකෙන් අඩුම අගයට තක්සේරු කර ඇත. පළමුව ඇතුළු වීම් පළමුව පිටවීම් පදනමින් (FIFO) පිරිවැය තීරණය කරනු ලැබේ.

3.5. අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම්වලට අයත් වන්නේ අනෙකුත් ණය ගැතියෝ, ලැබිය යුතු මුදල්, අත්තිකාරම්, තැන්පතු සහ පූර්ව ගෙවීම්ය.

(අ) අත්තිකාරම්, තැන්පතු, කලින් ගෙවූ වියදම්

අත්තිකාරම්, තැන්පතු සහ කලින් ගෙවූ වියදම් යනු එක් මූල්‍ය වර්ෂයකට වැඩි ගණනකට ප්‍රතිලාභ හෝ සබඳතා පවතින වියදම්ය.
එබදු වියදම් කාල ප්‍රමාණන පදනමකින් යුතුව අදාළ කාලයෙන් පසුව කපාහරින වියදම්ය.
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

(ආ) අනෙකුත් ණයගැතියො

පිරිවැයෙන් හානිකරණ අලාභ අඩු කිරීම මගින් අනෙකුත් ණයගැතියෝ හඳුනා ගැනේ.

3.6. මුදල් හා මුදල් සාම්‍යතා

මුදල් හා මුදල් සාම්‍යතාවලට අයත් වන්නේ ඇතැති මුදල් සහ නිශ්චිත මුදල් ප්‍රමාණයකට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි කෙටි-කාලීන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් ආයෝජනයන් වන අතර අගය වෙනස්කම් ඇතිවීමෙහි කැපී පෙනෙන අවදානමකට නිරාවරණය නොවන ආයෝජනයන්ය. මේවා කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා තබාගනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළිබඳ අංක 07 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති **(LKAS)** අනුව වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කර ඇත.

3.7. සේවක ප්‍රතිලාභ

(අ) නිර්වචිත දායකත්ව සැලසුම්

එක් එක් ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාරකාර අරමුදල **(ETF)** සඳහා දායකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබති. ආයෝජන මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ වැටුපෙන් ස්ථාවර දායකත්වයන් සපයනු ලබන අතර තවදුරටත් ගෙවීම් සිදු කිරීමට නෛතික හෝ අනුමිත බැඳීමක් හෝ ආයෝජන මණ්ඩලයට නොමැත.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම් හැර රැකියාවෙන් පසු සේවකයන්ට ලබා දෙන සැලසුම්ය. 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට ආයෝජන මණ්ඩලය වගකීමෙන් බැඳේ. ආයුගණක ඇගයීමක් පදනම් කර ගනිමින් පනත යටතේ පවතින බැඳීම් සඳහා ප්‍රතිපාදාන වෙන්කිරීම් පිළිබඳව තීරණය කෙරේ.

3.8. වගකීම් සහ ප්‍රතිපාදන

නිරවුල් කිරීම මගින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත වන සම්පත් පිටතට ගලා යෑමට මග පාදන්නේ යැයි අපේක්ෂා කරන පසුගිය සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික / අනුමිත බැඳීමක් පවත්නා විට ශේෂ පත්‍රයෙහි වගකීම් හා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. ණයහිමියාගේ ඉල්ලීම පරිදි ගෙවිය යුතු බැඳීම් හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍ර දිනකට වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

වෙනත් වගකීම්

වෙනත් වගකීම්වලට උපචිත වියදම් ද ඇතුළු වෙනත් ණයහිමියන් ද ඇතුළත් වේ. වෙනත් වගකීම් ඒවායේ සාධාරණ අගය ලෙස සලකනු ලබන ඓතිහාසික අගයෙහි සඳහන් කරනු ලැබේ.

3.9. ආදායම් හඳුනාගැනීම්

(අ) ආදායම

සේවා / ගාස්තුවලින් ලබාගන්නා ආදායම ලැබුණු හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ අගයෙන් තක්සේරු කරනු ලැබේ. බලපත්‍ර ගාස්තු හෝ ගිවිසුම් සැකසීමේ ගාස්තු මුදල් පදනම මත හඳුනා ගැනේ.

(ආ) පොලී ආදායම්

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය තක්සේරු කරනු ලබන මූල්‍ය උපකාරක ඇතුළත් පොලී සහිත සියලුම මූල්‍ය උපකාරක සඳහා ලැබෙන පොලී ආදායම්, ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම" තුළ හඳුනා ගැනේ.

(ඇ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

3.10. වියදම්

වියදම් හඳුනා ගැනීම

(අ) අයභාර වැය

මෙම වියදම් සඳහා අදාළ වන කාලසීමාව තුළ දී ලබා දී ඇති හා හඳුනාගෙන ඇති මුදලේ සාධාරණ අගයෙන් සියලුම වියදම් තක්සේරු කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් උපයන ලද අතිරික්තය වන්නේ දන්නා සියලුම වගකීම් සඳහා මෙන්ම දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්වලින් අනතුරුව ඉතිරි වන මුදල් ප්‍රමාණයයි.

(ආ) ප්‍රාග්ධන වියදම්

සංවිධානය පවත්වාගෙන යාමේ අරමුණින් හෝ සංවිධානයේ සේවා / නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීමේ අරමුණින් හෝ ස්ථිර ස්වාභාවයේ වත්කම් ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැයකරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වේ.

3.11. බදු පැනවීම

මූල්‍ය ප්‍රකාශයේ වාර්තා කර ඇති පරිදි පොලී ආදායමේ අංග මත ආදායම් බදු පදනම් වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව එය ගණනය කෙරේ. පොලියෙන් ලැබෙන ලාභ හා ආදායම් හැර ලාභ හා ආදායම මත

පනවනු ලබන ආදායම් බද්දෙන් මෙම මණ්ඩලය නිදහස් කර ඇත.

3.12. අසම්භව්‍ය වගකීම්

පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇතිවිය හැකි අනාගත වගකීම් සම්බන්ධයෙන් හෝ පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇතිවිය හැකි වර්තමාන වගකීම් සම්බන්ධයෙන් හෝ ගෙවීම් කිරීම් අපේක්ෂා කළ නොහැකි අවස්ථාවකදී හෝ ගෙවීම් ප්‍රමාණය සාධාරණ ලෙස තක්සේරු කළ නොහැකි අවස්ථාවකදී හෝ අසම්භාව්‍ය වගකීම් අනාවරණය වේ.

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
## දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **4 ආදායම** | | |
| බිම් කුලිය | 605,761,845 | 496,804,372 |
| වාර්ෂික ගාස්තු | 543,709,821 | 481,367,616 |
| ආනයන / අපනයන සේවා ගාස්තු | 809,683,033 | 630,670,498 |
| ජල සැපයුම මගින් ශුද්ධ ආදායම (4.1 සටහන) | 334,629,422 | 244,275,699 |
| ඉඩම් වාරිකය | 60,781,696 | 51,176,386 |
| බදු කුලී ආදායම | 113,566,109 | 64,745,835 |
| බලපත් ගාස්තුව - 16 වන වගන්තිය යටතේ ව්‍යවසායන් | 23,178,312 | 16,880,476 |
| ඇතුළුවීමේ අවසරපත් අලෙවි කිරීම | 103,282,627 | 99,023,233 |
| ගිවිසුම / සැකසුම් ගාස්තු | 40,589,957 | 55,225,752 |
| නිවාස හා වෙනත් ව්‍යාපෘතිවලින් ලද ආදායම | 19,771,047 | 18,927,879 |
| විවිධ ආදායම් | 66,851,715 | 67,271,714 |
| | **2,721,805,586** | **2,226,369,460** |

**4.1 වෙළඳ ව්‍යාපාර සඳහා ජල සැපයුම මගින් ශුද්ධ ආදායම**

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| ජල සැපයුම මගින් ආදායම | 1,061,917,400 | 896,273,415 |
| ජල සැපයුම මත අදාළ වන පිරිවැය | (727,287,978) | (651,997,717) |
| ජල සැපයුම මගින් ශුද්ධ ආදායම | **334,629,422** | **244,275,699** |

**5 මෙහෙයුම් අතිරික්තය**

පහත දැක්වෙන සියලුම වියදම් අය කර ගැනීමෙන් / (බැර කිරීමෙන්) පසුව මෙහෙයුම් අතිරික්තය සඳහන් කරනු ලැබේ.

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් වියදම් (6 සටහන) | 337,008,595 | 230,057,542 |
| පරිපාලන වියදම් (7 සටහන) | 1,983,947,246 | 1,779,948,800 |
| රජයේ බදු (8 සටහන) | 148,120,375 | 47,814,539 |
| වෙනත් වියදම් (9 සටහන) | **24,300,318** | **30,949,090** |

**6 මෙහෙයුම් වියදම්**

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| ආයෝජන ප්‍රවර්ධන වියදම් | 116,561,220 | 24,392,640 |
| කලාප නඩත්තු කිරීම | 107,053,825 | 100,914,008 |
| ආලෝකය හා බල ශක්තිය | 58,037,179 | 53,057,564 |
| ආරක්ෂක සේවා | 52,032,990 | 48,996,962 |
| කලාපවල සේවකයන්ගේ සුබසාධන වියදම් | 3,323,381 | 2,696,369 |
| | **337,008,595** | **230,057,542** |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
# දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **7 පරිපාලන වියදම්** | | |
| පුද්ගලික පිරිවැය (7.1 සටහන) | 1,005,801,591 | 884,659,431 |
| කාර්ය මණ්ඩල සුබ සාධන වියදම් | 178,788,674 | 175,896,231 |
| මුද්‍රණ කටයුතු හා ලිපිද්‍රව්‍ය | 21,912,827 | 23,112,245 |
| ජරුළු පරිගණකය හා කාර්යාලීය උපකරණ නඩත්තුව | 32,810,692 | 32,912,244 |
| ගොඩනැගිලි නඩත්තුව | 75,308,516 | 65,549,917 |
| ප්‍රවාහන ආශ්‍රිත වියදම් | 85,384,338 | 73,499,153 |
| කාර්යාල බදු කුලී හා සත්‍යාපන ඒකක බදු කුලී | 37,908,488 | 37,422,287 |
| පුවත්පත් දැන්වීම් | 2,298,152 | 1,612,401 |
| ජල පරිභෝජනය | 7,181,794 | 5,755,559 |
| සන්නිවේදන වියදම් | 34,960,254 | 32,228,632 |
| මහනගර සභා වරිපනම් | 7,545,200 | 7,545,200 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 13,100,708 | 6,784,089 |
| නෛතික හා වෘත්තීය ගාස්තු | 7,778,874 | 6,581,677 |
| ඒකාබද්ධ සමාජ වගකීම් වියදම් | 2,000,000 | - |
| ගමන් වියදම් හා යැපීම් වියදම් | 4,554,383 | 4,159,675 |
| විගණන ගාස්තු | 1,500,000 | 1,000,000 |
| ණය ගැතියන් මත හානිකරණය | 63,810,680 | 53,532,349 |
| ක්ෂය කිරීම් | 401,302,075 | 367,697,712 |
| | **1,983,947,246** | **1,779,948,800** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **7.1පුද්ගලික පිරිවැය** | | |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ගාස්තු | 384,000 | 330,000 |
| වැටුප් හා වේතන - විධායක කාර්ය මණ්ඩලය | 290,835,260 | 269,728,208 |
| වැටුප් හා වේතන - ලිපිකරු හා සමාන්තර සේවා කාර්ය මණ්ඩලය | 92,853,345 | 88,190,574 |
| වැටුප් හා වේතන - ආරක්ෂක කාර්ය මණ්ඩලය | 40,332,018 | 38,323,577 |
| වැටුප් හා වේතන - සුළු සේවක කාර්ය මන්ඩලය | 74,454,572 | 70,075,140 |
| අතිකාල දීමනා | 116,949,241 | 107,630,410 |
| ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් | 59,098,318 | 49,516,654 |
| ප්‍රසාද මුදල් ගෙවීම් | 55,810,744 | 16,092,500 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන | 30,896,886 | 27,561,551 |
| සේවකඅර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් | 74,551,196 | 73,669,513 |
| සේවකභාරකාර අරමුදල සඳහා දායක මුදල් | 14,910,140 | 14,733,914 |
| වෙනත් කාර්ය මණ්ඩල වියදම් | 153,486,392 | 113,821,263 |
| ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය | 1,239,480 | 14,986,127 |
| | **1,005,801,591** | **884,659,431** |

## 8 රජයේ බදු

| | | |
|---|---|---|
| මුද්දර ගාස්තු | 518,885 | 1,235,920 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 34,619,596 | 28,555,427 |
| ආර්ථික සේවා ගාස්තු | 9,436,774 | * |
| අගය එකතු කළ බද්ද - තහනම් කළ වැට් බදු යෙදවුම් | 103,545,120 | 18,023,192 |
| | **148,120,375** | **47,814,539** |

## 9 වෙනත් වියදම්

| | | |
|---|---|---|
| විනිමය අනුපාත ලාභ / අලාභ | * | * |
| හැඳුනුම්පත් නිකුත් කිරීමේ වියදම් | 2,501,217 | 2,840,785 |
| විවිධ වියදම් | 15,710,909 | 13,808,073 |
| බහාලුම්වල යතුරු අගුළු | 1,050,600 | 1,656,424 |
| රක්ෂණය | 3,729,525 | 3,921,700 |
| පරිසර පාලන වියදම් | 215,745 | 198,579 |
| නඩු සඳහා වන්දි ගෙවීම | * | 7,178,111 |
| සංග්‍රහ වියදම් | 1,092,322 | 1,345,418 |
| | **24,300,318** | **30,949,090** |

## 10 ශුද්ධ මූල්‍ය ආදායම්

| | | |
|---|---|---|
| මූල්‍ය ආදායම් | | |
| ඇමතුම් තැන්පතු / වෙනත් තැන්පතු මත පොලී ආදායම් | 79,000,907 | 113,090,071 |
| කාර්ය මණ්ඩල ණය මත පොලී ආදායම් | 21,764,372 | 20,164,140 |
| මුළු මූල්‍ය ආදායම් | 100,765,279 | 133,254,211 |
| **මූල්‍ය වියදම්** | | |
| බදු මත පොලී | 15,025,375 | 2,151,497 |
| බැංකු ගාස්තු | 620,700 | 617,036 |
| මුළු මූල්‍ය වියදම් | 15,646,075 | 2,768,533 |
| | | |
| ශුද්ධ මූල්‍ය ආදායම් | **85,119,204** | **130,485,678** |

| | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | ව්‍යුහයන් රු. | වැද්දුම් හා සවි කිරීම්රු. | පිරියත හා යන්ත්‍රෝපකරණරු. | ලී බඩු හා කාර්යාලීය උපකරණ රු. | පරිගණක රු | මෝටර් වාහන රු. | එකතුව 2013 රු. | එකතුව 2012 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11.දේපළ, පිරියත හා උපකරණ | | | | | | | | | | |
| සින්නක්කර වත්කම් පිරිවැයට | | | | | | | | | | |
| ජනවාරි 1 වන විට ශේෂය | 155,209,000 | 1,737,176,264 | 4,327,324,255 | 369,349 | 42,937,788 | 98,553,666 | 112,938,816 | 162,480,384 | 6,636,989,521 | 6,703,434,668 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | 4,686,000 | - | 75,750 | 5,097,420 | 13,753,073 | 18,772,884 | 4,108,500 | 46,493,626 | 43,269,632 |
| දැනට ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතුවලින් මාරු කිරීම් | - | 2,192,863 | 524,918,330 | - | - | - | - | - | 527,111,193 | 174,475,569 |
| වර්ෂය තුළ අපහරණය කිරීම් | - | - | | - | 199,500 | 898,580 | 1,164,500 | 17,325,000 | 19,587,580 | 12,351,900 |
| ආයෝජන දේපළවලට මාරු කිරීම් | - | - | - | - | | | | | | 271,838,357 |
| දෙසැම්බර් 31 වන විට ශේෂය | 155,209,000 | 1,744,055,127 | 4,852,242,585 | 445,099 | 47,835,707 | 111,408,159 | 130,547,199 | 149,263,884 | 7,191,006,761 | 6,636,989,522 |
| ක්ෂය කිරීම් | | | | | | | | | | |
| ජනවාරි 1 වන විට ශේෂය | - | 299,754,643 | 1,015,152,331 | 38,281 | 15,448,192 | 26,063,068 | 64,055,727 | 139,789,302 | 1,560,301,544 | 1,302,637,951 |
| වර්ෂය සඳහා අය කිරීම | - | 86,968,456 | 242,612,129 | 37,460 | 4,303,564 | 9,864,698 | 20,496,534 | 10,382,673 | 374,665,514 | 367,697,712 |
| අපහරණ මත | - | - | - | - | 99,750 | 343,054 | 1,163,267 | 17,325,000 | 18,931,071 | 10,867,766 |
| ක්ෂය කිරීම් ආයෝජන දේපළවලට මාරු කිරීම | - | - | - | - | - | - | - | - | - | 99,166,353 |
| දෙසැම්බර් 31 වන විට ශේෂය | 155,209,000 | 386,723,099 | 1,257,764,460 | 75,741 | 19,652,006 | 35,584,712 | 83,388,994 | 132,846,975 | 1,916,035,988 | 1,560,301,544 |
| සින්නක්කර වත්කම්වල ලියා හැරි වටිනාකම | - | - | - | - | - | - | - | - | - | - |
| දෙසැම්බර් 31 වන විට | - | 1,357,332,027 | 3,594,478,125 | 369,358 | 28,183,701 | 75,823,447 | 47,158,205 | 16,416,909 | 5,274,970,773 | 5,076,687,978 |
| කල්බදු වත්කම් | - | - | - | - | - | - | - | - | - | - |
| ජනවාරි 1 වන විට ශේෂය | - | - | - | - | - | - | - | 65,223,214 | 65,223,214 | |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | - | - | - | - | - | - | 17,142,857 | 17,142,857 | 65,223,214 |
| වර්ෂය තුළ අපහරණය කිරීම් | - | - | - | - | - | - | - | - | - | |
| මුළු කල්බදු වත්කම් | - | - | - | - | - | - | - | 82,366,071 | 82,366,071 | 65,223,214 |
| ක්ෂය කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| ජනවාරි 1 වන විට ශේෂය | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා අය කිරීම | - | - | - | - | - | - | - | 13,044,643 | 13,044,643 | - |
| අපහරණ මත | - | - | - | - | - | - | - | - | - | - |
| දෙසැම්බර් 31 වන විට ශේෂය | - | - | - | - | - | - | - | 13,044,643 | 13,044,643 | - |
| කල්බදු වත්කම්වල ලියා හැරි වටිනාකම | - | - | - | - | - | - | - | - | - | - |
| දෙසැම්බර් 31 වන විට | - | - | - | - | - | - | - | 69,321,429 | 69,321,429 | - |
| දෙසැම්බර් 31 වන විට | 155,209,000 | 1,357,332,027 | 3,594,478,125 | 369,358 | 28,183,701 | 75,823,447 | 47,158,205 | 85,738,337 | 5,344,292,202 | 5,141,911,192 |

2013 දෙසැම්බර් 31 වන විට මූල්‍ය බදු යටතේ අත්පත් කරගත් මෝටර් වාහනවල වටිනාකම රු. 82,366,071.45 ක් විය. ඒවා ප්‍රධාන වශයෙන්ම පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනලද දේපළවලට අදාළ වේ. මෙම වත්කම්වලට අදාළ වන වගකීම් 22 වන සටහනේ "මූල්‍ය බදු" යටතේ සඳහන් කර තිබේ.

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
## දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | 2013<br>රු | 2012<br>රු. |
|---|---|---|
| **12 ආයෝජන දේපළ** | | |
| ජනවාරි 01 වන විට ශේෂය | 17,000,254,053 | 16,728,415,696 |
| දේපළ, පිරියත හා උපකරණ - ගොඩනැගිලිවලින් මාරු කරන ලදී. | - | 271,838,357 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 70,675,456 | - |
| වර්ෂය තුළ අපහරණය කිරීම් | 102,812,000 | - |
| අඩුකළා - දෙසැම්බර් 31 වන විට සමුච්චිත ක්‍රමක්ෂය කිරීම් | 112,758,271 | 99,166,353 |
| **දෙසැම්බර් 31 වන විට ශේෂය** | **16,855,359,239** | **16,901,087,700** |

2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හා ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් රු. 102,812,000.00 ක වටිනාකමක් සහිත ඉඩම් පොදු අරමුණු සඳහා වෙනත් රාජ්‍ය ආයතනවලට මාරු කර ඇත.

| | 2013 | 2012 |
|---|---|---|
| **13 ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු** | | |
| සාමාන්‍ය ව්‍යාපෘති | | |
| ජනවාරි 01 දින වන විට ශේෂය | 728,911,501 | 89,445,840 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 429,500,651 | 32,191,358 |
| වර්ෂය තුළ ප්‍රාග්ධනීකරණය කරන ලද දේපළ | (526,695,765) | (192,725,698) |
| දෙසැම්බර් 31 දින වන විට ශේෂය | **631,716,386** | **728,911,501** |
| විශේෂ ව්‍යාපෘති | | |
| ජනවාරි 01 දින වන විට ශේෂය | 153,095,367 | 147,747,661 |
| නගර සංවර්ධන ගිණුමට මාරු කිරීම් | - | (1,500,000) |
| ප්‍රාග්ධනීකරණය කරන ලද දේපළ - ඉඩම් හා ගොඩනැගිලි | (53,859,753) | (11,270,121) |
| වර්ෂය තුළ එකතු කිරීම් | 107,908,038 | 18,117,827 |
| ක්‍රියාත්මකව පවතින මුළු ප්‍රාග්ධන කටයුතු | **838,860,038** | **882,006,867** |

ආරම්භයේදී හෝ ශේෂ පත්‍ර දිනය වන විට තක්සේරු කිරීම හෝ වර්ගීකරණය කිරීම හෝ කළ නොහැකි විශේෂ ව්‍යාපෘතිවල ප්‍රාථමික හෝ සංවර්ධන වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම් මෙම ව්‍යාපෘති අවසන් වන තෙක් “ක්‍රියාත්මකව පවතින ප්‍රාග්ධන කටයුතු” යටතේ සඳහන් කර තිබේ.

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **14 ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| කාර්ය මණ්ඩල ණය (14.1 සටහන) | | 403,368,949 |
| මූල්‍ය සහාය වැඩසටහන (14.2 සටහන) | 27,442,809 | 30,085,424 |
| මූල්‍ය වත්කම් | **430,811,757** | **428,647,715** |

වසරකට වඩා අඩු වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් කොටස වන රු. 131,098,397.34 වෙනත් ජංගම මූල්‍ය වත්කම් යටතේ ඇතුළත් කර ඇත.

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **14.1 දැනට වලංගුව පවතින පොලී අනුපාතිකය අනුව ගණනය කරන ලද කාර්ය මණ්ඩල ණය** | | |
| කාර්ය මණ්ඩල ණය - වසරකට වඩා වැඩි කල් පිරීමක් සහිත කොටස (14.1 සටහන) | | 403,368,949 |
| කාර්ය මණ්ඩල ණය - වසරකට වඩා අඩු කල් පිරීමක් සහිත කොටස (15 සටහන) | | 131,098,397 |
| කාර්ය මණ්ඩල ණය සඳහා කලින් ගෙවන ලද කාර්ය මණ්ඩල වියදම් | | **52,189,614** |
| අඩු කළා : IFRS ගැලපීම් - කාර්ය මණ්ඩල ණය | | **(52,189,614)** |
| මුළු මූල්‍ය වත්කම් | | **534,467,346** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **14.2 මූල්‍ය සහාය වැඩසටහන** | | |
| ජනවාරි 01 දින වන විට ශේෂය | 90,792,606 | 106,254,656 |
| වර්ෂය තුළ ලබා දෙන ලද මුදල් | - | - |
| වර්ෂය තුළ නැවත ගෙවන ලද මුදල් | (26,481,856) | (15,462,049) |
| හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීමට පෙර දෙසැම්බර් 31 වන විට ශේෂය | 64,310,750 | 90,792,606 |
| අඩු කළා : හානිකරණ සඳහා ප්‍රතිපාදන | (25,092,321) | (34,512,724) |
| හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු දෙසැම්බර් 31 දින වන විට ශේෂය | 39,218,429 | 56,279,883 |
| ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද වසරකට වඩා අඩු කල්පිරීමක් සහිත කොටස | 11,775,620 | 26,194,459 |
| ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද වසරකට වඩා වැඩි කල්පිරීමක් සහිත කොටස | 27,442,809 | 30,085,424 |
| මූල්‍ය සහාය වැඩසටහනේ එකතුව | 39,218,429 | 56,279,883 |

**ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද ණය සහ ලැබිය යුතු මුදල් කල් පිරීමේ දිනයට අනුව පහත සඳහන් කර ඇත.**

| | 2013-12-31 රු. | කල් පිරීම වසර 1ක් හා 05 ක් අතර | වසර 05කට පසුව |
|---|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | 403,368,949 | 276,037,410 | 127,331,539 |
| මූල්‍ය සහාය වැඩසටහන | 27,442,809 | 22,613,885 | 4,828,923 |
| මුළු ජංගම නොවන මූල්‍ය වත්කම් | **430,811,757** | **298,651,295** | **132,160,462** |

| | 2013-12-31 රු. | කල් පිරීම වසර 1ක් හා 05 ක් අතර | වසර 05කට පසුව |
|---|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | 398,562,292 | 261,819,177 | 136,743,114 |
| මූල්‍ය සහාය වැඩසටහන | 30,085,424 | 24,624,228 | 5,461,196 |
| මුළු ජංගම නොවන මූල්‍ය වත්කම් | **428,647,716** | **286,443,405** | **142,204,310** |

## 15 ජංගම මූල්‍ය වත්කම්

| | 2013 රු. | 2012 රු |
|---|---|---|
| ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද වසරකට වඩා අඩු කල් පිරීමක් සහිත කොටස | | |
| කාර්ය මණ්ඩල ණය | 125,856,985 | 111,360,495 |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් | 5,241,413 | 4,957,538 |
| මූල්‍ය සහාය වැඩසටහන (14.1 සටහන) | | |
| කල්පිරෙන තෙක් තබන ලද ආයෝජන | 11,775,620 | 26,194,459 |
| ස්ථාවර තැන්පතු - රාජ්‍ය ණය සහ ආයෝජන බැංකුව | 5,629,262 | 5,375,925 |
| ප්‍රති-අලෙවිකරණ ගිවිසුම් | - | - |
| ස්ථාවර තැන්පතු | 20,000 | 20,000 |
| මූල්‍ය වත්කම් | **148,523,279** | **147,908,417** |

## 16 ව්‍යවසායන්වලින් ලැබිය යුතු මුදල්

| | 2012 රු. | 2011 රු |
|---|---|---|
| ව්‍යවසායන්වලින් ලැබිය යුතු මුදල් | 664,452,940 | 701,884,117 |
| අඩු කළා : ණයගැතියන් මත හානිකරණ කිරීම සඳහා ප්‍රතිපාදන (16.1 සටහන) | (493,484,649) | (492,790,570) |
| | **170,968,291** | **209,093,547** |

## 16.1 සැලැසීම

| | | |
|---|---|---|
| ණයගැතියන් මත හානිකරණය කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම | | |
| ජනවාරි 01 දින වන විට ශේෂය | 492,790,570 | 437,041,560 |
| වර්ෂය තුළ ලියා හැරීම් | 13,483,407 | 5,517,032 |
| වර්ෂය තුළ වෙන්කරන ලද ප්‍රතිපාදන | 14,177,486 | 61,266,043 |
| දෙසැම්බර් 31 දින වන විට ශේෂය | **493,484,649** | **492,790,570** |

## 17 පූර්ව ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු මුදල්

| | | |
|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | 478,892 | 3,750,499 |
| අත්තිකාරම් ගෙවීම් - විදේශ සංචාර | 569,999 | 569,999 |
| විදේශ රටවලදී ඉටු කරන ලද ශ්‍රී ලාංකික දූත මෙහෙවර | 848,998 | 344,086 |
| සේවයේ යෙදවීමේ අත්තිකාරම් | 46,660,561 | 25,850,208 |
| කලින් ගෙවන ලද වියදම් | - | 390,528 |
| පොලී ආදායම - ලැබිය යුතු මුදල් | 6,910,098 | 34,894,233 |
| ලැබිය යුතු තැන්පතු | 7,133,689 | 5,179,301 |
| වෙනත් ලැබිය යුතු මුදල් | 131,274,290 | 66,891,301 |
| අඩු කළා : ණයගැතියන් මත හානිකරණය කිරීම සඳහා ප්‍රතිපාදන (17.1 සටහන) | (120,257,749) | (61,204,152) |
| | **73,618,778** | **76,666,466** |

ණයගැතියන් මත හානිකරණය කිරීම සඳහා ප්‍රතිපාදන - වෙනත්

## 17.1 ලැබිය යුතු මුදල්

| | | |
|---|---|---|
| ජනවාරි 01 දින වන විට ශේෂය | 61,204,152 | 100,754,722 |
| වර්ෂය තුළ ලියා හැරීම් | - | (40,128,270) |
| වර්ෂය තුළ වෙන්කරන ලද ප්‍රතිපාදන | 59,053,597 | 577,700 |
| දෙසැම්බර් 31 දින වන විට ශේෂය | 120,257,749 | 61,204,152 |

## 18 වාසිදායක මුදල් සහ මුදල් සාමානතා

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| ලංකා බැංකුව - පුද්ගලික ශාඛාව | 155,933,847 | 91,279,508 |
| ලංකා බැංකුව - පුද්ගලික ශාඛාව | 5,524,895 | 6,751,195 |
| ලංකා බැංකුව - කටුනායක | 27,278,178 | 4,048,286 |
| ලංකා බැංකුව - බියගම | 4,470,175 | 2,445,831 |
| ලංකා බැංකුව - කොග්ගල | 19,526,031 | 20,003,064 |
| ලංකා බැංකුව - දිගන | 2,308,313 | 4,748,708 |
| ලංකා බැංකුව - අවිස්සාවේල්ල | 11,539,707 | 8,219,298 |
| ලංකා බැංකුව - ඉංගිරිය | 2,183,146 | 3,190,407 |
| ලංකා බැංකුව - මීරිගම | 647,756 | 512,334 |
| ලංකා බැංකුව - නිට්ටඹුව | 6,095,290 | 1,208,578 |
| ලංකා බැංකුව - කුරුණෑගල | 3,247,218 | 1,122,408 |
| HSBC - බම්බලපිටිය | - | 410,690 |
| රන් පවුම් | 44,800 | 44,800 |
| ප්‍රාංකන යන්ත්‍රයේ ශේෂය | 278,887 | 300,022 |
| තාවකාලික අතිරික්ත අරමුදල - ලංකා බැංකුව | 172,236,126 | 131,916,397 |

| | | |
|---|---|---|
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව - කාර්ය මණ්ඩල ඇප තැන්පතු | 160,554 | 167,448 |
| සුරක්ෂිතාගාරය | 400,000,000 | - |
| ඇමතුම් තැන්පතු / වෙනත් තැන්පතු | 251 | 5,493 |
| අත ඇති මුදල් | 956 | - |
| මුදල් සහ මුදල් සාම්‍යතා | 811,476,128 | 276,374,467 |

## 19 විලම්භිත වියදම්

2008 වසරේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් නවයක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකි විය. අභ්‍යන්තර සැරසිලි, බුමුතුරුණු ඇතිරීම සහ කොටස්වලට බෙදා වෙන් කිරීම සඳහා වැයවූ පිරිවැය ආදායම් ප්‍රකාශනය භාවිතා කර තක්සේරු කරන ලද වසර 10 ක ඵලදායී ජීවිත කාලය පුරා සරල රේඛීය පදනම මත නැවත හඳුනා ගත හැකිය. කලාප සංවර්ධනය සඳහා ක්‍රමක්ෂය කරන ලද පිරිවැය වසර 20ක් පුරා නැවත හඳුනා ගත හැකිය.

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| ජනවාරි 01 දින වන විට ශේෂය | 440,993,614 | 437,594,339 |
| වර්ෂය තුළ විලම්භිත වියදම | 24,345,688 | 39,694,657 |
| අඩු කළා - ප්‍රවර්ථන වර්ෂයේ වියදම් | (38,104,272) | (36,295,383) |
| දෙසැම්බර් 31 දින වන විට ශේෂය | 427,235,029 | 440,993,614 |

## 20 විලම්භිත ආදායම - ඉඩමේ වාරිකය

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| ජනවාරි 01 දින වන විට ශේෂය | 1,792,358,277 | 1,636,483,595 |
| වර්ෂය තුළ ලැබීම් | 352,768,594 | 204,470,869 |
| ආදායම් ප්‍රකාශන මගින් නැවත හඳුනා ගත් ආදායම් | (50,430,975) | (48,596,187) |
| දෙසැම්බර් 31 දින වන විට ශේෂය (20.1 සටහන) | 2,094,695,897 | 1,792,358,277 |

## 20.1 විලම්භිත ආදායම

| | 2013-12-31 රු. | කල් පිරීම වසරක් තුළ | වසර 1ක් හා වසර 05ක් අතර | වසර 05කට පසුව |
|---|---|---|---|---|
| ඉඩමේ වාරිකය | 2,094,695,897 | 50,430,975 | 252,154,876 | 1,792,110,045 |
| | 2,094,695,897 | 50,430,975 | 252,154,876 | 1,792,110,045 |

| | 2013-12-31 රු. | කල් පිරීම වසරක් තුළ | වසර 05කට පසුව |
|---|---|---|---|
| ඉඩමේ වාරිකය | 1,636,483,595 | 43,651,626 | 218,258,128 |
| | 1,636,483,595 | 43,651,626 | 218,258,128 |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|

**21 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දින වන විට බැඳීම්වල මුළු වර්තමාන වටිනාකම | 200,458,965 | 176,006,875 |
| පොලී පිරිවැය | 20,045,898 | 17,600,688 |
| ජංගම සේවා පිරිවැය | 10,850,989 | 9,960,863 |
| බැඳීම් මත ආයු ගණන (ලාභය) / අලාභය | 6,283,354 | 10,046,932 |
| අඩු කළා : වර්ෂය තුළ ගෙවීම් / ගෙවිය යුතු මුදල් බැඳීම්වල | (13,577,026) | (13,156,392) |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල මුළු වර්තමාන වටිනාකම | 224,062,180 | 200,458,966 |

**21.1 ආදායම් ප්‍රකාශන මගින් නැවත හඳුනා ගත් ආදායම්**

| | | |
|---|---|---|
| පොලී පිරිවැය | 20,045,897 | 17,600,688 |
| ජංගම සේවා පිරිවැය | 10,850,989 | 9,960,863 |
| බැඳීම් මත ආයු ගණන (ලාභය) / අලාභය | 6,283,354 | 10,046,932 |
| මුළු විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් වියදම් | 37,180,240 | 37,608,483 |

වෘත්තීය ආයු ගණක, එම්. පුපලනාදන් මහතා විසින් 2013 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් පිළිබඳව ස්වාධීන ආයු ගණක තක්සේරුවක් සිදු කළ අතර ආයු ගණකයන් විසින් විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් පිළිබඳව තක්සේරු කිරීමට "ප්‍රක්ෂිප්ත ඒකක ණය මුදල් ක්‍රමය" නම් වූ තක්සේරු ක්‍රමය භාවිතා කරයි.

ආයු ගණක විසින් භාවිතා කළ උපකල්පන පහත සඳහන් වේ.

| | 2013 | 2012 |
|---|---|---|
| **(i)** වට්ටම් අනුපාතය | 10% | 10% |
| **(ii)** වැටුප් වර්ධක අනුපාතය | Fixed | Fixed |
| **(iii)** අනාගත මරණ අනුපාතය පිළිබඳ උපකල්පනය | A1967/70 | A1967/70 |
| **(iv)** විශ්‍රාම ගන්නා වයස | 60 Years | 60 Years |

| **22 මූල්‍ය බදු** | **2013**<br>**රු.** | **2012**<br>**රු.** |
|---|---|---|
| ජනවාරි 01 දින වන විට ශේෂය | 103,827,537 | - |
| වර්ෂය තුළ ලබා ගන්නා ලද මූල්‍ය බදු | 28,230,300 | 107,407,809 |
| වර්ෂය තුළ ගෙවන ලද වාරික | (26,657,187) | (3,580,272) |
| දෙසැම්බර් 31 දින වන විට ශේෂය | 105,400,650 | 103,827,537 |
| අඩු කළා - රඳවා ගත් පොලිය | (36,095,165) | (40,033,097) |
| ගෙවිය යුතු ප්‍රාග්ධනය | 69,305,484 | 63,794,439 |
| වසරක් තුළ එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | 14,393,354 | 9,434,642 |
| වසරකට පසුව එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | 54,912,130 | 54,359,796 |
| ගෙවිය යුතු මුළු මූල්‍ය බදු ප්‍රමාණය | 69,305,484 | 63,794,439 |

## 23 උපචිත වියදම් සහ ගෙවිය යුතු වෙනත් මුදල්

| | | |
|---|---|---|
| විවිධ ණය හිමියන් | 65,257,876 | 56,508,018 |
| උපචිත වියදම් | 203,396,847 | 178,449,360 |
| කාර්ය මණ්ඩල යහසාධක අරමුදල (23.1 සටහන) | 14,376,935 | 15,476,834 |
| කලින් ලද මුදල් | 216,201,116 | 156,450,096 |
| ආපසු ගෙවිය යුතුතැන්පතු | 114,902,248 | 108,364,126 |
| ඉඩම් වෙන් කිරීමේ ගාස්තු | 13,752,598 | 12,426,643 |
| ගෙවිය යුතු තැන්පතු | 62,781,963 | 57,325,980 |
| මධ්‍යම පරිසර අධිකාරිය | 4,760,197 | 4,760,197 |
| මුළු මෙහෙයුම්වියදම්හා ගෙවිය යුතු වෙනත් මුදල් | **695,429,780** | **589,761,254** |

## 23.1 කාර්ය මණ්ඩල යහසාධක අරමුදල

| | | |
|---|---|---|
| ජනවාරි 01 දින වන විට ශේෂය | 15,476,834 | 15,683,279 |
| වර්ෂය තුළ කාර්ය මණ්ඩල දායකත්වය | 2,375,396 | 1,300,520 |
| යහසාධක අරමුදල මත පොලිය | - | 1,470,000 |
| වර්ෂය තුළ උපයෝජනය | (3,475,294) | (2,976,965) |
| දෙසැම්බර් 31 දින වන විට ශේෂය | **14,376,935** | **15,476,834** |

## 24. අදාළ පාර්ශ්ව පිළිබඳ හෙළි කිරීම්

24.1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති, ආචාර්ය ලක්ෂ්මන් ජයවීර මහතා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායන් හා අදාළ වන පාර්ශ්වයන් සමඟ ගනුදෙනු නොකරන බව සඳහන් කර තිබේ.

24.2. 2013 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගනුදෙනුවලට ඇතුළත්ව ඇති පහත සඳහන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සම්බන්ධ පාලනය හා / හෝ සුවිශේෂී බලපෑම් කිරීමේ හැකියාවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන සංජීව වික්‍රමනායක මහතා වෙත පැවතුණි.

(අ) ඊ-ඩබ් ඉන්ෆෝමේෂන් සිස්ටම්ස් ලිමිටඩ්
(ආ) ඒවිස් පෙරිපෙරල්ස් (පුද්.) සමාගම
(ඇ) ඕපන් සිස්ටම්ස් ඉන්ටිග්‍රේටස් (පුද්.) සමාගම
(ඈ) ටොපෑන් ෆෝම්ස් (කලම්බු) ලිමිටඩ්

24.3. 2013 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගනුදෙනුවලට ඇතුළත්ව ඇති පහත සඳහන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සම්බන්ධ පාලනය හා / හෝ සුවිශේෂී බලපෑම් කිරීමේ හැකියාවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන චන්න පලන්සූරිය මහතා වෙත පැවතුණි.

(අ) 2013 ඔක්තෝම්බර් 30 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී සහ ඔරිට් ඇපරල්ස් ලංකා (පුද්.) සමාගමේ ත්‍රී පාර්ශ්වීය ගිවිසුම

(ආ) 2013 ඔක්තෝම්බර් 30 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ස්ටයිල් - ක්‍රාෆ්ට් ස්පෝර්ට්ස්වෙයාර් (පුද්.) සමාගමේ ගිවිසුම

24.4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සාමාජිකයෙකු වන අනුර ජයසිංහ මහතා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායන් හා අදාළ වන පාර්ශ්වයන් සමඟ ගනුදෙනු නොකරන බව සඳහන් කර ඇත.

## 25. අසම්භාව්‍ය වගකීම්

25.1. හොරණ අපනයන සැකසුම් කලාපයේ නිෂ්පාදන කම්හලයක් ස්ථාපනය කර ඇති එම් / එස් මර්බොක් එම්ඩිඑෆ් ලංකා (පුද්.) සමාගම සමඟ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. මෙම ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ අය ක්‍රමය 6.9% වාර්ෂික වැල් පොලි අනුපාතයට වඩා වැඩි වූ අවස්ථාවල මෙම සමාගම වෙත හානිපූරණය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වගකීමෙන් බැඳී සිටී. බේරුම්කරීමේ තීරණය අනුව 2007 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා ගෙවිය යුතු රු. 356,793,568.21 සමඟ අදාළ පොලිය ගෙවීමට නියෝග කර ඇති අතර අවශ්‍ය කටයුතු සඳහා යොමුකර තිබේ.

අන්තර්ජාතික බේරුම්කරණ නියෝගය ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර තිබේ.

25.2 ජාත්‍යන්තර තත්වයේ ගොල්ෆ් පිටියක්, රිය ධාවන අංගණයක්, ක්‍රීඩා සමාජ, ක්‍රීඩා හා විවේකය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ පොකුරු බද්ධ නිවාස ඉදිකිරීමේ හා මෙහෙයවීමේ ව්‍යාපාරය සඳහා ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සඳහා ඒෂියා පැසිෆික් ගොල්ෆ් කෝස් ලිමිටඩ් ආයතනය සමඟ 2001-06-21 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

2008 ඔක්තෝබර් මාසයේදී ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අනුව, එකී ව්‍යාපාර ආයතනය වෙනුවෙන් පෙනී සිටින සිංගප්පූරුවේ පිහිටි නෛතික ව්‍යාපාර ආයතනය වන ඇක්විටිස් ලෝ එල්. එල්. පී. ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් රු. 19,191,381,000.00 ක වන්දියක් ඉල්ලා තිබේ. ඉහත කරුණ සම්බන්ධයෙන් බේරුම්කරණ නීති කෘත්‍ය සිංගප්පූරුවේදී ආරම්භ වී තිබේ.

25.3 තීරණ බලාපොරොත්තුවෙන් තවදුරටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින නඩු ලැයිස්තුව මෙයට යා කොට තිබෙන අතර එවැනි නඩු කීම්වල තථ්‍ය වගකීම් පිළිබඳව නිවැරදිව තහවුරු කළ නොහැකිය. (ඇමුණුම 01)

25.4 බියගම අපනයන සැකසුම් කලාපයෙහි මුදල් ඌනතාවක් ලෙස රු. 507,650.00ක මුළු අගයක් වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දැක්වේ. අදාළ නඩුව සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතියි.

**විගණන වාර්තාව**
**2013.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ**
**මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාර**
**විගණකාධිපති වාර්තාව**

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීයි/ජී/බීඕඅයි/01/2013 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015 ජනවාරි 30 දින |

10 JUN 20[illegible]

BOARD OF INVESTMENT OF SRI LANKA

සභාපති,

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 49 දරන පනතින් සංශෝධිත 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2014 ජුලි 14 දින මණ්ඩලය වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 නොවැම්බර් 09 දිනැති අංක 1783/35 දරන ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා විසින් දී තිබූ නියෝගය ප්‍රකාරව, ආයෝජන මණ්ඩල පනතේ සඳහන් කාර්යයන් සඳහා යොදා ගැනීමට හම්බන්තොට පිහිටි හෙක්ටයාර 228. 8784 ක් වූ භූමි භාගයක අයිතිය ආයෝජන මණ්ඩලයට පවරා තිබුණි. කෙසේ වුවද ශ්‍රීලංගිප්‍ර 16 ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 වන විටත් මෙම ඉඩම අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රීලංගිප්‍ර 18 අනුව, අඛණ්ඩව සේවා සැපයීම සඳහා ගාස්තු එම සේවා සැපයූ වර්ෂයේ ආදායම ලෙස හඳුනාගත යුතුය. කෙසේ වුවද, අවලංගු කළ හා අත්හිටවූ ව්‍යාපෘතිවලට අදාළ රු.3,301,942 ක මුදලක් කිසිදු සේවාවක් සැපයීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් වාරික ආදායම ලෙස හඳුනාගෙන තිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. තවද එම ආදායම රු.179,547,196 ක් විලම්බිත බදු ශේෂය තුළද ඇතුළත් කර තිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට විලම්බිත බදු ශේෂයද එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.202,530,307 ක් වූ සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් අදාළ වත්කම් ගිණුමට මාරු කිරීම වෙනුවට කෙරී ගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණි.

(ආ) 2013 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු (VAT) වාර්තාව අනුව, ඉඩදිය නොහැකි එකතු කළ අගය මත යෙදවුම් බදු අඩුවෙන් දැක්වීම මඟින් රු. 9,108,682 ක්වූ එකතු කළ අගය මත බදු ආයෝජන මණ්ඩලය විසින් පැහැර හැර තිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු හා සමාලෝචිත වර්ෂය සඳහා ලාභය පිළිවෙලින් එම මුදලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කටුනායක අපනයන සැකසුම් කලාපයේ ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතන 10 ක් විසින් පදිංචිව සිටි අක්කර 1.62 ක ඉඩම් ප්‍රමාණයකට අදාළව රු. 899,569 ක්වූ බිම් කුලී 2013 වර්ෂය තුළදී ඉන්වොයිස් කර හෝ ගිණුම් ගත කර නොතිබුණි. එබැවින් ආදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කටුනායක අපනයන සැකසුම් කලාපයේ බෝර්හෝල් පොම්ප (Borehole Pumps) සැපයීම හා සවිකිරීම සඳහා ලබා දෙන ලද රු. 1,363,239 ක වැඩ පූර්ව අත්තිකාරමක් 2008 පෙබරවාරි මාසයේ ව්‍යාපෘතිය නිම කිරීමේදී නිරවුල් කර තිබුණි. එසේ වුවද, එය සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකළ වැඩපූර්ව අත්තිකාරමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) අරමුදල් 3 කින් ලැබුණු රු.10,118,713 ක් 2013 දෙසැම්බර් 31 දිනට සාවද්‍ය ලෙස විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ඊ) ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු කුලී ආදායමට අදාළව රු. 4,796,760 ක්වූ එකතු කළ අගය මත බදු ඇතුළත් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා එකතු කළඅගය මත බදු (Vat returns) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය එකතු කළ අගය මත බදු වාර්තා අනුව ශේෂය සමඟ එකඟ නොවුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතනවලින් ලැබිය යුතු ශේෂ

සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාරවලින් අය කර ගත යුතු මුදල් සහ හානිකරණය සඳහා ප්‍රතිපාදනය හා ඒ මත ලියාහරින ලද බොල් ණය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ 4 සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතනවලින් අය කර ගත යුතු මුදල් | 664,452,940 | 701,884,118 | 623,861,381 | 631,911,594 | 593,483,063 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 493,484,649 | 492,790,570 | 437,041,560 | 249,452,238 | 227,775,883 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය මුළු හිඟ මුදල්වල ප්‍රතිශතයක් ලෙස | 74 | 70 | 70 | 39 | 38 |
| වර්ෂය තුළ ලියා හරින ලද බොල් ණය | 13,483,407 | 5,517,032 | 73,113,266 | 8,306,417 | 9,279,955 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) හානිකරණය සඳහා ප්‍රතිපාදන 2009 වර්ෂයේ දී සියයට 38 සිට 2013 වර්ෂයේ දී සියයට 74 දක්වා පසුගිය වර්ෂ 05 තුළ සීඝ්‍රයෙන් වැඩිවී තිබුණු අතර ඒ අනුව එම ලැබිය යුතු මුදල් අයකර ගැනීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ඉතා දුර්වල මට්ටමක වූ බව දක්නට ලැබුණි.

(ii) හානිකරණය සඳහා මුළු ප්‍රතිපාදනය වූ රු.493,484,649 න් රු.486,153,378 ක් එනම් සියයට 99 ක් පමණ වූ හානිකරණ ප්‍රතිපාදනය 2013 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද හා වසා දමන ලද ව්‍යාපෘති සඳහා ලැබිය යුතු ශේෂ මත සියයට 100 ක් නියෝජනය විය.

(iii) වාර්ෂික ගාස්තු හානිකරණය සඳහා රු.201,012,748 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර මෙය 2013 දෙසැම්බර් 31 දිනට මුළු වාර්ෂික ගාස්තුවලින් සියයට 86% ක් හෝ රු.233,160,357 ක ප්‍රතිපාදනයක් කර තිබුණි.

(ආ) වෙනත් ණයගැතියන්

දිර්ඝ කාලයක් අය නොකර පැවතුණු වෙනත් ණයගැතියන් සහ ශේෂ පත්‍ර දිනයට ඒ මත හානිකරණය සඳහා ප්‍රතිපාදනය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ තුන සමග සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වෙනත් ණයගැතියන් | 131,274,290 | 66,891,763 | 61,204,152 | 103,810,214 |
| අඩමාණ ණය / හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 120,257,749 | 61,204,152 | 7,688,630 | 48,234,339 |
| අඩමාණ ණය / හානිකරණය සඳහා ප්‍රතිපාදනය වෙනත් මුළු ණයගැතියන්ගේ ප්‍රතිශතයක් ලෙස | 91.6 | 91.5 | 12 | 46 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ ද කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂයෙන් වෙනත් ණයගැතියන් මත හානිකරණය සියයට 91.6 කින් නියෝජනය වූ බැවින් එම ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග දුර්වල මට්ටමක පැවති බව පෙන්නුම් කෙරේ.

(ii) වතුපිටිවල නිවාස ඒකක වෙන්දෙසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවති අතර එම සමාගම හා ආයෝජන මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(iii) වෙනත් ණය ගැතියන් යටතේ දැක්වෙන රු.507,650 ක මුදල් වාංචාව හා රු.2,090 ක තොග ඌනතාවය වර්ෂ 10 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුනි.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුළු මුදලින් සියයට 98 ක් එනම් රු. 128,982,001 ක් රජයේ ආයතනවලින් ලැබිය යුතු ශේෂවලින් නියෝජනය විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- පුනරුත්ථාපන හා දම්ළ කටයුතු අමාත්‍යාංශය, ව්‍යාපාර සංවර්ධන කර්මාන්ත ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ ව්‍යාපාර සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වැනි එවකට තිබූ අමාත්‍යාංශවලින් ලැබිය යුතු රු. 5,257,979 ක මුදලක් වෙනත් ණයගැතියන් තුළ ඇතුළත්ව තිබුණි.

- රජයේ ආයතන තුනකින් ලැබිය යුතු ලෙස රු.16,070,868 ක මුදලක් දක්වා තිබුණද, එම ආයතනවලින් ලැබුණු සනාථ කිරීම් අනුව නිරවුල් කළ යුතු කිසිදු හිඟ ශේෂයක් නොවීය.

- ආයෝජන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගෙවිය යුතු ශේෂ හා අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතනය | මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | | වෙනස |
|---|---|---|---|
| | ආයෝජන මණ්ඩලය | අදාළ ආයතනය | |
| | රු: | රු: | රු: |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) | 52,412,573 | 50,000,000 | 2,412,573 |
| ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 55,115,000 | නැත | 55,115,000 |

- සමහර රජයේ ආයතනවලින් ලැබිය යුතු හිඟ ශේෂ අයකරගනු වෙනුවට ගිණුම්වල බොල් හා අඩමාන ණය සඳහා සියයට 100 ක ප්‍රතිපාදනයක් කර තිබුණි. රජයේ ආයතනවලින් ලැබිය යුතු රු. 128,982,001 ක් වූ මුළු හිඟ ශේෂයෙන් රු. 118,114,460 ක් එනම් සියයට 91.57 ක් සඳහා හානිකරණ ප්‍රතිපාදනය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

විවිධ ණය හිමි ශේෂය යටතේ ඇතුළත් කර තිබූ සමාලෝචිත වර්ෂය සඳහා විවිධ ආදායම් ලෙස රු.5,931,949 ක මුදලක් හඳුනාගෙන තිබූ අතර සනාථ කිරීම්, ප්‍රභව ලියකියවිලි හා උපලේඛන ආදී සාක්ෂි නොමැතිවීම හේතුවෙන් එය සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 2.2.5 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ සේවකයන්ගෙන් අයකර ගැනීම වෙනුවට 1997 සිට 2013 කාල පරිච්ඡේදය සඳහා එකතුව රු. 161,120,804 ක්වූ උපයන විට ගෙවීම් බදු ආයෝජන මණ්ඩල අරමුදල්වලින් ගෙවා තිබුණි. |
| (ආ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව මාසික ප්‍රවාහන දීමනා ලබාගන්නා ආයෝජන මණ්ඩලයේ සේවකයන් විසින් මාසිකව රු.15,000 ක රියදුරු දීමනාද ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු. 12,302,871 ක්වූ මුදලක් ඉහත දීමනා සඳහා ආයෝජන මණ්ඩලය විසින් ගෙවා තිබුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2007 ජනවාරි 02 දිනැති අංක ඩීඑම්එස්/ඒ2/බීඕඅයි දරන කළමනාකරණ සේවා ලිපිය | (i) ආයෝජන මණ්ඩලයේ සේවකයන් විසින් වෘත්තීය දීමනා හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා දීමනා (මසකට අවමය රු. 5000) අදාළ අධිකාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පහත පරිදි ලබාගෙන තිබුණි. |

| වැටුප් වර්ගය | ප්‍රතිශතය |
|---|---|
| ජේ එම් වර්ගය | 10 |
| එම් එම් වර්ගය | 15 |
| එච් එම් වර්ගය | 20 |

සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන මණ්ඩලය විසින් ගෙවන ලද එම දීමනාවල එකතුව රු. 2,392,917 ක් විය.

(ii) ආයෝජන මණ්ඩලයේ සේවකයන් විසින් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව පැමිණීමේ දිරි දීමනා මෙන්ම භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු මුදල් කර ගැනීමේ දීමනාද ලබාගෙන තිබුණි. මෙහිදී පහත සඳහන් ගෙවීම් සමාලෝචිත වර්ෂය තුළ දී සිදුකර තිබුණි.

- පැමිණීමේ දිරි දීමනා රු.125,845,273
- නිවාඩු මුදල් කර ගැනීමේ දීමනා රු. 59,098,318

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.290,920,997 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.239,124,766 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.51,796,232 ක එනම් සියයට 22 ක වැඩිවීමක් දැක්වුණි. කුලී ආදායම, ජලය සැපයීමෙන් ආදායම හා බලපත්‍ර ගාස්තු ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

තවද සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන මණ්ඩලය විසින් රු.228,429,052 ක මෙහෙයුම් ලාභයක් උපයාගෙන තිබූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.137,599,489 ක් වූ හෙයින් රු.90,829,563 කින් එනම් සියයට 66 කින් මෙහෙයුම් ලාභයේ වැඩිවීමක් දැක්වුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ආයෝජන මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් ඉකුත් වර්ෂ 2 සමඟ සසඳා පහත වගුවෙන් දැක්වේ.

| | | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|
| (i) | ලාභදායිත්ව අනුපාතය | % | % | % |
| | ශුද්ධ ලාභ අනුපාතය | 10.45 | 10.29 | 3.89 |
| | මුළු වත්කම් මත ප්‍රතිලාභය | 1.15 | 0.95 | 0.33 |

| | | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|
| (ii) | මෙහෙයුම් අනුපාතය | | | |
| | ණය ගැති පිරිවැටුම් අනුපාතය - වාර ගණන | 6.22 | 3.89 | 4.27 |
| | ණය ගැති එකතු කිරීමේ කාලය - දින | 58 | 115 | 105 |

### 3.2.2 වියදම් විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු වියදම්වලින් රු.1,983,947,246 ක් හෙවත් සියයට 79.6 කින් පරිපාලන වියදම්වලින් නියෝජනය වූ අතර එයින් සියයට 60 ක් කාර්යය මණ්ඩල වියදම්වලට අදාළ විය. මණ්ඩලයේ මුළු වියදම පිළිබඳ වර්ගීකරණයක් පහත සඳහන් වගුවෙන් හා රූපයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | මුදල රු: | ප්‍රතිශතය |
|---|---|---|
| මෙහෙයුම් වියදම් | 337,247,895 | 13.5 |
| පරිපාලන වියදම් | 1,984,841,156 | 79.6 |
| රජයේ බදු | 148,175,366 | 5.9 |
| වෙනත් වියදම් | 24,300,318 | 1 |
| එකතුව | 2,494,564,735 | |




3.2.3 අංශවල මෙහෙයුම් හා ලාභදායිත්වය

මණ්ඩලය යටතේ අපනයන සැකසුම් කලාප 10 ක් , කාර්මික උද්‍යාන 2 ක් හා ප්‍රාදේශීය කාර්යාලයක් ක්‍රියාත්මක වන අතර එම කලාප හා උද්‍යාන කිහිපයක මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

(i) පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපයේ බදුවලට පෙර ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 6.4 කින් එනම් සියයට 34 කින් අඩු වී තිබුණි.

(ii) විශාල පරිපාලන පිරිවැය හේතුවෙන් අපනයන සැකසුම් කලාප දෙකක් හා අපනයන සැකසුම් උද්‍යානයක් 2008 වර්ෂයේ සිට අඛණ්ඩව පාඩු දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| | වර්ෂය තුළ දරන ලද පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| <u>අපනයන සැකසුම් කලාප</u> | | | | | | |
| වතුපිටිවල | 2,969 | 7,766 | 15,743 | 13,703 | 12,787 | 11,872 |
| කොග්ගල | 14,050 | 11,775 | 26,980 | 17,503 | 23,149 | 23,412 |
| <u>අපනයන සැකසුම් උද්‍යාන</u> | | | | | | |
| මල්වත්ත | 2,748 | 5,531 | 3,226 | 3,458 | 3,639 | 2,576 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) 2013 වර්ෂය තුළ හා ඉකුත් වර්ෂ 4 තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති සහ ගිවිසුම්වලට එළඹි ව්‍යාපෘති සහ අවලංගු කරන ලද සහ වසා දමන ලද හා අත් හිටුවන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √* | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √* | සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √* | අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √** | වසා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √** | අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √** |
|---|---|---|---|---|---|---|
| 2013 | 172 | 140 | 75 | 120 | 38 | 7 |
| 2012 | 238 | 163 | 98 | 79 | 26 | 9 |
| 2011 | 160 | 165 | 99 | 47 | 7 | 4 |
| 2010 | 364 | 270 | 144 | 124 | 28 | 10 |
| 2009 | 384 | 182 | 134 | 93 | 12 | 4 |
| එකතුව | 1,318 | 920 | 550 | 463 | 111 | 34 |

√* පවත්නා ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම ඇතුළත්ව

√** ව්‍යාපෘති පිළිබඳ වර්තමාන තත්ත්වය අනුව

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව හා ගිවිසුම්වලට එළඹි ව්‍යාපෘති සංඛ්‍යාව පිළිවෙලින් සියයට 28 කින් හා සියයට 14 කින් අඩුවී තිබුණි.

(ii) වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 2009 වර්ෂයේ 134 සිට 2013 වර්ෂයේ 75 දක්වා අඩුවී තිබුණි.

(iii) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා වසාදමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව පිළිවෙලින් සියයට 50 කින් හා සියයට 46 කින් අඩුවී තිබුණි.

(ආ) විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම

(i) 2009 සිට 2013 කාල පරිච්ඡේදය සඳහා ආයෝජන මණ්ඩලය විසින් ආකාර්ෂණය කර ගන්නා ලද විදේශීය සෘජු ආයෝජන (FDI) පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අංශය | සෘජු ආයෝජනවල වටිනාකම | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
| | එජඩො මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන |
| නිෂ්පාදන | 359.76 | 307.65 | 322.42 | 159.65 | 164.47 |
| කෘෂිකාර්මික | 8.47 | 7.17 | 17.97 | 6.45 | 3.69 |
| සේවා | 1,023.17 | 1,023.33 | 725.67 | 350.20 | 434.09 |
| එකතුව | 1,391.40 | 1,338.15 | 1,066.06 | 516.30 | 602.25 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- 2011 වර්ෂයට සාපේක්ෂව 2012 හා 2013 වර්ෂවලදී කෘෂිකාර්මික අංශය යටතේ ආකර්ෂණය කර ගන්නා ලද ආයෝජනයන් පිළිවෙලින් සියයට 60 කින් හා සියයට 53 කින් අඩු වී තිබුණි.
- ආකර්ෂණය කර ගන්නා ලද මුළු විදේශීය සෘජු ආයෝජනයන් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 3 කින් වැඩි වී තිබුණි.
- නිෂ්පාදන අංශයේ විදේශිය සෘජු ආයෝජනයන් 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 17 කින් වැඩි වී තිබුණි.

(iii) 2009 සිට 2013 කාල පරිච්ඡේදය තුළ ආයෝජන මණ්ඩලය මඟින් ඉටුකර ගත් විදේශීය සෘජු ආයෝජන (FDIG) සහ දේශීය ආයෝජනයන් (LI) පහත දැක්වේ.

| වර්ෂය | ඉටුකර ගත් විදේශීය සෘජු ආයෝජන (FDI) | ඉටුකර ගත් දේශීය සෘජු ආයෝජන |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2013 | 958,958 | 553,063 |
| 2012 | 828,005 | 452,154 |
| 2011 | 655,513 | 368,587 |
| 2010 | 536,140 | 331,849 |
| 2009 | 495,506 | 278,762 |

සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර ගත් විදේශීය සෘජු ආයෝජන (FDI) සහ දේශීය ආයෝජන ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 16 කින් හා සියයට 22 කින් වැඩි වී තිබුණි.

(ඇ) ආනයන පිරිවැය සහ අපනයන ඉපැයීම

පසුගිය වර්ෂ 5 තුළ ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි මුළු ආනයන පිරිවැය සහ අපනයන ඉපැයීම් පහත වගුවෙන් හා රූප සටහනින් දැක්වේ.

| වර්ෂය | අපනයන ඉපැයීම් | අපනයන පිරිවැය |
|---|---|---|
| | එජඩො මිලියන | එජඩො මිලියන |
| 2013 | 6,606 | 4,525 |
| 2012 | 6,042 | 4,345 |
| 2011 | 6,572 | 4,400 |
| 2010 | 5,171 | 3,360 |
| 2009 | 4,563 | 2,739 |




ආනයන පිරිවැය හා අපනයන ඉපැයීම් පිළිබඳ උපනතිය

2012 වර්ෂයෙදී ආයෝජන මණ්ඩල ව්‍යවසායන් මඟින් අපනයන ඉපැයීම් සියයට 8 කින් අඩුවී තිබුණද, 2013 වර්ෂයෙදී එය සියයට 9 කින් වැඩි වී තිබුණි. තවද ආයෝජන මණ්ඩල ව්‍යවසායන් මඟින් දරන ලද

ආනයන පිරිවැය 2012 වර්ෂයෙදී සියයට 1 කින් අඩුවී තිබුණ අතර එය 2013 වර්ෂයේදි සියයට 4 කින් වැඩි වී තිබුණි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයෝජන මණ්ඩලයට කාර්යාල ඉඩ පහසුකම් ලබාගැනීම සඳහා 1996 නොවැම්බර් මාසයේදී පුද්ගලික සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබුණු අතර ආරම්භක තැන්පතුවක් වශයෙන් රු.2,637,240 ක මුදලක් එම සමාගමට ගෙවා තිබුණි. පසුව මෙම කාර්යාල ඉඩ පහසුකම එම සමාගමට 2010 ජුනි මාසයේදී ආපසු භාර දී තිබුණි. කෙසේවුවද තැන්පතු මුදල ආපසු අයකර ගැනීමට 2014 දෙසැම්බර් 31 දක්වා ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ආ) 2013 වර්ෂය අවසානයට රු.2,025,485 ක් වූ මුළු ටෙන්ඩර් තැන්පතු ශේෂයෙන් රු.940,335 ක් හෙවත් සියයට 46 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් පැවති තැන්පතුවලින් නියෝජනය විය. කෙසේවුවද මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා 2013 වර්ෂය අවසානය දක්වාත් ආයෝජන මණ්ඩලය විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) මුළු රඳවා ගැනීම් රු.33,018,480 කින් රු.13,790,054 ක් හෙවත් සියයට 43 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවති මුදලක් නියෝජනය විය.

(ඈ) 2000 දෙසැම්බර් 29 දිනට පවතින විදුලි ගාස්තු රේටය වාර්ෂිකව සියයට 6.9 කට වඩා වැඩිවුවහොත් එකී විදුලිගාස්තු ප්‍රතිපූර්ණය කිරීමට හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දීමට පෙර අදාළ රාජ්‍ය ආයතනවලින් තක්සේරු වාර්තාවක් ආයෝජන මණ්ඩලය විසින් ලබා ගෙන නොතිබුණි.

(ii) 2002 ජුනි සිට 2007 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ විදුලි ගාස්තු රේටය වැඩිවීම සම්බන්ධයෙන් රු. 356,793,568 ක මුදලක් සහ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණය මඟින් දෙන ලද අවසාන තීරණය ප්‍රකාරව හානිය සඳහා ගෙවීම ප්‍රමාද වීම මත පොලිය හා සමාගම විසින් දරන ලද බේරුම්කරණ පිරිවැය සම්බන්ධයෙන් රු.388,161,877 ක මුදලක්ද සමාගම විසින් ඉල්ලා තිබුණි. ඉහළ වාණිජ අධිකරණයේදී, ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් ලබා දී තිබූ තීන්දුවට එරෙහිව ආයෝජන මණ්ඩලය විසින් අභියාචනයක් කර තිබුණි. පසුව ආයෝජන මණ්ඩලයට වාසිවන අයුරින් තීන්දුවක් ලබා දී තිබුණි. ආයෝජන මණ්ඩලයට වාසිවන අයුරින් ලබාදී

තිබූ තීන්දුවට එරෙහිව සමාගම විසින් අභියාචනයක් කර තිබුණි. මෙම නඩු දෙකම නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබේ.

(iii) ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදීමට පෙර පරිභෝජනය සඳහා මෙම ප්‍රදේශයේ රබර් දැව ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අදාළ රජයේ ආයතනවලින් තක්සේරු වාර්තාවක් ආයෝජන මණ්ඩලය විසින් ලබා ගෙන නොතිබුණි.

(iv) අධිකරණ නඩු පවතින බැවින් මෙම සමාගමෙන් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු බිම් කුලිය, ජල බිල්පත් හා බංගලා කුලිය ආදිය අයකර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඉ) ආයෝජන මණ්ඩලය විසින් පර්ත් වතුයාය මිලදී ගෙන තිබුණු අතර, වතුයායෙන් කොටසක් වර්ෂ 5 ක කාලයක් සඳහා කළමනාකරණය කිරීමට ශ්‍රීලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට (SLSPC) භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් (SLSPC) අදාළ මූල්‍ය ප්‍රකාශන 2006 වර්ෂයේ සිට ආයෝජන මණ්ඩලය වෙත ලැබී නොතිබුණි.

(ii) 2005 වර්ෂය තුළදී ප්‍රේෂණය කරන ලද රු.මිලියන 10 ක මුදල හැරුණු විට, එකඟ වූ පරිදි සංස්ථාව විසින් එහි ලාභය ක්‍රමවත්ව ආයෝජන මණ්ඩලයට ප්‍රේෂණය කර නොතිබුණි. 2006 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පර්ත් වතුයායට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47 ක් විය. කෙසේවුවද ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල 2013 දෙසැම්බර් 31 දක්වාත් හඳුනාගෙන වාර්තා කර නොතිබුණි.

(iii) පර්ත් වතුයායේ කරුණු සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව, කළමණාකරණ ගාස්තු සියයට 15 කින් වැඩි කිරීම, පර්ත් වතුයාය විසින් ආදායම ඒක පාර්ශවිකව උපයෝජනය කිරීම, පර්ත් වතුයායෙන් උපයා ගන්නා ලද රු.මිලියන 20 ක් වූ ආදායම කොන්ත්‍රාත්කරුගේ නමින් ආයෝජනය කිරීම, රු.මිලියන 12.42 ක් වූ මෝටර් වාහන හා බංගලා කුලි අවිධිමත්ව ජංගම ගිණුම් මාර්ගයෙන් කොන්ත්‍රාත්කරුට මාරු කර ගැනීම වැනි කරුණු තවමත් විසඳා ගත යුතුව ඇත.

## 4.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

2003 ජනවාරි 08 දින රු.97,937,000 ක පිරිවැයකට මිලදී ගන්නා ලද මලිදූව කන්ද වතුයාය නම් වූ අක්කර 122 රූඩ් 01 පර්චස් 27.4 ක ඉඩම 2014 මැයි අවසානය දක්වා කිසිදු කාර්යයකට උපයෝජනය කර

නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව, 2013 දෙසැම්බර් 31 දිනට මෙම ඉඩමේ පොත් අගය රු.100,800,000 ක් විය.

4.4 වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබාදී තිබු සම්පත්

---

මණ්ඩලය විසින් රජයේ වෙනත් ආයතන සඳහා සමහර වත්කම් අවිධිමත්ව මුදාහැර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන ලිපියේ විධිවිධානවලට සහ 1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව 2009 වර්ෂය තුළදී මෝටර් වාහන දෙකක් එවකට රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබුණි. මෙම මෝටර් වාහනවල අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා ආයෝජන මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.2,751,809 ක මුදලක් වැය කර තිබුණි. අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු මුදල අයකර ගෙන හෝ ආයෝජන මණ්ඩලයේ ගිණුම්වල ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) එවකට රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ මෝටර් වාහනයක් 2013 ජුලි මාසයේදී අනතුරකට භාජනය වී තිබූ අතර හානිය හේතුවෙන් ඇස්තමේන්තු ගත අළුත්වැඩියා පිරිවැය රු. 1,412,687 ක් විය. එය රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම මුදලින් රු.129,309 ක් ආයෝජන මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණි. අදාළ නිලධාරියාගෙන් හෝ එවකට රේඛීය අමාත්‍යාංශයෙන් පාඩුව අයකර ගැනීමට ආයෝජන මණ්ඩලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ (WTC) රථගාල් කිරීමේ පහසුකම භාවිතා කිරීම සඳහා එවකට රේඛීය අමාත්‍යාංශයට ආයෝජන මණ්ඩලය විසින් මෝටර් වාහන ගාල් කිරීමේ අවසරපත්‍ර 9 ක් ගාස්තු අයකිරීමකින් තොරව ලබාදී තිබුණි. තවද, 2007 සිට 2013 කාල පරිච්ඡේදය සඳහා වාහන ගාල් කිරීමේ පහසුකම ලබා දීම වෙනුවෙන් රු. 1,489,500 ක මුදලක් ආයෝජන මණ්ඩලය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයට ගෙවා තිබුණි.

4.5 මානව සම්පත් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට විධායක ශ්‍රේණියේ තනතුරු 96 කින් සමන්විතව (අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ තනතුර ඇතුළත්ව) කාර්ය මණ්ඩලයේ විවිධ වර්ගයන්හි පුරප්පාඩු 149 ක් පැවති අතර මෙම පුරප්පාඩු පිරවීම සඳහා 2013 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු විධිමත් පියවරක් ගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| විස්තරය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | එකතුව | |
| විධායක කාර්ය මණ්ඩලය | 589 | 489 | 04 | 493 | 96 |
| ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලය | 378 | 336 | 13 | 349 | 29 |
| සාමාන්‍ය සේවා කාර්ය මණ්ඩලය | 332 | 288 | 20 | 308 | 24 |
| එකතුව | 1299 | 1113 | 37 | 1150 | 149 |

(ආ) ආයෝජන මණ්ඩලය විසින් පුද්ගලික ආයතනයකින් සේවකයන් 18 දෙනෙකු බාහිරව බඳවා ගෙන තිබුණි. ඉන් සේවකයන් 14 දෙනෙකු 2010 වර්ෂයට පෙර බාහිරව ලබාගන්නා ලදී.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්තිවලට පටහැනිව, සේවකයන් 9 දෙනෙකු ආයෝජන මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා වේතන ලෙස රු.6,390,185 ක මුදලක් දරා තිබුණි.

4.6 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහජන විරෝධතා, දුර්වල කාර්ය සාධනය හා කළමනාකරණ තීරණ ආදීය හේතුවෙන් කෙටි කාල පරිච්ඡේදයක් ඇතුළතදී ඉදිකිරීම් වැඩ තුනක් නවතා දැමීම මගින් ආයෝජන මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.20,292,250 ක පාඩුවක් දරා තිබුණි.

(ආ) කටුනායක අපනයන සැලසුම් කලාපයේ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාරයක් විසින් පෙර භාවිතා කරන ලද ධාරණ අගය රු. 95,822,000 ක් වූ ආයෝජන මණ්ඩලයට අයත්ව තිබූ ඉඩමක්, 2013 වර්ෂයේදී අවසන් කර සම්පූර්ණකිරීමේ පදනම මත රු. 225,000,000 කට රාජ්‍ය සමාගමකට භාරදී තිබුණි. ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද මෙම ඉඩමේ වෙළඳපොළ වටිනාකම රු.135,000,000 ක් විය. මෙම ගනුදෙනුවේදී ආයෝජන මණ්ඩලයට රු. 39,178,000 ක ලාභයක් උපයා ගැනීමට හැකිව තිබුණද, ආයෝජන මණ්ඩලය හා පෙර පදිංචිකරු අතර එළඹ තිබූ ප්‍රධාන ගිවිසුමේ විධිවිධානයන්හි ප්‍රතිඵලයක් ලෙස එය ලාභයක් ලෙස හඳුනා ගැනීමට ආයෝජන

මණ්ඩලයට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයට සිදුවී තිබූ පාඩුව රු.77,016,960 ක් විය.

4.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2009/2010 වර්ෂය තුළදී පුත්තලම, සෙල්ලකන්දහි ආයෝජන ප්‍රවර්ධන කලාපයක් ස්ථාපිත කිරීමට ආයෝජන මණ්ඩය විසින් සැලසුම් කර තිබුණු අතර මූලික වියදම් ලෙස රු. 11,270,120 ක මුදලක් දරා තිබුණි. පසුව එය අත්හිටුවා තිබූ අතර 2012 වර්ෂයේදී ඒ සඳහා දරන ලද සමස්ත පිරිවැය ලියා හැර තිබුණි. කෙසේවුවද, ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2013 වර්ෂයේදී සංවර්ධන කාර්යයන් ආයෝජන මණ්ඩලය විසින් නැවත ආරම්භ කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2009 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ ඉලක්කයන්ගෙන් පහත දැක්වෙන ඉලක්කයන් ඉටුකර ගැනීමට 2013 වර්ෂය අවසානය වන විටත් ආයෝජන මණ්ඩලයට නොහැකිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) 2009/2010 වර්ෂයේදී මඩකලපුව හා අම්පාරහි නව ආයෝජන ප්‍රවර්ධන කලාප හඳුනා ගැනීමට හා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණද , 2013 දෙසැම්බර් 31 වන විටත් එම ආයෝජන ප්‍රවර්ධන කලාප ස්ථාපිත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2009/ 2010 වන විට කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් බැහැරව ස්ථාපිත කිරීමට ඉලක්ක කර තිබුණු නව ව්‍යවසායන් 300 න් 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 89 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 විගණන හා කළමනාකරණ කමිටුව

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තියට අනුව, අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටුව ක්‍රමානුකූලව රැස්විය යුතු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා නිර්දේශයන් සහිතව එහි නිරීක්ෂණයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. 2013 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 4 ක් ආයෝජන මණ්ඩලය විසින් පවත්වා තිබුණද, සියළුම රැස්වීම් වර්ෂයේ අවසාන මාස 6 තුළ පවත්වා තිබුණු බැවින් නිරීක්ෂණයන් අඛණ්ඩව සමාලෝචනය කිරීමට මෙය ඵලදායී ක්‍රමයක් ලෙස භාවිතා කර නොතිබුණි.

## 5.4 අයවැය පාලනය

අයවැයගත හා සත්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඇ) ඉදිකිරීම්
(ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණය
(ඉ) වාහන උපයෝජනය
(ඊ) ආදායම එකතු කිරීම

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

## ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය

**ප්‍රධාන කාර්යාලය (ලෝක වෙළඳ සංකීර්ණ කාර්යාලය)**
05, 08, 09, 19, 24, 25 සහ 26 මහල්/ බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 01.
දුරකථන : 011-2 434403-5, 2 435027, 2 447531, 2 385972-6,
2 346131-3
ෆැක්ස් : 011-2447995, 2 329795, 2 430512, 2 422407
විද්‍යුත් තැපෑල : infoboi@boi.lk

ප්‍රධාන කාර්යාලය (SBJM කාර්යාලය)
අංක : 14, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
දුරකථන : 011-2 435407-9, 2 445779, 2 331909, 2 331910-3,
2 342404
ෆැක්ස් : 011-2430625, 2399891
විද්‍යුත් තැපෑල : infoboi@boi.lk

කටුනායක අපනයන සැකසුම් කලාපය
කටුනායක, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9411)2252364-5, 2252140, 2252038, 4833737,
4833741, 4833774, 4833779, 4833817, 4833819
ෆැක්ස් : (+9411)2253207
විද්‍යුත් තැපෑල : kepz@boi.lk

බියගම අපනයන සැකසුම් කලාපය
වල්ගම, මල්වාන, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9411)2465206-09
ෆැක්ස් : (+9411)2465227
විද්‍යුත් තැපෑල : bpz@boi.lk

හොරණ අපනයන සැකසුම් කලාපය
බොරළුගොඩ, පෝරුවදණ්ඩ, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9434)2269296, 2269752, 2258077
ෆැක්ස් : (+9434)2255687, 2258029
විද්‍යුත් තැපෑල : hepz@boi.lk

මීරිගම අපනයන සැකසුම් කලාපය
මහයායවත්ත, ලෝලුවගොඩ, මීරිගම, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9433)2274657, 2276626, 2276393
ෆැක්ස් : (+9433)2274657, 2276393
විද්‍යුත් තැපෑල : mepz@boi.lk

වතුපිටිවල අපනයන සැකසුම් කලාපය
වතුපිටිවල, ශ්‍රී ලංකාව.
දුරකථන : 033-2281604, 033-22813811
ෆැක්ස් :033-2282364
විද්‍යුත් තැපෑල : wepz@boi.lk

මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය
තිහාරිය, නිට්ටඹුව, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9433)2288826, 2296166, 2296620
ෆැක්ස් :(+9433)228826
විද්‍යුත් තැපෑල : mepp@boi.lk

සීතාවක අපනයන සැකසුම් කලාපය
අවිස්සාවේල්ල, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9436)2231082
ෆැක්ස් :(+9436)2231083
විද්‍යුත් තැපෑල : sip@boi.lk

**දකුණු කලාප කාර්යාලය**
කොග්ගල අපනයන සැකසුම් කලාපය,කොග්ගල, හබරාදුව.
දුරකථන : 091-2283425
ෆැක්ස් : 091-2283370
විද්‍යුත් තැපෑල : kgepz@boi.lk

**මධ්‍යම කලාප කාර්යාලය**
මහනුවර කර්මාන්ත උද්‍යානය, කෙන්ගල්ල, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9481)2420019, 2420025, 2423992,
2423994
ෆැක්ස් :(+9481)2420091, 2423995
විද්‍යුත් තැපෑල : kip@boi.lk

**වයඹ කලාප කාර්යාලය**
මාස් රෙදිපිළි උද්‍යානය, කුරුණෑගල පාර, තුල්හිරිය.
දුරකථන : 037-2277037, 037-2277038
ෆැක්ස් : 037-2277036
විද්‍යුත් තැපෑල : nwro@boi.lk

පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය
කෑගල්ල පාර, පොල්ගහවෙල, ශ්‍රී ලංකාව.
දුරකථන : (+9437)2244657 / 41526
ෆැක්ස් : (+9437)2244657
විද්‍යුත් තැපෑල : pwepz@boi.lk

මාවතගම අපනයන සැකසුම් කලාපය
ඩයිනොවෝ වතුයාය, මහනුවර පාර, මාවතගම,
ශ්‍රී ලංකාව.
දුරකථන : (+9437)2298147
ෆැක්ස් : (+9437)2296041
විද්‍යුත් තැපෑල : mwepz@boi.lk

**මධ්‍යම සත්‍යාපන පර්යන්තය**
ලංකා නැව් සමාගම් නැව්පොළ,
අංක 70, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත.
දුරකථන : 011-2547485, 4411591, 4978969
ෆැක්ස් : 011-2547485, 4411592, 026-2233002

**ගුවන් බඩු නිෂ්කාශන ඒකකය**
බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපොල,
කටුනායක.
දුරකථන : 011-2252155, 4833834, 2265183
ෆැක්ස් :011-2252155

**ආයෝජන මණ්ඩල විශේෂ ආර්ථික කලාපය**
ප්‍රීමා කර්මාන්තශාලා පාර, චීන බොක්ක, ත්‍රිකුණාමලය
දුරකථන : 026-2233003
ෆැක්ස් : 026-2233002

**ආයෝජන මණ්ඩල මිරිජ්ජවිල කාර්මික උද්‍යානය**
මිරිජ්ජවිල, හම්බන්තොට.
දුරකථන : 047-2221596

හම්බන්තොට කලාප කාර්යාලය
කාමර අංක : 302, පරිපාලන සංකීර්ණය,
රුහුණු - මාගම්පුර, සිරිබෝපුර, හම්බන්තොට,
ශ්‍රී ලංකාව.
දුරකථන : (+9447)2256800
ෆැක්ස් : (+9447)2256800

**යාපනය කලාප කාර්යාලය**
NHDA ගොඩනැගිල්ල, චන්ද්‍රකුලි, යාපනය.
දුරකථන : 021-2221336, 021-2222130
ෆැක්ස් : 021-2221336